වාර්ෂික වාර්තාව 2015

# කා.සං.ම.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## අපගේ දැක්ම

***" සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම"***

## අපගේ මෙහෙවර

***"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයාදීම"***

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ  අධ්‍යක්ෂ මණ්ඩලය

2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා


මහින්ද ජිනසේන මහතා - සභාපති

ටී.ඩී.එස්. පෙරේරා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

දර්ශන් විජේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - භාණ්ඩාගාර නියෝජිත

කලීල් රහුමතුල්ලා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මාලිකා සමරවීර මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

නිෂාධ ගමගේ මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශාමීන් පෙරේරා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

රෝයි ජයසිංහ මහතා - මණ්ඩලයේ නිරීක්ෂක

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

# 2015 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව

---

**ආයතනය**

**පසුබිම**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම 1966 වර්ෂයේ දී 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලදී. පසුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

**මණ්ඩලයේ අරමුණු**

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත මගින් නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

**මණ්ඩලයේ විවිධ අංශ සහ සේවා**

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශ සඳහා සේවා පැකේජයක් සපයා දීම පිණිස මෙම මණ්ඩලය විවිධ අංශ සහ ආයතන දහයකින් සමන්විත වී තිබේ:

1. පාලන අංශය (AD)
2. ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
3. ඉංජිනේරු අංශය (ED)
4. කාර්මික ජනපද අංශය (IED)
5. අලෙවි අංශය (MD)
6. සැලසුම් අංශය (PD)
7. ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)
8. තාක්ෂණ සේවා අංශය (TSD)
9. සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)
10. රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPDSC).

කාර්යාල 25 කින් සමන්විත දිස්ත්‍රික් කාර්යාල ජාලය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ද, කාර්මික ජනපද 19 ක් කාර්මික ජනපද අංශය යටතේ ද ක්‍රියාත්මක වේ. ඉංජිනේරු අංශය යටතේ ක්‍රියාත්මක වන සේවා මධ්‍යස්ථාන 2 ක් තිබේ. තාක්ෂණික සේවා අංශය, සම්භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන අංශය, රබර් නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය, සහ ඉංජිනේරු අංශය විසින් දේශීය ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීම පිණිස තාක්ෂණය සහ අදාළ අනෙකුත් සේවා සපයා දීම සිදු කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 714 ක් වන අතර එම කාර්ය මණ්ඩලය මට්ටම් 11 ක් යටතේ කාණ්ඩ කර ඇත.

# සභාපතිතුමාගේ පණිවුඩය



ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට 2015 වර්ෂයේ සිට පත්වී සිටින සභාපතිවරයා වශයෙන් මම මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාවට මෙම පණිවුඩය ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටින් යුතුවයි. කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ සියලු කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, දිරිමත් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රමුඛතම ආයතනය වේ. එය දශක හතරකට අධික කාලයක් පුරා කර්මාන්තකරුවන්ට උපකාරක සේවා සහ සහාය සපයා දී ඇත. 2015 මූල්‍ය වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගාසිටුවීමට සහාය ලබා දුන් අතර, ක්ෂුද්‍ර කර්මාන්ත ආරම්භ කිරීමට අපේක්ෂා කරන තරුණ ව්‍යවසායකයින්ට සහාය සපයා දීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට පහසුකම් සලසා දීම මණ්ඩලයේ ප්‍රමුඛතම අවධානය විය.

මෙරට ව්‍යාපාරික ප්‍රජාවට ඉතාම වැදගත් සහයක් සපයා දීමෙහි සහ ප්‍රාදේශීය මට්ටමෙන් තාක්ෂණික සහ හැකියා සංවර්ධන වැඩසටහන් ගණනාවක් පැවැත්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම කාල පරිච්ඡේදය තුළ රැකියා අවස්ථා 7,862 දෙකක් ද ඇතුළුව ස්වයං රැකියා පහසුකම් 961 ක් නිර්මාණය කරමින් අලුතින් ව්‍යාපාර 349ක් ආරම්භ කිරීම පිණිසත්, ව්‍යාපාර 642 ක් වැඩි දියුණු කිරීම පිණිසත් කර්මාන්තකරුවන්ට සහාය ලබාදීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට හැකි විය.

2014 වරෂයේ අත් කර ගත් රු. 419,312 ක අතිරික්තයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී අත්කර ගත් මූල්‍ය ප්‍රතිඵලය මගින් රු. 27,259,111 ක අතිරික්තයක් (බදු පෙර ශුද්ධ ආදායම) පෙන්නුම් කරන බව සඳහන් කිරීම මෙහිදී වැදගත් වේ. පොදුවේ සලකා බලන විට, අලුතින් කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඒකක ආරම්භ කිරීමට තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබාදීම ද ඇතුළුව ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට, පුළුල් කිරීමට සහ නවීකරණය කිරීමට උපකාරී වී ඇත. 2015 වර්ෂය තුළදී සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද සමස්ත ආයෝජනය 45% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ප්‍රයත්නයන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දෙන ලද සහයෝගය සහ වටිනා මගපෙන්වීම වෙනුවෙන් අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතාටත්, රාජ්‍ය අමාත්‍ය ගරු චම්පිකා ප්‍රේමදාස මහතාටත්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි.

එමෙන්ම අපගේ අරමුණ සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින්ටත්, අංශ ප්‍රධානීන්ටත්, කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

**මහින්ද ජිනසේන**
**සභාපති**

# අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ සමාලෝචනය



මහා පරිමාණ කර්මාන්ත ඌනපූරණය කරන ක්‍ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ඉතාමත් ක්‍රියාශීලී සහ ප්‍රබල කර්මාන්ත අංශයක් බවට පත්වී තිබේ. කෙසේ වෙතත්, එම අංශයට තිබෙන පුළුල් වර්ධන හැකියාව මෙතෙක් පූර්ණ වශයෙන් හඳුනාගෙන නැත. ක්‍ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මහා පරිමාණ කර්මාන්තවලට සාපේක්ෂව අඩු ප්‍රාග්ධන පිරිවැයක් සහිතව සැලකිය යුතු රැකියා අවස්ථා සංඛ්‍යාවක් සපයා දෙමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා පමණක් නොව, එම අංශය ග්‍රාමීය ප්‍රදේශ කාර්මීකරණය කිරීම සඳහා ද දායක වෙමින්, ඒ හරහා ජාතික ආදායම සහ ධනය වඩාත් සාධාරණ ආකාරයෙන් බෙදී යාම සහතික කරමින් ප්‍රාදේශීයව පවතින අසමබරතාවයන් අවම කිරීමට ද උපකාරී වේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය සාධනය ඇගයීම පිණිස සහ ඉදිරි වර්ෂවලදී වඩාත් ඉහළ කාර්යසාධනයක් අත් කර ගැනීම සහතික කිරීම සඳහා වැඩිදියුණු කිරීම් අවශ්‍ය කරන ක්ෂේත්‍ර හඳුනා ගැනීම පිණිස 2015 වර්ෂය තුළ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය ද සමග එහි ප්‍රගතිය සහ මෙහෙයුම් ජයග්‍රහණ පිළිබඳ සමාලෝචනය කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් මම ඉතාමත් සතුටු වෙමි.

අලෙවිකරණ සහ විකුණුම් සහාය සපයා දීම හරහා ක්‍ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යවසායකයින්ට සහාය සපයා දෙන ආකාරය පිළිබඳ දැනුම් පදනම නිර්මාණය කර ගැනීමේ අරමුණ ඇතිව කර්මාන්ත සහ ක්‍ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධ නිපුණත්වය සපයා දීම අපගේ ප්‍රධාන අවධානයක් විය. කාර්මික ව්‍යවසාය සඳහා උපදේශකත්ව සේවා සපයාදීම ව්‍යාප්ත කිරීමක් වශයෙන් මණ්ඩලය විසින් තාක්ෂණික, ඉංජිනේරු සහ කළමනාකරණ දැනුම සහ අත්දැකීම් සපයා දෙමින් ව්‍යාපාර වලට පහසුකම් සැලසීම සඳහා දිවයින පුරා වැඩමුළු ගණනාවක් පවත්වා ඇත.

එපමණක් නොව, කාර්මික ජනපද ඊළඟ මට්ටමට ඔසවා තබමින් ඉන් පසුව අන්තර්ජාතික මට්ටම දක්වා ඉහළ නැංවීම පිණිස එම කර්මාන්ත සතු ධාරිතාවයන් වැඩි දියුණු කිරීම සඳහා වඩාත් හිතකර වන පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස අපි ඒවායෙහි ක්‍රියාකාරකම් නියමානුකූල බවට පත් කර වැඩි දියුණු කරමින් කාර්මික ජනපද පිහිටුවීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමට අඛණ්ඩව කටයුතු කළෙමු.

මෙම වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය එහි සේවා ජාලය හරහා අඛණ්ඩව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සිය සහාය සපයා දුන් අතර, ඒ අනුව කර්මාන්තකරුවන් සඳහා හැකියා සංවර්ධන සහ ඵලදායිතා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන් 1600 ක් පමණ පවත්වන ලදී. එමෙන්ම තාක්ෂණය ලබා දීමේ, නිෂ්පාදන සංවර්ධන සහ නිරූපණ වැඩසටහන් මාලාවක් ද පවත්වන ලද අතර එමගින් තරුණ ව්‍යවසායකයින් 7,300 ක් පමණ දෙනාට ප්‍රතිලාභ ලැබී ඇත.

කිතුල් සංවර්ධන ජාතික වැඩසටහන යටතේ, “කිතුලක වරුණ" ප්‍රදර්ශනය සහ වෙළඳ සල්පිල 6 වැනි වරටත් පවත්වන ලදී. එමෙන්ම, අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්ව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, සහ ශ්‍රී ලංකා පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය විසින් 2015 පෙබරවාරි මාසයේදී 7 වැනි ‘පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය 2015’ පවත්වන ලදී.

මැටි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය සහ සම්ප්‍රදායික අත්කම් භාණ්ඩ නිෂ්පාදනය වැනි දේශීය සහ විවිධ බලපෑම්වලට ලක්වී ඇති කර්මාන්තවලට නව ජීවයක් ලබා දෙමින් ඒවා පුබුදුවාලීම සඳහා "ගම්මාන සංවර්ධනය කිරීම" නැමති සංකල්පය මත එම කර්මාන්ත වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් ද කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර ඇත. එමෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලය ව්‍යවසායකත්ව ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්වය අරමුණු කර ගත් වැඩසටහන් ද පවත්වමින් කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලද අතර එමගින් අලුතින් අනාගත කාන්තා ව්‍යවසායකයින් 2,000 ක් පමණ දෙනා ප්‍රතිලාභ ලැබූහ.

ත්‍රිත්ව පදනම් රේඛාව ක්‍රමය ප්‍රකාර මෙම මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය අනුව, 2014/15 මූල්‍ය වර්ෂයෙහි දළ ලාභය වූ රු. 85,036,769/- ට සාපේක්ෂව මෙම වර්ෂයේ දළ ලාභය රු. 85,760,194/- ක් ලෙස ගණන් බලා ඇති අතර එය රු. 723,425/- ක ධනාත්මක විචලනයක් පෙන්නුම් කරයි. ගිණුම් වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කිරීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ අපේක්ෂාව වන අතර, විගණකාධිපති වාර්තාවේ (යොමු අංක LS/H/IDB/1/14/21 දරණ) 'වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම' නැමති ශීර්ෂය යටතේ සඳහන් කර තිබූ අදහස් පිළිබඳ අපගේ දැඩි අවධානය යොමු කරමින්, වාර්ෂික වාර්තා නොපමාව විගණනය සඳහා ඉදිරිපත් කිරීමටත්, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබේ.

සමස්තයක් වශයෙන් සලකා බැලීමේදී කාර්මික සංවර්ධන මණ්ඩලය පසු ගිය වර්ෂයට සාපේක්ෂව වඩාත් ඉහළ කාර්ය සාධනයක් අත් කර ගනිමින් ජාතික ආර්ථිකයෙහි දියුණුව සහ සමෘද්ධිය උදෙසා වැඩි දායකත්වයක් සපයා දී තිබේ. ඉදිරි වර්ෂ වලදී ඉන් ඉහළ සහ එය අභිබවා ගිය කාර්ය සාධනයක් පෙන්නුම් කිරීමට අපේක්ෂා කෙරේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයට එළඹෙන වර්ෂය සහ ඉන් ඉදිරිය සඳහා ද වර්ධන සැලසුම් තිබේ. කර්මාන්ත පුහුණු, සමාකරණය සහ නව තාක්ෂණයන් ආදියෙහි ධාරිතාවය පුළුල් කිරීම සඳහා අපි ආයෝජනය කර ඇත්තෙමු. එසේ කිරීම මගින් අපි අනාගත ව්‍යවසායකත්වයන් සොයා යමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හරහා සමස්ත ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ඒවායෙහි දායකත්වය ලබා දීමට අපේක්ෂා කරන්නෙමු.

අවසන් වශයෙන්, අපගේ වාර්ෂික අභිමතාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අප විසින් දරන ලද සියලු ප්‍රයත්නයන්හි දී අවශ්‍ය මගපෙන්වීම, ධෛර්යය සහ අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් මාගේ හෘදයාංගම කෘතඥතාවය පළ කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. මණ්ඩලයේ වැදගත් මෙහෙයුම් වැඩිදියුණු කර ගැනීම පිණිස පරීක්ෂාකාරී වෙමින්, අවශ්‍ය මගපෙන්වීම සහ ඉමහත් සහයෝගයක් සපයා දීම වෙනුවෙන් මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමනාකරණයටත් මාගේ කෘතඥතාවය පළ කරමි.

දැඩි කැපවීමෙන් යුතුව සේවය කරන කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලු සේවකයින් මම අවංකව ඇගයීමට ලක් කරමි. ඔවුන්ගේ සහයෝගය සහ කැපවීම නොතිබෙන්නට මණ්ඩලයට මෙම සාර්ථකත්වය අත් කර ගැනීමට නොහැකි වන්නට තිබුණි. සැබවින්ම ඔවුන්ගේ පොදු සාර්ථකත්වය සහ පොදු වගකීම පිළිබඳ අප තුළ ඇති විශ්වාසය නිසා සභාපතිතුමාගේ නායකත්වය යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලයත්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට මණ්ඩලය විසින් සපයා දෙනු ලබන දායකත්වයත් ඉතා වැදගත් දියුණුවක් අත් කර ගෙන තිබේ.

**පී.එල්.යූ. රත්නමලල**
**අධ්‍යක්ෂ ජෙනරාල්**

ප්‍රධාන සේවාවන් සහ පහසුකම්



## ආයතනික ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
අධ්‍යක්ෂ ජෙනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)
අධ්‍යක්ෂ - පරිපාලන
අධ්‍යක්ෂ - මුදල්
අධ්‍යක්ෂ - සැලසුම්
අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන
අධ්‍යක්ෂ - කාර්මික ජනපද
අධ්‍යක්ෂ - ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
අධ්‍යක්ෂ - ඉංජිනේරු
අධ්‍යක්ෂ - තාක්ෂණික සේවා
අධ්‍යක්ෂ - අලෙවි

# පටුන

**1.0** **කාර්යසාධන සමාලෝචනය** **01 - 03**

**2.0** **ප්‍රධාන ජයග්‍රහණ** **04 - 07**

- ප්‍රදර්ශන
  - "කිතුලක වරුණ"
  - ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය 2015 සමසංවිධායක
- තාක්ෂණය ලබා ගැනීම සහ නිෂ්පාදන ගුණාත්මක භාවය සහ ඵලදායීත්වය වැඩිදියුණු කර ගැනීම
- සේ.නි.භා. අරමුදලෙහි සාමාජිකත්වය ප්‍රදානය කිරීමේ වැඩසටහන
- ප්‍රතීතනය ලත් ආහාර පරීක්ෂණ විද්‍යාගාරය

**3.0** **ප්‍රගති සාරංශය** **08 - 13**

- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම
- කාර්මික ජනපද පිහිටුවීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම
- තාක්ෂණික, තාක්ෂණවේදී සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම
- අලෙවිකරණ සහ විකුණුම් සහාය සහ පහසුකම් සැලසීම
- තාක්ෂණික, තාක්ෂණවේදී සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාප්ති සහ උපදේශන සේවා

**4.0** **කාර්යසාධන ජයග්‍රහණ** **14**

- පාලන අංශය (AD) **15 - 17**
- ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) **18 - 23**
- සැලසුම් අංශය (PD) **24 - 25**
- අලෙවි අංශය (MD) **26 - 27**
- කාර්මික ජනපද අංශය (IED) **28 – 33**
- රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPD&SC) **34 - 35**
- ඉංජිනේරු අංශය (ED) **36 - 37**
- ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) **38 - 42**
- තාක්ෂණ සේවා අංශය (TSD) **43 - 46**
- සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF) **47 - 48**

**5.0** **මූල්‍ය ප්‍රකාශන** **49**

- විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **50**
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **51**
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය **52**
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **53**
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන් **54 - 72**

**6.0** **මණ්ඩලයේ කරුණු දැක්වීම් සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව** **73 - 104**

# කාර්ය සාධන සමාලෝචනය

## කාර්ය සාධන සමාලෝචනය

2015 වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය එහි අදාළ අංශ හරහා පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත:

**වගුව 1.1 - ඉටු කරන ලද ක්‍රියාකාරකම්**

| | ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | ඒකක ගණන | ආයෝජනය (රු.) | රැකියා අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අ | නව කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක අරම්භ කිරීම සඳහා තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය ලබාදීම | 349 | 738,879,339 | 1,373 |
| ආ | පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට, පුළුල් කිරීමට සහ නවීකරණය කිරීමට තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය ලබාදීම | 1,603 | 210,262,173 | 6,489 |
| | **එකතුව** | **1,952** | **949,141,512** | **7,862** |

මෙහි 1.2 වගුවේ (අ) සහ (ආ) යටතේ සඳහන් විෂයයන්ට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් අංශයෙහි සාමාන්‍ය කාර්ය සාධනය 2014 වර්ෂයෙහි එම කාර්ය සාධනයට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරයි. අලුතින් කර්මාන්ත ස්ථාපිත කිරීමේ අඩුවීමක් තිබුණ ද, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන් යටතේ සිදුකළ සමස්ත ආයෝජන ප්‍රමාණය 45% ට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වී ඇති අතර මුළු රැකියා අවස්ථා සංඛ්‍යාව ද 70% කින් වර්ධනය වී ඇත.

**වගුව 1.2 - 2014 සහ 2015 වර්ෂවල සංසන්දනාත්මක තත්ත්වයන්**

| විස්තරය | 2014 | 2015 | වැඩිවීමේ (අඩුවීමේ) ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| මුළු ඒකක ගණන (අ) සහ (ආ) | 2,216 | 1,952 | (-11.9) |
| මුළු ආයෝජනය (රු.) | 655,914,360 | 949,141,512 | (44.7) |
| මුළු රැකියා සංඛ්‍යාව | 4,615 | 7,862 | (70.3) |



## 2015 වර්ෂයේ කාර්ය සාධනය

කාර්මික සංවර්ධන මණ්ඩලය එහි අරමුණු ඉටු කර ගැනීම පිණිස ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ නගාසිටුවීම සඳහා සමස්ත සේවා පැකේජයක් සපයා දී ඒ සඳහා පහසුකම් සලසා දී ඇත. එයට අමතරව, මණ්ඩලය රේඛීය අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලද "කිතුල් සංවර්ධන ජාතික වැඩසටහන, මැටි කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම, සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම, කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම සහ කාන්තා ව්‍යවසායකත්ව ආදී අනෙකුත් ආංශික සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියලු සේවා සපයා දීමද සිදු කර ඇත. එමෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලය දිවයින පුරා පිහිටි කාර්මික ජනපද ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය සඳහා තවත් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

මෙම කාල පරිච්ඡේදය තුළදී මණ්ඩලය නව කර්මාන්ත 349 ක් ආරම්භ කිරීම සඳහා සහාය දීම, පවතින කර්මාන්ත 642 ක් සංවර්ධනය කර නගා සිටුවීම, ස්වයං රැකියා ව්‍යාපාර ඒකක 961 ක් නිර්මාණය කිරීම සහ රැකියා අවස්ථා 7,862 ක් උත්පාදනය කිරීම සිදු කර ඇත.




- කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙන ලද ව්‍යාපාර සංවර්ධන සේවා අතර දැනුම්වත් කිරීමේ වැඩසටහන් 42 ක්, ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් 16 ක් සහ කාන්තා ව්‍යවසායකයින් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් පැවැත්වූ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 45 ක් වූ අතර එමගින් අනාගත ව්‍යවසායකයින් 1,923 දෙනෙකුට ප්‍රතිලාභ අත්විය. ව්‍යවසායකයින්ගේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ ණය අවශ්‍යතා ඉටු කර දීම පිණිස ව්‍යාපෘති ශක්‍යතා වාර්තා 117 ක් ද, යන්ත්‍ර සූත්‍ර සම්බන්ධ තක්සේරු වාර්තා 79 ක් ද සකස් කර ඇත. ඉංජිනේරු සේවා යටතේ සේවා 831 ක් සපයා දී ඇති අතර වැඩ 84 ක් නිම කර ඇත. මෙම කාල පරිච්ඡේදය තුළදී ඉංජිනේරු අංශය විසින් යන්ත්‍රසූත්‍ර, මෙවලම් සහ උපකරණ 49 ක් නිෂ්පාදනය කර ඇත. කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි මධ්‍යස්ථාන හරහා කර්මාන්තකරුවන් 40 දෙනෙකුට අලෙවිකරණ පහසුකම් සලසා දී ඇති අතර, ව්‍යවසායකයින් 327 දෙනෙකුට බැංකුවලින් ණය පහසුකම් ලබා ගැනීම සඳහා සහයෝගය ලබා දී ඇත.

- **හැකියා සංවර්ධන සහ ඵලදායිතා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන්** - 2015 වර්ෂය තුළ පවත්වන ලද හැකියා සංවර්ධන වැඩසටහන් සහ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් 52 ක් හරහා කර්මාන්තකරුවන් 1,623 දෙනෙකුට ප්‍රතිලාභ හිමි විය.

- **තාක්ෂණය ලබාදීමේ පුහුණු, නිෂ්පාදන සංවර්ධන සහ නිදර්ශන වැඩසටහන් -** තාක්ෂණය ලබාදීම සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් සහ නිදර්ශන වැඩසටහන් 370 ක් පවත්වා ඇති අතර ව්‍යවසායකයින් 7,352 දෙනෙක් එයින් ප්‍රතිලාභ ලබා ඇත.

# ප්‍රධාන ජයග්‍රහණ

**මෙම වර්ෂය තුළ අත් කර ගත් ප්‍රධාන ජයග්‍රහණ කිහිපයක් පහත සඳහන් පරිදි වේ:**

## 1. ප්‍රදර්ශන

### (i) "කිතුලක වරුණ"

"කිතුලක වරුණ" ප්‍රදර්ශනය සහ වෙළඳ සැණකෙළිය 6 වැනි වරටත් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහාය ඇතිව 2015 අප්‍රේල් මස 03 වැනි දින සිට 05 වැනි දින දක්වා කොළඹ සුදර්ශි ශාලාවෙහිදී පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතාගේ ආරාධනය පරිදි මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

කිතුල් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ කිතුල් නිෂ්පාදන සඳහා වෙළඳපොල අවස්ථා නිර්මාණය කිරීම යන අරමුණු ඇතිව මෙම ප්‍රදර්ශනය පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ප්‍රදර්ශන කුටි 52 කින් සමන්විත වූ අතර, හොඳම ප්‍රදර්ශන කුටි 06 හිමි ව්‍යවසායකයින්ට තිළිණ ප්‍රදානය කරන ලදී. එමෙන්ම කිතුල් හකුරු, කිතුල් පැණි සහ කිතුල් පිටි නිෂ්පාදනය පිළිබඳ නිදර්ශන වැඩසටහන් ද පවත්වන ලදී.







**(ii) අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්ව පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය 2015 පැවැත්වීම**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය සමග එක්ව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 7 වැනි වරට පැවැත්වූ 'පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2015' කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී 2015 පෙබරවාරි මස 06 වැනි දින සිට 08 වැනි දින දක්වා පැවැත්විණි.

දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් මෙම කර්මාන්තයේ ප්‍රතිරූපය ගොඩනගා එමගින් මෙම කර්මාන්තයට පිළිගැනීමක් අත් කර දීම මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරීමේ ප්‍රධානතම අරමුණ විය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දක්ෂතා සහ හැකියා ප්‍රදර්ශනය කිරීම, තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම සහ ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ අපනයන ධාරිතාවයන් ප්‍රවර්ධනය කිරීම මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරීමේ අනෙකුත් අරමුණු අතර විය.

මෙම ප්‍රදර්ශනය පාවහන්, සම්භාණ්ඩ නිෂ්පාදන, ගමන් භාණ්ඩ, අමුද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර සහ උපාංග ප්‍රදර්ශනය කෙරෙන ප්‍රදර්ශන කුටි 200 ට අධික සංඛ්‍යාවකින් සමන්විත විය. එමෙන්ම ආසියානු කලාපයේ සිටින අමුද්‍රව්‍ය සහ අනෙකුත් උපාංග සැපයුම්කරුවන්ට ද මෙම ප්‍රදර්ශනයට සහභාගී වීමට ආරාධනය කරන ලදී. ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ගැණුම්කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස අපනයන පදනම් කර ගත් නිෂ්පාදන **ප්‍රදර්ශන කිරීම සඳහා පමණක් වෙන්වූ විශේෂ මණ්ඩපයක්** සංවිධානය කර තිබුණි. ප්‍රදර්ශනයෙහි විශේෂ අංග ලෙස විලාසිතා ප්‍රදර්ශනයක්, නිර්මාණ තරඟයක් සහ හොඳම ප්‍රදර්ශන කුටිය තේරීමේ තරඟයක් ද පවත්වන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලය මෙම ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටි 47 ක් සහිත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩපය සංවිධානය කළේය.







## 2. තාක්ෂණය ලබා ගැනීම සහ නිෂ්පාදන ගුණාත්මක භාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම

(i) තාක්ෂණ සේවා අංශය විසින් පවත්වනු ලබන තාක්ෂණය ලබා දීමේ වැඩසටහන සඳහා රබර් පර්යේෂණ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර පර්යේෂණ ඒකකය, සහ ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය යන ආයතන වලින් කාර්මික සංවර්ධන මණ්ඩලයට පහත සඳහන් තාක්ෂණයන් ලබා ගන්නා ලදී.

- **මැලියම් :**
  ප්‍රතික්‍රිය නොවන මැලියම් (පොලිවීනයිල් ඇසිටේට්), ප්‍රතික්‍රිය නොවන මැලියම් (පොලිවීනයිල් ඇල්කොහොල්) සහ ස්පර්ශ මැලියම් (නියොප්‍රීන්)
- **සෝයා නිෂ්පාදන :**
  සෝයා ටොෆු, සෝයා කිරි, සෝයා සොසෙජ්, සෝයා ස්නැක්ස් සහ සෝයා අයිස්ක්‍රීම්
- **පොල් නිෂ්පාදන :**
  පොල් වතුර බෝතල් කිරීම, පොල් විනාකිරි, පොල් තලප, පොල් අයිස් ක්‍රීම්, පොල් ජෑම්

(ii) ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම පිණිස පිරිසැකසුම් තත්ත්වයන්හි ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා "අනුකූලතා ලිපියක්" නිකුත් කිරීම පිණිස 2015 ජූනි මස 28 වැනි දින කොළඹ 12, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවතේ, අංක 42 දරණ ස්ථානයෙහි පිහිටි ලීලා එක්ස්පෝට් ඇන්ඩ් ඉම්පෝර්ට් ආයතනයෙහි නිෂ්පාදන අංශය පරීක්ෂා කිරීම සඳහා තාක්ෂණ සේවා අංශය එම ස්ථානයෙහි සංචාරයක නිරත විය.

## 3. සේ.නි.භා. අරමුදල් සාමාජිකත්වය ප්‍රදානය කිරීමේ වැඩසටහන

සුළු හා මධ්‍ය පරිමාණ පාවහන් නිෂ්පාදකයින්ගේ ජීවන තත්ත්වයෙහි ස්ථාවර බව වැඩිදියුණු කිරීම පිණිස සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සමග එක්ව මෙම සාමාජිකත්වය ප්‍රදානය කිරීමේ වැඩසටහන සංවිධානය කරන ලද අතර පාවහන් සහ සම්භාණ්ඩ කර්මාන්තයේ නියැළි 500 දෙනෙකු තම සේ.නි.භා.අ. සාමාජිකත්වය ලබා ගත්හ.

## 4. ප්‍රතීතනය ලත් ආහාර පරීක්ෂණ විද්‍යාගාරය

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහායවීම සඳහා රුපියල් මිලියන 15 ක වියදමින් යෝජිත ප්‍රතීතනය ලත් ආහාර පරීක්ෂණ විද්‍යාගාරයේ කොටසක් මේ වන විටත් ඉදිකර ඇති අතර, රුපියල් මිලියන 5.38 ක් වැය කර එයට අවශ්‍ය උපකරණ සහ සවිකිරීම් ද සපයා දී ඇත.

**එම විද්‍යාගාරයෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට පහත සඳහන් විද්‍යාගාර පහසුකම් සපයා දෙනු ලැබේ.**

- ආහාර නිෂ්පාදන සඳහා පරීක්ෂණ සහ පර්යේෂණ හා සංවර්ධන පහසුකම් සපයා දීම හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය සහ අන්තර්ජාතික වෙළඳ පොළ සඳහා නිෂ්පාදනය කෙරෙන ආහාර නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවාවන් වඩාත් ශක්තිමත් කිරීම.
- පාරිභෝගිකයින් වෙත ලැබෙන ආහාර නිෂ්පාදනවල ගුණාත්මක භාවය සහතික කිරීම.

# ප්‍රගති සාරාංශය

- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම.
- අලෙවි සහ වෙළඳ සහාය හා පහසුකම් සැලසීම
- කාර්මික ජනපද ආරම්භ කිරීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම
- කාර්මික, තාක්ෂණ සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ව්‍යාපෘති සහ උපදේශණ සේවා සැපයීම

# වගුව 3.1 - ප්‍රගති සාරාංශය 2015

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ඉලක්කය | ලබා ගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත්කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | අනාගත ව්‍යවසායකයින් වීමේ හැකියාව සහිත අය හඳුනාගැනීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් / ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම. | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 83 | 46 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 2535 | 1199 |
| | | පවත්වන ලද ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ සංඛ්‍යාව | 25 | 16 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 1875 | 894 |
| | අනාගත ව්‍යවසායකයින් වීමේ හැකියාව සහිත අය සහ පවතින කර්මාන්ත සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් සහ තාක්ෂණ නිරූපණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් සංඛ්‍යාව | 250 | 370 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 5000 | 7352 |
| | | පවත්වන ලද නිදර්ශන සංඛ්‍යාව | 582 | 310 |
| | නව සහ දැනට සිටින ව්‍යවසායකයින් / කර්මාන්ත සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 50 | 45 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 1500 | 1923 |
| | තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශකත්ව සේවා සපයාදීම | සපයාදෙන ලද තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශකත්ව සේවා සංඛ්‍යාව | 165 | 134 |
| | | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | 165 | 134 |
| | පහසුකම් සැලසීමේ සහ පසුවිපරම් ක්‍රියාකාරකම් | නිර්මාණය කරන ලද නව කර්මාන්ත සංඛ්‍යාව | 595 | 349 |
| | | නිර්මාණය කරන ලද ස්වයං රැකියා ඒකක සංඛ්‍යාව | 1116 | 961 |
| | | ප්‍රවර්ධනය කරන ලද, පවතින කර්මාන්ත සංඛ්‍යාව | 1108 | 642 |
| | | එකතුව ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | - | 7862 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඉලක්කය | ලබා ගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| අලෙවි කරණ සහ විකිණීම සහාය සහ පහසුකම් සැලසීම | කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි මධ්‍යස්ථාන හරහා අලෙවි පහසුකම් සපයා දීම | අලෙවි පහසුකම් ලබාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 300 | 40 |
| | | සු.ම.ක. විසින් සිදුකළ අලෙවි කිරීම්වල වටිනාකම (රු.මි.) | 16 | 10.7 |
| | උපකොන්ත්‍රාත් හුවමාරු යටතේ කර්මාන්ත ලියාපදිංචි කිරීම | සු.ම.ක. සඳහා නිර්මාණය කර ඇති උපකොන්ත්‍රාත් ලබාදීමේ සහ ආපසු මිලදී ගැනීමේ අවස්ථා සංඛ්‍යාව | 40 | 33 |
| | උප කොන්ත්‍රාත් පහසුකම් සපයාදීම | උප කොන්ත්‍රාත්දීම් හුවමාරුවෙන් දෙන ලද ඇණවුම්වල මුළු වටිනාකම (රු.මි.) | 25 | 9.8 |
| | | ප්‍රතිලාභ ලැබූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 20 | 19 |
| | ගැණුම්කරුවන්ට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය විශාල තොග වශයෙන් මිලදී ගෙන සිල්ලරට විකිණීම | අමුද්‍රව්‍ය (අබලි ලෝහ) ලබාගත් ව්‍යාපාර සංඛ්‍යාව | 750 | 726 |
| | | එකතු කරන ලද අබලි ද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.) | 1000 | 758 |
| | | බෙදා දෙන ලද අබලි ද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.) | 1000 | 776 |
| | කේන්ද්‍ර අපසාරික රබර් කිරි සහ සංයෝග කළ රබර් විකිණීම | පිරිසැකසුම් කරන ලද සහ සපයන ලද කේන්ද්‍ර අපසාරී රබර් කිරි ප්‍රමාණය (ලී) | 13000 | 9952 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 85 | 76 |
| | රබර් සංයෝග, අමුද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය විකිණීම | සපයන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 57500 | 35112 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 300 | 260 |
| | රබර් සංයෝග ඇඹරීම සහ සැපයීම | සපයන ලද ප්‍රමාණ (කි.ග්‍රෑ.) | 35500 | 19174 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 60 | 58 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඉලක්කය | ලබා ගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| කාර්මික ජනපද ආරම්භ කිරීම, නඩත්තු කිරීම සහ සංවර්ධනය යාම | අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ඉටු කර ඇති සංවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රතිශතය | | |
| | නව ව්‍යාපාර සඳහා සංවර්ධනය කරන ලද බිම් කැබලි වෙන්කරදීම සහ නැවත බෙදාදීම | වෙන් කරන ලද කර්මාන්ත ශාලා ඒකක / සංවර්ධනය කරන ලද බිම් කැබලි සංඛ්‍යාව | 25 | 23 |
| | | වෙන්කර දෙන ලද කර්මාන්තශාලා ඒකක / සංවර්ධනය කරන ලද බිම් කැබලිවල ආරම්භ කර ඇති වාණිජ මෙහෙයුම් සංඛ්‍යාව | 20 | 14 |
| | | උත්පාදනය කර ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව | 200 | 233 |
| | පසුවිපරම | ස්ථාපනය කර ඇති අගය එකතු කිරීමේ කර්මාන්ත සංඛ්‍යාව | - | - |
| | කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ අනෙකුත් ක්‍රියාකාරකම් (මාර්ග ඉදිකිරීම, වීදි ආලෝකමත් කිරීම, ආරක්ෂාව වැඩිදියුණු කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම, ජල සම්පාදනය ආදිය) | ඉටු කර ඇති සංවර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාවේ ප්‍රතිශතය | 18 | 05 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඉලක්කය | ලබා ගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| කාර්මික, තාක්ෂණ සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම | | | - | - |
| | නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ ලියාපදිංචිය සමග GMP, SLS තත්ත්ව සහතික ලබාගැනීමට සහායවීම | GMP, SLS, ISO සහ අනෙකුත් සහතික කිරීම්වලට / ප්‍රමිතීන්ට වැඩි දියුණු කරන ලද කර්මාන්ත සංඛ්‍යාව | 25 | 14 |
| | සකස් කරන ලද / පිරිසකසන ලද යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර සංඛ්‍යාව | - | 2 |
| | | යන්ත්‍රසූත්‍ර / උපකරණවලින් ප්‍රතිලාභ ලැබූ ව්‍යාපාර සංඛ්‍යාව | 60 | 51 |
| | යන්ත්‍රසූත්‍ර නිෂ්පාදනය කිරීම සහ විකිණීම (ගම්මාන සංවර්ධනය සඳහා ද ඇතුළුව) | විකුණන ලද යන්ත්‍රසූත්‍ර සංඛ්‍යාව | 48 | 21 |
| | ඉංජිනේරු සේවා සපයාදීම: තක්සේරු, වාත්තු වැඩපොළ, කම්හල් සේවා, විද්‍යුත් ලෝහාලේපන සහ රසායනාගාර සේවා | සපයා දෙන ලද ඉංජිනේරු සේවා සංඛ්‍යාව | 1412 | 831 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ඉලක්කය | ලබා ගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාප්ති සහ උපදේශණ සේවා සැපයීම | ව්‍යාපෘති හඳුනාගැනීම, ආදර්ශ ව්‍යාපෘති වාර්තා සහ ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන සකස් කිරීම | ශක්‍යතා වාර්තා / ව්‍යාපෘති වාර්තා ලබාගත් ව්‍යාපාර සංඛ්‍යාව | 208 | 117 |
| | ණය පහසුකම් ලබා ගැනීම සඳහා උපකාරී වීම | ප්‍රතිලාභ ලබා ගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 200 | 327 |
| | යන්ත්‍රසූත්‍ර තක්සේරු කිරීම | සකස් කරන ලද තක්සේරු වාර්තා සංඛ්‍යාව | 140 | 79 |
| | නිෂ්පාදන සංවර්ධන සහ පරීක්ෂණ සේවා සපයාදීම | සපයා දුන් නිෂ්පාදන සංවර්ධන සහ රසායනාගාර පරීක්ෂණ සේවා සංඛ්‍යාව | 2925 | 1513 |
| | ප්‍රාදේශීය / දිස්ත්‍රික් කර්මාන්ත සංගම් පිහිටුවීම | දිස්ත්‍රික් සහ ජාතික මට්ටම් වලින් පිහිටුවන ලද / ශක්තිමත් කරන ලද කර්මාන්ත සංගම් සංඛ්‍යාව | 318 | 304 |

## කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දී ඇති සේවා සහ පහසුකම් සැලසීම්






# කාර්ය සාධන ජයග්‍රහණ

- පාලන අංශය (AD)
- ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)
- සැලසුම් අංශය (PD)
- අලෙවි අංශය (MD)
- කාර්මික ජනපද අංශය (IED)
- රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPD&SC)
- ඉංජිනේරු අංශය (ED)
- ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
- තාක්ෂණ සේවා අංශය (TSD)

## 4.1 පාලන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, නෛතික කටයුතු, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, සහ ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මණ්ඩලයේ පාලන අංශයේ වගකීම වේ.

**මෙම අංශයට පැවරී ඇති කාර්යයන් / වගකීම්:**

- කාර්මික සංවර්ධන මණ්ඩලය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
- ආයතනික අවශ්‍යතාවයන්ට අනුව සේවකයින් බඳවාගැනීමේ පටිපාටිය සහ උසස්කිරීම් පටිපාටිය සංශෝධනය කිරීම.
- වැටුප් විෂමතා නිවැරදි කිරීම
- බඳවාගැනීම්, උසස් කිරීම්, කාර්ය සාධන ඇගයීම්, මාරු කිරීම් සහ විශ්‍රාම ගැනීම් ආදියට අදාළ කටයුතු ඉටු කිරීම
- වාහන බැහැර කිරීම් සහ අලුතින් වාහන මිලදී ගැනීම.
- ආයතනය තුළ විනය පවත්වා ගැනීම - විනය පරීක්ෂණ පැවැත්වීම.
- කම්කරු ගැටළු, අල්ලස් හෝ දූෂණ කොමිසම සහ විනිශ්චය සභා විසින් එවනු ලබන විමර්ශන ආදිය සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- විදේශ ශිෂ්‍යාත්ව / පුහුණු සම්බන්ධීකරණය කිරීම.
- දේශීය පුහුණු සංවිධානය කිරීම සහ සපයා දීම (කණ්ඩායම් සහ තනි පුද්ගල)
- සේවක සුභ සාධනය සහ සේවක වන්දි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම
- අභ්‍යන්තර ආරක්ෂක සේවා කළමනාකරණය කිරීම
- මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම.
- මණ්ඩලයේ ප්‍රවාහන සේවා කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.
- පොළොන්නරුව සහ කොටගල පිහිටි සංචාරක බංගලා නඩත්තු කිරීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම.

වගුව 4.1.1 – 2015 දෙසැම්බර් 31 දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව

| කාණ්ඩය | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | එකතුව සහ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| | පිරිමි | කාන්තා | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 01 | 06(1.24%) |
| තෘතියික මට්ටම | 62 | 19 | 81(16.84%) |
| ද්විතියික මට්ටම | 107 | 104 | 211(43.87%) |
| ප්‍රාථමික මට්ටම | 177 | 06 | 183(38.04) |
| එකතුව | 351 (72.98%) | 130 (27.02%) | 481 (100.0%) |




ප්‍රස්තාරය 4.1.1 – කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව

වගුව 4.1.2 – 2015 මූල්‍ය වර්ෂය තුළ පාලන අංශයේ කාර්ය සාධන ජයග්‍රහණ

| | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | **මානව සම්පත් කළමනාකරණය - බඳවාගැනීම්** | |
| (i) | බඳවාගැනීම් (කාර්ය මණ්ඩල) | 19 |
| (ii) | ඉල්ලා අස්වීම් | 06 |
| (iii) | විශ්‍රාමයාම් | 17 |
| (iv) | සේවය අතහැර යාම් | - |
| 2 | **විනය කළමනාකරණය** | |
| (i) | විනය පරීක්ෂණ පැවැත්වීම | 03 |
| (ii) | කම්කරු කොමසාරිස් මගින් කටයුතු කළ කම්කරු නඩු | 10 |
| 3 | **මානව සම්පත් සංවර්ධනය - පුහුණු** | |
| (i) | දේශීය පුහුණු | 213 |
| (ii) | විදේශීය පුහුණු | 13 |
| 4 | **මානව සම්පත් කළමනාකරණය - වන්දි** | |
| (i) | පුද්ගලයින් 24 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් | රු. 1,0399,496.50 |
| 5 | **මානව සම්පත් කළමනාකරණය - සේවක සුභසාධන** | |
| (i) | බයිසිකල් ණය | 15 |
| (ii) | ආපදා ණය | 110 |
| (iii) | වෛද්‍ය ප්‍රතිකාර යෝජනා ක්‍රමය (වෛද්‍ය ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූරණය කිරීම) | 481 |
| 6 | **ආරක්ෂාව කළමනාකරණය කිරීම** | |
| (i) | ආරක්ෂක පිරිවැය | රු. 20,349,597.41 |
| 7 | **බැහැරකිරීම්** | |
| (i) | පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල | 01 |
| 8 | **සාමාන්‍ය උත්සව** | |
| (i) | උත්සව සංඛ්‍යාව | 03 |
| 9 | **තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු** | |
| (i) | තැපැල් ගාස්තු | රු.491,878.00 |
| (ii) | විදුලි සංදේශ ගාස්තු | රු.5,397,200.06 |
| 10 | **ප්‍රවාහන කළමනාකරණය** | |
| (i) | ඉන්ධන වියදම | රු. 3,729,138.00 |
| (ii) | වාහන නඩත්තු වියදම | රු. 3,453,808.00 |
| 11 | **ප්‍රසම්පාදන කළමනාකරණය** | |
| (i) | ඉදිරිපත් කරන ලද ඇණවුම් සංඛ්‍යාව | 418 |
| (ii) | ප්‍රාග්ධන මිලදී ගැනීම් | රු.13,346,129.16 |
| (iii) | පුනරාවර්තන මිලදී ගැනීම් | රු.30,812,090.22 |

## 4.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය

### 4.2.1 සාමාන්‍ය

දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 25 කින් සමන්විත ප්‍රාදේශීය සංවර්ධන අංශයට ප්‍රාදේශීය මට්ටමින් එහි ප්‍රධාන කාර්යයන් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස කාර්මික සංවර්ධන පනත යටතේ විශාල වශයෙන් බලතල පවරා දී තිබේ.

මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්ත ගම්මාන සංවර්ධන ඒකකය එහි සමස්ත දිස්ත්‍රික්ක 25 ම ආවරණය කෙරෙන ප්‍රාදේශීය ජාලය හරහා කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය දියුණු කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. 2015 වර්ෂයේදී ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී. පවතින කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම නව කර්මාන්ත ආරම්භ කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ද අනාගත ව්‍යවසායකයින් සහ දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීම පිණිස නිපුණතා සංවර්ධන සහ හැකියා සංවර්ධන ආදී පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

මේ සම්බන්ධ කාර්යයන් සහ අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන ගේ මග පෙන්වීම යටතේ දිස්ත්‍රික් කාර්යාලවලට සහ ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශයට ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 66 දෙනෙකු අනුයුක්ත කර තිබුණි.

පුහුණු වැඩසටහන් / සම්මන්ත්‍රණ, ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, හැකියා සංවර්ධන වැඩසටහන් ආදිය පැවැත්වීම, වෙළඳපොළ සහාය / වෙළඳපොළ සම්බන්ධතා, නිෂ්පාදන සහ ක්‍රියාවලි තාක්ෂණ ලබා දීම සහ නිදර්ශන වැඩසටහන් පැවැත්වීම, ශක්‍යතා අධ්‍යයන සිදු කිරීම සහ සහනදායී මිල ගණන් යටතේ කර්මාන්ත අමුද්‍රව්‍ය සපයාදීම ආදිය දිස්ත්‍රික් කාර්යාල වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයන් වේ.

එයට අමතරව, නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන සහ ජාතික කිතුල් සංවර්ධන වැඩසටහන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව ක්‍රියාත්මක කළ උපාය මාර්ග සමහරක් වූහ.

නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 21 දෙනෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් 06 දෙනෙකු සහ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 62 දෙනෙකුගෙන් යුත් ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයකින් සමන්විත ප්‍රාදේශීය සංවර්ධන අංශය 2015 ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අත් කර ගෙන ඇති ප්‍රගතිය පහත සඳහන් පරිදි වන අතර 2015 ප්‍රාග්ධන අයවැය යටතේ එයට වෙන් කර තිබූ මුදල රුපියල් මිලියන 15 ක් විය.



අලුතින් කර්මාන්ත ආරම්භ කිරීම - 2015 - පළාත් මට්ටමින්
350
300
250
200
150
100
50
0
194
261
133
84
48
134
161
66
292
42
57
41
27
16
40
56
24
46
බස්නාහිර
දකුණු
මධ්‍යම
උතුරු මැද
ඌව
සබරගමුව
වයඹ
නැගෙනහිර
උතුර
ඒකක ගණන
රැකියා අවස්ථා ගණන




පවතින කර්මාන්ත පුළුල් කිරීම - 2015 - පළාත් මට්ටමින්
1800
1600
1400
1200
1000
800
600
400
200
0
1591
1575
639
140
320
616
621
578
409
353
293
187
55
74
151
194
148
148
බස්නාහිර
දකුණු
මධ්‍යම
උතුරු මැද
ඌව
සබරගමුව
වයඹ
නැගෙනහිර
උතුර
ඒකක ගණන
රැකියා අවස්ථා ගණන

වගුව – 4.2.1.2

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
## 2015 වර්ෂයේ නව කර්මාන්ත ඒකක ආරම්භ කිරීම සඳහා සහාය ලබා දීම

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | ආයෝජනය (රු.) | රැකියා අවස්ථා |
|---|---|---|---|---|
| මධ්‍යම | මහනුවර | 20 | 13,540,009 | 61 |
| | මාතලේ | 15 | 12,550,003 | 55 |
| | නුවර එළිය | 6 | 2,710,000 | 17 |
| **එකතුව** | | **41** | **28,800,012** | **133** |
| නැගෙනහිර | අම්පාර | 7 | 1,679,000 | 16 |
| | ත්‍රිකුණාමලය | 14 | 4,410,500 | 43 |
| | මඩකලපුව | 3 | 1,110,000 | 7 |
| **එකතුව** | | **24** | **7,199,500** | **66** |
| උතුරු මැද | අනුරාධපුරය | 21 | 2,398,000 | 41 |
| | පොළොන්නරුව | 6 | 3,915,003 | 7 |
| **එකතුව** | | **27** | **29,025,017** | **48** |
| උතුරු | යාපනය | 21 | 307,521,502 | 164 |
| | වවුනියාව | 5 | 5,315,000 | 18 |
| | කිලිනොච්චිය | 8 | 1,109,244 | 80 |
| | මන්නාරම | 8 | 3,387,000 | 17 |
| | මුලතිව් | 4 | 2,345,000 | 13 |
| **එකතුව** | | **46** | **319,677,746** | **292** |
| වයඹ | කුරුණෑගල | 25 | 28,290,000 | 71 |
| | පුත්තලම | 31 | 40,711,505 | 90 |
| **එකතුව** | | **56** | **69,001,505** | **161** |
| සබරගමුව | රත්නපුරය | 12 | 35,625,015 | 57 |
| | කෑගල්ල | 28 | 45,900,010 | 77 |
| **එකතුව** | | **40** | **81,525,025** | **134** |
| දකුණු | ගාල්ල | 21 | 28,655,000 | 47 |
| | මාතර | 19 | 40,437,023 | 94 |
| | හම්බන්තොට | 17 | 18,405,000 | 120 |
| **එකතුව** | | **57** | **87,497,023** | **261** |
| ඌව | බදුල්ල | 13 | 29,025,017 | 41 |
| | මොණරාගල | 3 | 4,888,000 | 7 |
| **එකතුව** | | **16** | **33,858,017** | **48** |
| බස්නාහිර | කොළඹ | 12 | 32,095,000 | 64 |
| | ගම්පහ | 24 | 55,197,502 | 99 |
| | කළුතර | 6 | 17,715,006 | 31 |
| **එකතුව** | | **42** | **1,050,075,008** | **194** |
| **මුළු එකතුව** | | **349** | **738,879,339** | **1,373** |

වගුව 4.2.1.3 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2015 වර්ෂයේ පවතින කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සහාය ලබාදීම

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | අතිරේක ආයෝජන | අමතර රැකියා අවස්ථා |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 164 | 18,581,000 | 511 |
| | ගම්පහ | 96 | 4,509,000 | 821 |
| | කළුතර | 93 | 6,485,850 | 259 |
| **උප එකතුව** | | **353** | **39,575,850** | **1,591** |
| දකුණු | ගාල්ල | 52 | 8,666,000 | 220 |
| | හම්බන්තොට | 141 | 17,004,002 | 1,057 |
| | මාතර | 100 | 18,975,004 | 298 |
| **උප එකතුව** | | **293** | **44,645,006** | **1,575** |
| මධ්‍යම | මහනුවර | 102 | 21,655,004 | 421 |
| | මාතලේ | 61 | 4,467,708 | 161 |
| | නුවර එළිය | 24 | 370,000 | 57 |
| **උප එකතුව** | | **187** | **26,492,712** | **639** |
| උතුරු මැද | අනුරාධපුරය | 30 | 3,050,000 | 75 |
| | පොළොන්නරුව | 25 | 5,310,000 | 65 |
| **උප එකතුව** | | **55** | **8,360,000** | **140** |
| ඌව | බදුල්ල | 59 | 4,170,000 | 165 |
| | මොණරාගල | 15 | 4,425,000 | 155 |
| **උප එකතුව** | | **74** | **8,595,000** | **320** |
| සබරගමුව | කෑගල්ල | 97 | 27,069,000 | 306 |
| | රත්නපුරය | 54 | 12,780,000 | 310 |
| **උප එකතුව** | | **151** | **39,849,000** | **616** |
| වයඹ | කුරුණෑගල | 169 | 15,943,501 | 540 |
| | පුත්තලම | 25 | 4,454,000 | 81 |
| **උප එකතුව** | | **194** | **20,397,501** | **621** |
| නැගෙනහිර | අම්පාර | 46 | 2,089,000 | 76 |
| | මඩකලපුව | 55 | 2,939,000 | 321 |
| | ත්‍රිකුණාමලය | 47 | 4,357,505 | 181 |
| **උප එකතුව** | | **148** | **9,385,505** | **578** |
| උතුරු | යාපනය | 77 | 12,239,500 | 287 |
| | කිලිනොච්චිය | 23 | 62,599 | 48 |
| | මන්නාරම | 28 | 527,000 | 45 |
| | මුලතිවු | 10 | 35,000 | 13 |
| | වවුනියාව | 10 | 97,500 | 16 |
| **උප එකතුව** | | **148** | **12,961,599** | **409** |
| **එකතුව** | | **1,603** | **210,262,173** | **6,489** |

### 4.2.2 කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම සඳහා වන ජාතික වැඩසටහන

**(අ) මැටි කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන**

වඩා දියුණු උපකරණ සහ නවීන තාක්ෂණය භාවිතා කිරීම තුළින් නිෂ්පාදන ගුණාත්මක භාවය සහ නව්‍යතාවය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව මැටි කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මැටි කර්මාන්ත සංවර්ධන වැඩසටහන 2013 අයවැය කථාවෙහිදී හඳුන්වා දෙන ලදී. මැටි කර්මාන්තයේ නියැළෙන ප්‍රජාවන්ගේ ආදායම වැඩි දියුණු කර දීම ද මෙම ව්‍යාපෘතියෙහි අරමුණක් වේ. මෙම වැඩසටහන යටතේ මැටි කර්මාන්ත ගම්මාන 5 ක් සංවර්ධනය කිරීම සඳහා 2015 වර්ෂයෙදී රුපියල් මිලියන 3.36 ක මුදලක් වෙන් කරන ලද අතර එම වර්ෂය තුළදී රුපියල් මිලියන 0.27 ක් වියදම් කරන ලදී.

**(ආ) ව්‍යවසාය ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

ගම් මට්ටමින් කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කර ඔවුන්ට සහාය දීම අරමුණු කරමින් ව්‍යවසාය ගම්මාන සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය 2012 සහ 2013 වර්ෂවල අයවැය යෝජනා මගින් දැඩි ලෙස අවධාරණය කරන ලදී. මේ යටතේ ගම්මාන 2 ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 4.33 ක් වෙන් කර දෙන ලද අතර එයින් රුපියල් මිලියන 2.6 ක් වියදම් කරන ලදී. මෙම ගම්මානවල ප්‍රතිලාභීන් 35 දෙනෙකුට එම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ හිමි විය.

**(ඇ) හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන**

හස්ත කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ 2015 වර්ෂයේදී රුපියල් මිලියන 0.5 ක් වෙන් කරන ලද අතර එයින් රුපියල් මිලියන 0.03 ක් තාක්ෂණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සඳහා වැය කර ඇත. මෙම වැඩසටහන යටතේ ව්‍යවසායකයින් 75 දෙනෙකු ප්‍රතිලාභ ලැබූහ.

### 4.2.3 **කිතුල් නිෂ්පාදන සංවර්ධන කිරීමේ ජාතික වැඩසටහන**

කිතුල් ගසෙහි ඇති විවිධ වූ ප්‍රයෝජන නිසා එය ඉතා වටිනා ගසක් වන අතර කිතුල් මල එහි වටිනාම කොටස ලෙස සළකණු ලැබේ. කිතුල් රා, කිතුල් පැණි සහ කිතුල් හකුරු සෑදීමට යොදා ගන්නා සාරය ලබා ගැනීම පිණිස කිතුල් මල මැදීම සිදු කරනු ලැබේ. එහෙත් කිතුල් මල් මැදීමෙහි ඇති වාණිජමය වටිනාකම පිළිබඳ ප්‍රජාව සතු නොදැනුවත්භාවය නිසා කිතුල් ගස් බොහොමයක මල් මැදීම සිදු නොකරන බව නිරීක්ෂණය වී තිබේ. එම නිසා සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් කිතුල් කර්මාන්තය දියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

කිතුල් නිෂ්පාදකයින්ගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීම මගින් කිතුල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මදිනු ලබන කිතුල් ගස් සංඛ්‍යාව වැඩි කිරීම, ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම වැඩිදියුණු කිරීම, තාක්ෂණය නව්‍යකරණය කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම හරහා උසස් තත්ත්වයේ කිතුල් නිෂ්පාදන හඳුන්වාදීම සහ කිතුල් නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනෙහි අනෙකුත් විශේෂිත අරමුණු අතර වේ. මෙම වැඩසටහන 150 ට අධික ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාවක් ආවරණය කරමින් දිස්ත්‍රික්ක 18 ක ක්‍රියාත්මක කරන ලදී. 2015 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට, සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කිතුල් කර්මාන්තකරුවන් 312 දෙනෙකු සඳහා කිතුල් මල් මැදීමේ තාක්ෂණ පුහුණු වැඩසටහන් 09 ක් සහ "කිතුලක වරුණ ප්‍රදර්ශනය සහ වෙළඳ සල්පිල" සංවිධානය කරන ලදී. එමෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දිවයින පුරා සිටින කිතුල් මල් මදින්නන් සඳහා "KASPER" බෝතල් 3,777 ක් ද බෙදා දී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේදී රුපියල් මිලියන 3.97 මුදලක් වෙන් කර දී තිබුණි.

## 4.3 සැලසුම් අංශය

### 4.3.1 සාමාන්‍ය

ලෝක ආර්ථිකයෙහි සිදු වෙමින් පවතින සීඝ්‍ර පරිවර්තනය හේතුවෙන් ව්‍යාපාර සංවර්ධන සේවාවන්හි ඇතිවී තිබෙන තරඟකාරීත්වය නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසයාකයින්ට වඩාත් අර්ථාන්විත ලෙස සේවා සපයාදීමට හැකි වන පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා ක්‍රමෝපායයන් නැවත සකස් කිරීමේ සහ නැවත නිර්වචනය කිරීමේ අභියෝගාත්මක කාර්යයක් සැලසුම් අංශයට පැවරී තිබේ.

**සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයන්**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ එක් එක් අංශයට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සැලසුම් අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ. එමෙන්ම, සෑම වර්ෂයකම ආරම්භයේදී නියම කර ගනු ලබන භෞතික සහ මූල්‍ය ඉලක්කවලට අදාළව කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා සංයුක්ත ක්‍රමෝපායික සැලැස්ම සකස් කිරීම මෙන්ම එක් එක් අංශවල වාර්ෂික ක්‍රමෝපායික ක්‍රියාත්මක සැලසුම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම ද සැලසුම් අංශයේ වගකීම වේ. තවද, මෙම අංශය විසින් රේඛීය අමාත්‍යාංශයට කළමනාකරණ තොරතුරු සපයා දීම මෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩල කාර්ය මණ්ඩලයෙහි කාර්ය සාධනය ඇගයීම පිණිස ඇගයීම් තක්සේරුකරුවන්ට සහ අධ්‍යක්ෂ - පරිපාලන වෙත අදාළ කළමනාකරණ තොරතුරු සපයා දීම ද සිදු කරනු ලබයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශවල කාර්යයන්ට පහසුකම් සැලසීම පිණිස පහත සඳහන් උපක්‍රියාකාරකම් ද මෙම අංශයට පවරා තිබේ:

- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහ 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනතෙහි අනිවාර්ය අරමුණුවලට අනුකූලව ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.
- ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස් කිරීමට පහසුකම් සැලසීම.
- ව්‍යාපාර / කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම, කර්මාන්ත / ආර්ථිකය ආශ්‍රිත සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ ආදාළ ආංශික සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහායවීම.
- විදේශ අරමුදල් සැපයීම් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- දැනට පවතින, කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටුවලට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහභාගීත්වය ලබා දීම සහතික කිරීම සහ අවශ්‍ය විට ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.

**අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්**

i. සැලසුම් අංශය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2015 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

ii. කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් සකස් කරන ලදී.

iii. මෙම අංශය විසින් පහත සඳහන් රාජ්‍ය ආයතන වෙත සංඛ්‍යාලේඛනමය දත්ත සපයා දී ඇත:

- වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත
- ජාතික ගිණුම් ඇස්තමේන්තු සඳහා ජනසංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත

iv. භෞතික කාර්ය සාධනය සහ මූල්‍ය කාර්ය සාධනය යන දෙකම පිළිබඳව 2014 වර්ෂයේ 4 වැනි කාර්තුව සඳහා සහ 2015 වර්ෂයේ 1 වැනි, 2 වැනි සහ 3 වැනි කාර්තු සඳහා කාර්තුමය කාර්ය සාධන වාර්තා 4 ක් සකස් කරන ලදී.

v. අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, 2016 වර්ෂය සඳහා වන අයවැය විවාදයේ කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමාලෝචන වාර්තාවක් සකස් කරන ලදී.

2016 වර්ෂය සඳහා වන අයවැය විවාදයේ කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස වාර්තාවක් සම්පාදනය කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමාලෝචනය කෙරෙන වාර්තාවක් සකස් කර අමාත්‍යාංශයට භාර දෙන ලදී.

vi. ජනසංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද කර්මාන්ත වර්ගීකරණ අන්තර්ජාතික ප්‍රමිතියෙහි (ISIC) නව දැක්ම අනුව, කාර්මික සංවර්ධන මණ්ඩලයේ පසුගිය වර්ෂ තුනෙහි ප්‍රගති වාර්තා පදනම් කර ගෙන දැනට පැවති දත්ත සංචිතය යාවත්කාලීන කරන ලදී.

vii. අමාත්‍යාංශයෙහි ඉල්ලීම පරිදි, උතුරු හා නැගෙනහිර පළාත්වල දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සහ ක්‍රියාත්මක කිරීමට යෝජිත මධ්‍ය/දීර්ඝ කාලීන ව්‍යාපෘති පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සකස් කරන ලදී.

## 4.4 අලෙවි අංශය

දිවයින පුරා සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන් මෙන්ම ස්වයං රැකියාවල නියුතුවූවන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවි කිරීමට අදාළ ක්‍රියාකාරකම් ආවරණය කරන අලෙවි අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රබල බලවේගය වේ. මෙම අංශය මගින් ඉතාම වැදගත් පුද්ගලයා වන පාරිභෝගිකයාගේ සම්පූර්ණ තෘප්තිමත්භාවය ඇති වන පරිදි අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙන, දීර්ඝ කාලීන වෙළඳ සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම හරහා සේවා සපයා දෙයි.
කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ මුද්‍රණ සහ ප්‍රකාශන ඒකකය ද අලෙවි අංශයට අනුයුක්ත කර තිබේ.

**අලෙවි අංශයට පැවරී ඇති කාර්යයන්**

- කාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම / ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම.

- දිවයින පුරා සිටින, තෝරාගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් මෙන්ම ස්වයංරැකියාවල නියතු පුද්ගලයින් සඳහා ද ජාතික තිළිණ ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම
- ‘ලක්කම්’ සහ ‘ලක්නිපැයුම්’ අලෙවි මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම
- උපකොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම
- වාත්තුවැඩ, ලුහු ඉංජිනේරු, කම්මල් වැඩ සහ අනෙකුත් ලෝහ වාත්තු සහ ශිල්පීය කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අබලි ද්‍රව්‍ය සපයාදීම
- කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශකත්ව සේවා සැපයීම

**මෙම අංශය විසින් සපයනු ලබන අනෙකුත් සේවාවන් සහ සේවා ඒකක**

**‘ලක්නිපැයුම්’ සහ ‘ලක්කම්’ අලෙවි මධ්‍යස්ථාන -** දිවයිනපුරා සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සහ ස්වයං රැකියාවල නියුතුවූවන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය නගාසිටුවීමේ සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම අලෙවි මධ්‍යස්ථාන මගින් ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙනු ලබයි.

**උපකොන්ත්‍රාත් හුවමාරුව** - ලෝක බැංකු අරමුදල් යටතේ පිහිටුවන ලද, අලෙවි අංශය යටතේ ඇති උපකොන්ත්‍රාත් හුවමාරුව 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සැපයීමට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

**ලෝහ අබලි ව්‍යාපෘතිය -** කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් එහි අලෙවි අංශය මගින් යකඩ මිශ්‍ර සහ යකඩ මිශ්‍රනොවන ආදී ලෝහ අබලි සහ වෙනත් අදාළ ද්‍රව්‍ය ගිවිසගත් මුදලකට රාජ්‍ය ආයතන වෙතින් මිලදී ගනු ලබයි. මෙම ද්‍රව්‍ය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ලියාපදිංචි වී ඇති ලුහු ඉංජිනේරු කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලෙස විකුණනු ලබයි.

**ප්‍රදර්ශන -** කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීමෙන් අනතුරුව, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ යන කාණ්ඩ වලින් මුළු දිවයිනෙහිම විශිෂ්ඨ ව්‍යවසායකයින් තෝරා ගැනීම සඳහා ජාතික මට්ටමේ වාර්ෂික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන පවත්වනු ලැබේ. මෙම ප්‍රදර්ශන මගින් රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහ සුළු කර්මාන්ත ආරම්භ කිරීමට පහසුකම් සලසා දෙනු ලැබේ.

**වගුව 4.4.1 - අලෙවි අංශයේ කාර්යසාධනය – 2015**

| කාර්ය සාධනය | ලක්නිපැයුම් අලෙවි මධ්‍යස්ථානය | ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | උපකොන්ත්‍රාත් ලබාදීම | අබලි ලෝහ ව්‍යාපෘතිය | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|---|
| අලෙවි වටිනාකම (රු. මි.) | 0.0643 | 10.7 | 9.76 | 85.06 | 106.4 |
| ආදායම (රු. මි.) | 0.0132 | 2.116 | 0.487 | 20.55 | 23.16 |
| ඇණවුම් බෙදාහැරීම | | | 33 | | |
| මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.) | | | | 758 | |
| බෙදා හරින ලද ප්‍රමාණය (මෙ.ටො.) | | | | 776 | |
| පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව | | 40 | 19 | 726 | |



## 4.5 කාර්මික ජනපද අංශය

**සාමාන්‍ය**

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීමේදී විවිධ දිස්ත්‍රික්ක අතර සහ කොළඹ සහ අවට ප්‍රදේශ අතර ප්‍රමාණවත් කර්මාන්ත යටිතල පහසුකම් සපයාදීමේ විෂමතාවයන් පවතී. එම නිසා, ප්‍රාදේශීය වශයෙන් කාර්මික සංවර්ධනය වේගවත් කිරීම පිණිස සහ කාර්මික සංවර්ධන ක්‍රියාකාරකම් මුළු දිවයින පුරා ව්‍යාප්ත කිරීම පිණිස 1960 දශකයේදී කාර්මික ජනපද සංකල්පය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබෙන ප්‍රදේශවල, විශේෂයෙන්ම මනා කර්මාන්ත පරිසරයක පිහිටි ස්ථානවල ඉඩම් සහ ඉදිකර නිම කරන ලද ගොඩනැගිලි සපයා දෙමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම පිළිබඳ එහිදී ප්‍රධානතම අවධානය යොමු කරන ලදී.

එතැන් සිට පසු ගිය වසර හතලිස් පහක කාලය පුරා කාර්මික සංවර්ධන මණ්ඩලය කොළඹ සහ ඒ අවට ප්‍රදේශ කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබූ නමුත් මේ වන විට දිවයින පුරා කාර්මික ජනපද 19 ක් සංවර්ධනය කරමින් සැලකිය යුතු මට්ටමකින් කාර්මික සංවර්ධනය ග්‍රාමීය ප්‍රදේශවලට ද ව්‍යාප්ත කර තිබේ. කාර්මික සංවර්ධන මණ්ඩලය මෙම කාර්මික ජනපදවල කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සුදුසු ඉඩම් අවශ්‍ය යටිතල පහසුකම් ද සහිතව කර්මාන්තකරුවන්ට දීර්ඝ කාලීන බදු පදනම යටතේ සපයා දෙයි.

වැඩි වැඩියෙන් නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම පිණිස පවතින කාර්මික ජනපදවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පසුගිය වර්ෂ කිහිපය තුළදී තවදුරටත් කටයුතු කර තිබේ. ආයෝජකයින්ගේ ඉල්ලීම් ඉටු කර දීම සඳහා සහ මෙම කාර්මික ජනපදවල කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සුදුසු ඉඩම් කැබලි නිර්දේශ කිරීමට සහ සාදා නිමකළ ගොඩනැගිලි සපයා දීමට කාර්මික සංවර්ධන මණ්ඩලය එහි කාර්මික ජනපද අංශය සමග මණ්ඩලයේ අදාළ දිස්ත්‍රික් කාර්යාලවල අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ද සමග එක්ව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

1970 වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධනය කර ඇති සමස්ත ඉඩම් ප්‍රමාණය අක්කර 312 ක් පමණ වේ. එම ඉඩම් ප්‍රමාණය ඉඩම් කට්ටි 664 ට බෙදා වෙන් කර ඇති අතර දැනටමත් කර්මාන්තකරුවන් 363 දෙනෙකුට බෙදා දී තිබේ. එමෙන්ම, සංවර්ධනය කර කර්මාන්තකරුවන්ට බෙදා දී ඇති මුළු බිම් කොටස් ප්‍රමාණයෙන් 220 ක කර්මාන්ත ආරම්භ කර ඇති අතර ඒ හරහා නිර්මාණය වී ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව 6254 ක් වේ. තවත් කර්මාන්ත ඒකක 52 ක කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකරමින් විවිධ ඉදිකිරීම් අදියරවල පවතී. තවද, කුඩා කාර්මික ජනපදවල කර්මාන්ත ක්‍රියාත්මක නොකර, පදිංචි වී සිටීම සඳහා භාවිතා කරමින් තිබෙන කර්මාන්ත ඒකක 91 ක් අවලංගු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව තිබේ.

සාදා නිම කර ඇති ගොඩනැගිලි 80 ක් අතරින් ගොඩනැගිලි 60 ක් කර්මාන්තකරුවන්ට ලබා දී ඇති අතර, එමගින් රැකියා අවස්ථා 1591 ක් නිර්මාණය වී තිබේ. කාර්මික සංවර්ධන මණ්ඩලය 1970 වර්ෂය තුළදී මූලික වශයෙන් පහත සඳහන් කාර්මික ජනපද තුන ආරම්භ කරන ලදී:

| | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | ඒකල | ගම්පහ |
| 02 | පල්ලෙකැලේ | මහනුවර |
| 03 | අච්චුවේලි | යාපනය |

- වාර්ගික ගැටුම් හේතුවෙන් අච්චුවේලි කාර්මික ජනපදය සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. ශ්‍රී ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය වූ එහි යටිතල පහසුකම් නැවත ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය 2013/2014 වර්ෂවලදී එ.ජ. ඩොලර් මිලියන 50 ක මුදලක් සපයා දුන්නේය. ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් මෙම කාර්මික ජනපදය නැවත ඉදිකරන ලද අතර, එහි පහසුකම් සහ යටිතල ව්‍යුහය ද පිළිගත් මට්ටමකට දියුණු කරන ලදී. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි ඉන්දියානු රජය විසින් ද එ.ජ. ඩොලර් මිලියන 220 ක ප්‍රදානයක් සපයා දෙන ලදී. 2014 වර්ෂයේදී නැවත විවෘත කළ එය දැනට හොඳින් ක්‍රියාතමක වන අතර එහි කර්මාන්තකරුවන්ට ලබා දීම සඳහා තවත් බිම් කොටස් කිහිපයක් ඉතිරිව පවතී.
  - හොරණ සහ ලුණුවිල කාර්මික ජනපද පිළිවෙලින් කළුතර සහ පුත්තලම දිස්ත්‍රික්කවල පිහිටුවා ඇත.
  - කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි පන්නල කාර්මික ජනපදය 1980 වර්ෂයේදී ආරම්භ කරන ලදී.
  - "ඉසුරු උයන කාර්මික ජනපද වැඩසටහන සහ ග්‍රාමීය කාර්මික ජනපද වැඩසටහන" යටතේ 1990 වර්ෂයේදී කොටගල, වවුලුගල, ගලිගමුව, පුස්සැල්ල, කරන්දෙනිය, බද්දේගම, නෑගම්පහ, මිහින්තලේ, වවුනියාව, බෙලිඅත්ත, සහ බුත්තල යන කාර්මික ජනපද ආරම්භ කරන ලදී.
  - කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි පානළුව කාර්මික ජනපදය 2006 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

දිවයින පුරා පිහිටුවා ඇති කාර්මික ජනපද - පළාත් මට්ටමින්

| කාර්මික ජනපද | පළාත |
|---|---|
| ඒකල, හොරණ, වවුලුගල, සහ පානළුව | බස්නාහිර පළාත |
| පල්ලෙකැලේ, මාතලේ සහ කොටගල | මධ්‍යම පළාත |
| පන්නල සහ ලුණුවිල | වයඹ පළාත |
| ගලිගමුව සහ පුස්සැල්ල | සබරගමුව පළාත |
| කරන්දෙනිය, බද්දේගම සහ බෙලිඅත්ත | දකුණු පළාත |
| නෑගම්පහ සහ මිහින්තලේ | උතුරු මැද පළාත |
| වවුනියාව සහ අච්චුවේලි | උතුරු පළාත |
| බුත්තල | ඌව පළාත |

**කාර්මික ජනපද අංශයට පැවරී තිබෙන කාර්යයන්**

- කාර්මික ජනපද ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීම සඳහා වන මූලික සමීක්ෂණ සිදු කිරීම.
- අදාළ ආයතනවලින් අවශ්‍ය අරමුදල් සහ අනුමැතීන් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- යෝජිත හෝ පවතින කාර්මික ජනපදවල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- පුරප්පාඩු වී පවතින ඉඩම් සහ ගොඩනැගිලි සඳහා නව කර්මාන්තකරුවන් තෝරා ගැනීම.
- පවතින කාර්මික ජනපද නඩත්තු කිරීම.
- ඉඩම් වෙන්කර දීමේ ලිපි නිකුත් කිරීම සහ බදුකරුවන් සමග කල්බදු ගිවිසුම් අත්සන් කිරීම.
- කුලී අය කර ගැනීම සහ දෛනික නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම.
- එකඟ වී ඇති ගිවිසුම් කොන්දේසි කඩ කරන කර්මාන්තකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශ සහ අනෙකුත් ආයතන සමග එක්ව කර්මාන්තකරුවන් සඳහා සහාය සැපයීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශ විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ප්‍රදර්ශන, තරඟ සහ වැඩමුළු සඳහා දායක වීම.

රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් රුපියල් මිලියන 70 ට ආසන්න මුදලක් 2015 වර්ෂය තුළදී කාර්මික ජනපද අංශය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික ජනපද 19 අතරින් පහත සඳහන් කාර්මික ජනපදවල අභ්‍යන්තර මාර්ග සහ වැසි ජලය බැසයාමේ කාණු ආදී දැනට පවතින යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වැය කර ඇත.

ඒ සම්බන්ධ වැඩිදුර විස්තර පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | ක්‍රියාකාරකම | කාර්මික ජනපදයේ නම | මුදල (රු.) |
|---|---|---|---|
| 1 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම (අදියර-II) | ලුණුවිල | 2,005,000.00 |
| 2 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම (අදියර-III) | පල්ලෙකැලේ | 29,599,460.90 |
| 3 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම (අදියර-II) | ඒකල | 16,300,000.00 |
| 4 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | පානළුව | 15,000,000.00 |
| 5 | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | කලුදෑවල | 6,458,365.00 |
| **එකතුව** | | | **69,362,825.90** |

**කර්මාන්ත ඒකක සඳහා කර්මාන්තකරුවන් තෝරා ගැනීම**

දැනට කර්මාන්ත පිහිටුවා ඇති කර්මාන්තකරුවන් සහ අලුතින් ඉඩම් කොටස් / සාදා නිමා කර ඇති ගොඩනැගිලි ලබා ගැනීම සඳහා අයදුම් කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා ඔවුන්ගේ ප්‍රායෝගික හැකියාව සලකා බලා මෙම වර්ෂය තුළ කර්මාන්තකරුවන් 20 දෙනෙකු තෝරා ගන්නා ලදී.

**වෙන් කරන ලද කර්මාන්තශාලා ඒකක ගණන**

| අංකය | කාර්මික ජනපදය | කර්මාන්තකරුවාගේ නම | කර්මාන්තය | ආයෝජනය (රු. මි.) | රැකියා අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පල්ලෙකැලේ | සන්රයිස් ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම. | ගිණිපෙට්ටි | 66.8 | 126 |
| 02 | පල්ලෙකැලේ | නී ඉන්ඩස්ට්‍රීස් s | ඉන්ධන සඳහා බ්‍රිකට්ස් නිෂ්පාදනය (දර) | 10 | 29 |
| 03 | පල්ලෙකැලේ | උදිත බිල්ඩර්ස් | ලී බඩු | 41 | 75 |
| 04 | පල්ලෙකැලේ | සී.ස. ආරා ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම | ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන | 7.8 | 12 |
| 05 | ඒකල | ආනන්ද සරත් ලියනගේ | ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන | 18 | 26 |
| 06 | ඒකල | S.Q.A. ද ප්‍රනාන්දු | පොලිතින් බෑග් | 15.3 | 05 |
| 07 | ඒකල | සී.ස. යුනියන් නිට්ං ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම | ෆැබ්‍රික් එම්බ්‍රොයිඩර් | 68 | 50 |
| 08 | ඒකල | සී.ස. ස්පෙෂල්ටි කන්ස්ට්‍රක්ෂන් කෙමිකල් (පුද්) සමාගම. | ඉදිකිරීම් ආශ්‍රිත ආලේපන | 9.8 | 38 |
| 09 | ගලිගමුව | සී.ස. සුරෙන්කෝ නැචුරල් ප්‍රොඩක්ට්ස් (පුද්) සමාගම. | ඖෂධීය ශාක නිෂ්පාදන | 5.2 | 12 |
| 10 | ගලිගමුව | අච්චු ඉන්ඩස්ට්‍රීස් | උඳු පිටි සහ තල තෙල් | 29 | 15 |
| 11 | ගලිගමුව | දෙලූකා මැෂිනරි | ලී බඩු | 3.3 | 05 |
| 12 | ගලිගමුව | නිලන්ත රංජිත් | ලුහු ඉංජිනේරු | 4 | 09 |
| 13 | ලුණුවිල | ජී.එස්. ඔයිල් මිල් | සුදු පොල්තෙල් | 6.4 | 35 |
| 14 | ලුණුවිල | වීරක්කොඩි ෆයිබර් මිල්ස් | කොහු ආශ්‍රිත නිෂ්පාදන | 10.1 | 30 |
| 15 | පූණතෝට්ටම් | එස්. ජයකුමාර් | ගල් කැටයම් වැඩ | 1.1 | 15 |
| 16 | පානළුව | ස්කැන්ටෙක් සොලියුෂන් | පෙර සැකසුම් | 5 | 19 |
| 17 | පානළුව | සිරිසඳ ටිම්බර් ප්‍රොඩක්ට්ස් | දැව | 7.8 | 15 |
| 18 | පුස්සැල්ල | හාට්ලන්ඩ් ෆුඩ් ප්‍රොඩක්ට්ස් | ආහාර ආශ්‍රිත නිෂ්පාදන | 13.6 | 55 |
| 19 | පුස්සැල්ල | සූරි ලංකා එන්ටර්ප්‍රයිසස් | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන | 4.1 | 12 |
| 20 | හොරණ | ඉලාස්ටොමෙරික් ඉංජිනියරිං | ප්ලාස්ටික් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන | 159 | 75 |
| 21 | අච්චුවේලි | නොබෙල් ප්‍රින්ටර්ස් | ඉවතලන කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය | 129 | 83 |
| 22 | අච්චුවේලි | සාරා ඉන්ඩස්ට්‍රීස් | ලුහු ඉංජිනේරු | 200 | 60 |
| 23 | අච්චුවේලි | සන්ටෙක් ඉංජිනියර්ස් | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන | 6.4 | 12 |
| | **එකතුව** | | | **830.5** | **869** |

### කාර්මික ජනපදවල ව්‍යාපාර නියමිත කාලයට ආරම්භවීම අධීක්ෂණය කිරීම

| අංකය | කාර්මික ජනපදය | කර්මාන්තකරුවාගේ නම | කර්මාන්තය | ආයෝජනය (රු. මි.) | රැකියා අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | වවුනියාව | එස්. ජයකුමාර් | ගල් කැටයම් වැඩ | 17 | 10 |
| 02 | අච්චුවේලි | යුනියන් එන්ටර්ප්‍රයිසස් | පී.වී.සී. පයිප්ප සහ බට | 168 | 150 |
| 03 | ගලිගමුව | සුරෙන්කො නැචුරල් ප්‍රොඩක්ට්ස් | ඖෂධීය පැලෑටි නිෂ්පාදන | 5.1 | 8 |
| 04 | ගලිගමුව | අච්චු ඉන්ඩස්ට්‍රීස් | උඳු පිටි සහ තල තෙල් | 2.9 | 15 |
| 05 | පානළුව | සීමාසහිත ස්කෑන්ටෙක් සොල්‍යූෂන් (පුද්) සමාගම. | පෙරසැකසුම් ද්‍රව්‍ය | 5.0 | 19 |
| 06 | පානළුව | සිනිසඳ ටිම්බර් ප්‍රින්ට්ස් | දැව ආශ්‍රිත නිෂ්පාදන | 7.8 | 05 |
| 07 | ඒකල | සීමාසහිත සිලෝන් ටේප්ස් (පුද්) සමාගම | ඇසුරුම් ද්‍රව්‍ය | 15.3 | 05 |
| 08 | පල්ලෙකැලේ | කේශර මිනරල් | ස්කිම් කෝට් | 8.1 | 22 |
| 09 | කොටගල | ශ්‍රී ඇක්වා මිනරල් | ඛණිජ ජලය | 3.18 | 9 |
| 10 | ලුණුවිල | ජී.එස්. ඔයිල් මිල්ස් | සුදු පොල්තෙල් | 6.4 | 33 |
| 11 | ලුණුවිල | වීරක්කොඩි ෆයිබර් මිල්ස් | කොහු ආශ්‍රිත නිෂ්පාදන | 10.1 | 30 |
| 12 | අච්චුවේලි | එවර්ෂයින් අමානා රූෆිං | සෙවිලි තහඩු | 263 | 75 |
| 13 | අච්චුවේලි | සාරා ඉන්ඩස්ට්‍රීස් | ලුහු ඉංජිනේරු | 60 | 60 |
| 14 | අච්චුවේලි | සන්ටෙක් ඉංජිනියරිං | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන | 6.4 | 17 |
| | **එකතුව** | **13** | **13** | **578.28** | **453** |

#### කල්බදු ගිවිසුම් අත්සන් කිරීම

ඉඩම් සහ ඉදිකර නිමා කර ඇති ගොඩනැගිලි සඳහා පිළිවෙලින් අවුරුදු 30 ක් සහ 20 ක් වශයෙන් සාර්ථකව ව්‍යාපාර කටයුතු සිදු කර ඇති කර්මාන්තකරුවන් සමග අදාළ ඉඩම් සහ ගොඩනැගිලි සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව 2015 වර්ෂය තුළදී එම කර්මාන්තකරුවන් සමග කල්බදු ගිවිසුම් 13 ක් අත්සන් කරන ලදී.

#### කුලී ආදායම අයකර ගැනීම

කල්බදු දෙන ලද ඉඩම් සහ ගොඩනැගිලිවල මාසික / වාර්ෂික කුලීය සහ වෙනත් ආදායම් වශයෙන් මෙම වර්ෂය තුළ අය කර ගත් මුදල රු. මි. 54.8 ක් වූ අතර එය බදුකරුවන්ගෙන් ලබාගත් මුළු ඉන්වොයිස්ගත ආදායමෙන් 90% ට ආසන්න ප්‍රමාණයක් විය. බදුගැනුම්කරුවන් සමග බදු ගිවිසුම් අත්සන් කරන විට ඔවුන්ගෙන් ආපසු ගෙවනු ලබන වර්ෂ තුනක තැන්පතුවක් ලෙස අයකරගත් මුදල වෙනුවෙන් චක්‍රීය අරමුදලක් පවත්වාගෙන යනු ලබන අතර, 2015 වර්ෂය අවසානය වන විට එම චක්‍රීය අරමුදලෙහි සමුච්චිත අගය රුපියල් මිලියන 5.3 ක් විය.

# කාර්මික ජනපද ව්‍යාප්තිය



## 4.6 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

### 4.6.1 සාමාන්‍ය

දේශීය රබර් ආශ්‍රිත කර්මාන්ත සඳහා, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සහාය ලබාදීම පිණිස ලෝක බැංකුවේ මග පෙන්වීම සහ මූල්‍ය අනුග්‍රහය යටතේ 1980 වර්ෂයේදී රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය පැලියගොඩ පිහිටුවන ලදී. එතැන් සිට මෙම මධ්‍යස්ථානය මගින් දේශීය රබර් නිෂ්පාදන කර්මාන්තකරුවන්ට පහත සඳහන් ක්ෂේත්‍රවල සේවා සපයාදී ඇත:

- තාක්ෂණ උපදේශකත්ව සහ ව්‍යාප්ති සේවා
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය
- පරීක්ෂණ සහ තත්ත්ව සහතික කිරීම
- අර්ධ-වාණිජමය සේවා සැපයීම
- නව වෙළඳපොළ අවශ්‍යතාවලට හැඩගැසීම
- අධ්‍යයන සහ පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ පොදුවේ කර්මාන්තය අතර සම්බන්ධකයක් ලෙස කටයුතු කිරීම

**මෙම අංශයෙහි 2015 වර්ෂයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ:**

**මධ්‍යස්ථානය විසින් සපයා දී ඇති සේවා වර්ග:**

| අංකය | සේවා | මිනුම් දර්ශකය | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම | සංඛ්‍යාව | 18 |
| 2 | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සකස් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම | සංඛ්‍යාව | 01 |
| 3 | උප කොන්ත්‍රාත් අවස්ථා පහසුකම් සැලසීම | සංඛ්‍යාව | 21 |
| 4 | නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ සහ සහතික කිරීම් සපයාදීම<br>1. නිකුත් කරන ලද සහතික සංඛ්‍යාව<br>2. පරීක්ෂා කරන ලද නිෂ්පාදන සාම්පල සංඛ්‍යාව | <br>සංඛ්‍යාව<br>සංඛ්‍යාව | <br>214<br>1,513 |
| 5 | කේන්ද්‍රඅපසාරික රබර් කිරි සැපයීම | ලීටර් | 9,952 |
| 6 | රබර් සංයෝග පිරිසැකසුම් කිරීම සහ සැපයීම | කි.ග්‍රෑ. | 35,366 |
| 7 | රබර් සංයෝග ඇඹරීම | කි.ග්‍රෑ. | 17,359 |
| 8 | රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සහාය ලබා දීම | සංඛ්‍යාව | 22 |
| 9 | රබර් භාණ්ඩ අභ්‍යන්තර වශයෙන් නිෂ්පාදනය | සංඛ්‍යාව | 01 |

**නිෂ්පාදනය සහ අලෙවිය – 2015**

| අංකය | විස්තරය | ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|
| 1 | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම | 18 | 49,500 |
| 2 | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සකස් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම | 01 | 35,000 |
| 3 | උප කොන්ත්‍රාත් අවස්ථා පහසුකම් සැලසීම | 21 | 1,462,076 |
| 4 | නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ සහ සහතික කිරීම් සපයාදීම<br>1. නිකුත් කරන ලද සහතික සංඛ්‍යාව<br>2. පරීක්ෂා කරන ලද නිෂ්පාදන සාම්පල සංඛ්‍යාව | 214<br>1,513 | 985,367 |
| 5 | කේන්ද්‍රඅපසාරික රබර් කිරි සැපයීම | **ලීටර්** 9,952 | 2,708,510 |
| 6 | රබර් සංයෝග පිරිසැකසුම් කිරීම සහ සැපයීම | **කි.ග්‍රෑ.** 35,366 | 16,618,525 |
| 7 | රබර් සංයෝග ඇඹරීම | **කි.ග්‍රෑ.** 17,359 | 306,344 |
| 8 | රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සහාය ලබා දීම | 22 | 264,175 |
| 9 | රබර් භාණ්ඩ අභ්‍යන්තර වශයෙන් නිෂ්පාදනය | 01 | 34,000 |
| | **එකතුව** | | **22,463,497** |

**මධ්‍යස්ථානය විසින් ඉටු කරන ලද විශේෂ කාර්යයන්:**

**ප්‍රධාන නිෂ්පාදන සංවර්ධන ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිෂ්පාදන සඳහා සංයෝග සකස් කිරීමේ සහ පිරිසැකසුම් තාක්ෂණ සකස් කර කර්මාන්තකරුවන් වෙත ලබා දී ඇත:

1. කඩවත, මඩදොලවත්ත, එස්.ඒ.පී. ඉන්ඩස්ට්‍රීස් සඳහා මෝටර් සම්බන්ධක සහ ටෝර්ක් ආම් බුෂ්
2. කොළඹ ඇක්සෙස් ඉංජිනියරිං සඳහා ද්විත්ත සීල් සංයෝග
3. කඳුබොඩ, දෙල්ගොඩ, ලාල් ඉංජිනියරිං සඳහා ජෙනරේටර් මවුන්ට්
4. වත්තල, හැඳල, ඇටම්පොල පාර, සරත් එන්ටර්ප්‍රයිසස් සඳහා ඩෝ(ර්) ගේට් සීල්
5. දොම්පෙ, පාලුගම රොටරි සීල් ආයතනය සඳහා සකර් මවුන්ට්

උපකොන්ත්‍රාත් අවස්ථා සඳහා පහත සඳහන් රබර් සංයෝග සැලසුම් කර සකස් කරන ලදී

1. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා “D” බීඩිං
2. ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය සඳහා රබර් රෝලර්
3. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා පිලෝ බෙයරිං
4. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා වැක්‍යුම් හෝස්
5. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා මවුන්ටිං ෂූස්

## 4.7 ඉංජිනේරු අංශය

### 4.7.1 සාමාන්‍ය

ඉංජිනේරු අංශයෙහි විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ:

(අ). කටුබැද්ද ප්‍රධාන කාර්යාලය - ඉංජිනේරු වැඩපොළ, වාත්තු වැඩපොළ, ඉංජිනේරු කාර්යාලය (තාක්ෂණික තොරතුරු සහ උපදේශකත්ව සේවා, සහ තක්සේරු වාර්තා ආදිය සඳහා), සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු යන අංශ මෙයට අයත් වේ.

(ආ). විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පෑලියගොඩ

(ඇ). යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - පන්නල

(ඈ). පොදු සේවා මධ්‍යස්ථානය - මාතර

(ඉ). පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය - පමුණුව

### 4.7.2 මෙම අංශය විසින් ඉටුකරන ලද ක්‍රියාකාරකම්

2015 වර්ෂය තුළදී ඉංජිනේරු අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ:

(අ). දැනට සිටින කර්මාන්තකරුවන්ට සහ නව කර්මාන්තකරුවන්ට / අනාගත කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර තෝරා ගැනීමේදී, සැලසුම් කිරීමේදී / සංවර්ධනය කිරීමේදී සහාය ලබාදීම සහ තාක්ෂණය / ක්‍රියාවලි පිළිබඳ දැනුම ලබාදීම.

(ආ). ඇණවුම් මත කර්මාන්තකරුවන්ට පිරිසැකසුම්, වාත්තු කිරීම්, සහ ලෝහ නිමා කිරීම් සේවා සැපයීම.

(ඇ). මණ්ඩලය වෙත සිවිල් සහ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රවල අභ්‍යන්තර අළුත්වැඩියා, නඩත්තු, ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම් සැලසුම්කරණ හා අධීක්ෂණ සහාය සපයාදීම. මණ්ඩලයේ වාහන නඩත්තු අවශ්‍යතාවලදී තාක්ෂණික සහ අධීක්ෂණ සහාය ලබාදීම.

(ඈ). සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රදර්ශන සහ ව්‍යාපෘති සඳහා සිවිල් සහ විදුලි ඉංජිනේරු උපකාරක සේවා සැපයීම.

(ඉ). යන්ත්‍රෝපකරණ තක්සේරු වාර්තා සැපයීම, වාත්තු වැඩ අංශය සඳහා විද්‍යාගාර පරීක්ෂණ සේවා සැපයීම මෙන්ම කලින් නිෂ්පාදනය කරන ලද යන්ත්‍රෝපකරණ සහ මෙවලම් පිරිසැකසීම සහ අලෙවිය මෙම අංශය විසින් ඉටුකරන ලද අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.

(ඊ). කර්මාන්ත සඳහා පිරිමැසුම් සහිත සහ යෝග්‍ය යන්ත්‍රසූත්‍ර මූලාකෘතික සකස් කිරීම.

### 4.7.3 2015 වර්ෂයේ කාර්යසාධනය

**(I) ගාස්තු අයකරන සේවා, තක්සේරු, වාත්තුවැඩ/විද්‍යුත්ලෝහාලේපන විද්‍යාගාර සේවා, මෙවලම් විකිණීම සහ විවිධ අයිතම මගින් ලැබුණු ආදායම**

විවිධ අංශ සහ මධ්‍යස්ථාන විසින් 2015 වර්ෂය තුළ ඉටු කරන ලද බාහිර සේවා මගින් උපයාගත් ආදායම පහත වගුවේ දක්වා ඇත. මෙම දත්ත 2015 වර්ෂය අවසාන වන දිනට අදාළ වන පරිදි ඉදිරිපත් කර ඇති අතර එයට වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු අයත් නොවේ.

වගුව: 2015 **වර්ෂයේදී ඉටුකරන ලද සේවාවන් සඳහා බාහිරින් උපයාගත් ආදායම**

| | **අංශය** | **දළ ආදායම (රු.) (වැට් සහ ජා.ගො.බ. හැර)** |
|---|---|---|
| 1 | ඉංජිනේරු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද | 4,228,540 |
| 2. | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 350,149 |
| 3. | තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය | 1,073,087 |
| 5. | යෝ.තා.ප.සං.ම. - පන්නල | 4,800,111 |
| 6. | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පැලියගොඩ | 1,893,797 |
| 7. | පොදු සේවා මධ්‍යස්ථානය - මාතර | 794,274 |
| 8. | පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය | 677,749 |
| | **එකතුව** | **13,817,707** |

**(II) අභ්‍යන්තර සේවා**

විවිධ අංශ මගින් සපයා දෙන ලද අභ්‍යන්තර ඉංජිනේරු සේවා වැඩවල වටිනාකම (සේවා පිරිවැය පදනමින්) පහත සඳහන් පරිදි වේ :

| | **අංශය** | සපයා දෙන ලද අභ්‍යන්තර සේවාවල වටිනාකම (රු.) |
|---|---|---|
| 1 | කම්හල - ප්‍රධාන කාර්යාලය | 282,250 |
| 2 | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 1,071,243 |
| 3 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 1,599,142 |
| 4 | විදුලි ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 223,813 |
| | ඉහත අංශවලින් සැපයූ අභ්‍යන්තර සේවාවල මුළු වටිනාකම | **3,176,448** |

**(III) උපදේශක / ව්‍යාප්ති සේවා:**

**උපදේශක සේවා**

2015 වර්ෂයේදී කර්මාන්තකරුවන් වෙත නිර්මාණ සහ පිරිසැකසුම් කිරීම පිළිබඳ තාක්ෂණික / ක්‍රියාවලි තොරතුරු සහ උපදෙස් ලබාදෙමින් උපදේශක සේවා 60 ක් සපයා දී ඇත. ඒ අතරින් 06 ක් යෝ.තා.ප.සං.ම. මගින්ද, 14 ක් විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය මගින්ද, ඉතිරි 40 ප්‍රධාන කාර්යලය මගින් ද සපයා දී ඇත.

## (IV) යන්ත්‍රසූත්‍ර / උපකරණ / ක්‍රියාවලි සංවර්ධනය

*2015 වර්ෂයේදී පහත සඳහන් යන්ත්‍රසූත්‍ර / උපකරණ නිර්මාණය කර ඇත.*

අලුතින් නිර්මාණය කරන ලද ජංගම මැටි සැකසුම් යන්ත්‍රය සහ පොලිතින් අපද්‍රව්‍ය සම්පිණ්ඩනය කර මිටි බැඳිමේ යන්ත්‍රය වැනි යන්ත්‍ර සැකසීම. අවශ්‍ය කරන ඉංජිනේරුවරුන් (MM ශ්‍රේණය) සහ බිම් මට්ටමේ පුහුණු කාර්ය මණ්ඩල නොසිටීම නිසා ප්‍රධාන කාර්යාලයෙහි උපකරණ නිර්මාණය කර නැත.

## 4.8 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය

ජේෂකර්ම සහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 1989 දෙසැම්බර් 15 වැනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවක් මගින් ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ඇති විශේෂ පුහුණු අංශයක් ලෙස පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය පුහුණු අංශය, පුස්තකාලය සහ තොරතුරු කුටිය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ මුද්‍රණ අංශය යන අංශ හතරෙන් සමන්විත වේ.

කළමනාකරණ කුසලතා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව රට පුරා සිටින ව්‍යවසායකයින්ට විවිධ පුහුණු සපයාදීම පුහුණු ඒකකයේ ප්‍රධාන කාර්ය භාරය වේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩිදියුණු කරමින් ඒවා ප්‍රවර්ධනය කර සංවර්ධනය කිරීම පිණිස පුස්තකාල සහ තොරතුරු ඒකකය මගින් පුස්තකාල පහසුකම් සහ කාර්මික තොරතුරු සපයා දෙනු ලැබේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ඒකකය මණ්ඩලය ඇතුළත ජාලගත සහ තොරතුරු පහසුකම් සපයා දෙමින් වෙබ් අඩවිය සංවර්ධනය කරයි. මුද්‍රණ ඒකකය විසින් වාර්තා, අත්පොත්, අත්පත්‍රිකා ආදිය ඇතුළත්ව අවශ්‍ය සියලුම ලිපි ලේඛන මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

**ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානයෙහි අරමුණු:**

- නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම
- පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වාදීම
- පුහුණුලාභීන් පුහුණු කිරීම (ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශකත්වය)
- දේශීය කර්මාන්තකරුවන්ට තාක්ෂණික දැනුම සහ ව්‍යාපාරික අත්දැකීම් සපයාදීම.
- කාලීන වශයෙන් වැදගත් වන ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් දැනුවත් කිරීම
- උපදේශණ සේවා සහ කාර්මික තොරතුරු සපයාදීම

**ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන්:**

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ව්‍යවසායකයින් සඳහා වාණිජ සහ ව්‍යාපාරික පුහුණුව ලබාදීම
- ක.ස.ම. තුළ එස් 5 වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- අන්තර්ජාල සහ ඊමේල් පහසුකම් සපයාදීම
- ප්‍රකාශණ අලෙවිකිරීම
- පුස්තකාල පොත්පත් එකතුව වැඩිදියුණු කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්)
- පුස්කාල පොත් පත් ක්‍රියාවලිගත කිරීම
- කාර්මික තොරතුරු සංවිධානය කිරීම
- කා.සං.ම. සේවාදායකයින් අන්තර්ජාලගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි කිරීම
- අන්තර්ජාලගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි සේවාදායකයින් පිළිබඳ විස්තර ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදීම.
- කර්මාන්තකරුවන්, සේවාදායකයින් සහ කා.සං.ම. කාර්යමණ්ඩලය වෙත කර්මාන්ත තොරතුරු ලබා දීම.
- පුස්තකාලය වෙත අලුතින් ලබාගෙන ඇති පොතපත පිළිබඳ තොරතුරු බෙදාහැරීම
- ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත, දේශීය යන්ත්‍රසූත්‍ර සහ භාණ්ඩ නිෂ්පාදකයින්, වාර්තා, ශ්‍රී ලංකා ප්‍රමිතීන්, උපකාරක ආයතන, සහ පනත් එකතුව පිළිබඳ දත්ත සංචිත පවත්වාගෙනයාම සහ යාවත්කාලීන
- දේශීය සහ විදේශීය යන්ත්‍රසූත්‍ර පිළිබඳ තොරතුරු සපයාදීම
- ක.සං.ම. පුවත් සඟරාව සකස් කිරීම
- අත්පොත්, පැකේජ, අත්පත්‍රිකා, සුචිපත්‍ර සහ පත්‍රිකා ආදී ප්‍රකාශන සම්පාදනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- විමසීම් සහ පිළිතුරු සේවාව
- විශේෂඥ උපදෙස් සඳහා යොමු කිරීම් සේවාව
- ප්‍රදර්ශන, සංසද සහ වැඩමුළු ආදිය සඳහා සහභාගීවීම සහ පුස්තකාල එකතුව යාවත්කාලීන කිරීම සඳහා නවතම තොරතුරු එක්රැස් කිරීම

## 2015 වර්ෂයේ කාර්යසාධනය

| **ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා ඉටුකළ ක්‍රියාකාරකම්** | **මිනුම් දර්ශකය** | **ලබාගත් ප්‍රගතිය** | **ආදායම (රු.)** |
|---|---|---|---|
| ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 07 | 308,480 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 140 | |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 160 | |
| විෂයමාලා සංවර්ධනයකිරීම | විෂයමාලා සංඛ්‍යාව | 07 | - |
| වෙළඳ සහ තාක්ෂණික පුහුණුව සපයාදීම | වැඩසටහන් සංඛ්‍යාව | 08 | 753,700 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 160 | |
| උපදේශණය සහ උපදේශකත්ව සේවා | සපයාදෙන ලද සේවා සංඛ්‍යාව | 70 | - |
| පුස්තකාල එකතුව සංවර්ධන කිරීම | පුස්තකාල කියවීම් ද්‍රව්‍ය සංඛ්‍යාව | 1,077 | |
| **දත්ත සංචිත පවත්වාගෙනයාම**<br><br>**අන්තර්ජාලය හරහා ලියාපදිංචිවී ඇති සේවාදායකයින්**<br><br>ගොඩනැගිලි ද්‍රව්‍ය 102<br>ආහාර පාන 1,037<br>තෙල් සහ කෙඳි 207<br>රසායනික ද්‍රව්‍ය 573<br>වෙනත් 105 | 2015.12.31 දිනට අන්තර්ජාලයේ ලියාපදිංචිවී සිටින මුළු සේවාදායකයින් සංඛ්‍යාව | 7,170 | |
| දේශීය යන්ත්‍රසූත්‍ර නිෂ්පාදකයින්<br>භාණ්ඩ නිෂ්පාදකයින්<br>ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත<br>ලෝටස් ස්මාට් ස්යිට් ප්‍රවේශය<br>වාර්තා<br>උපකාරක ආයතන<br>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>පනත් | වාර්තා ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන<br>ආයතන ගනණ<br>ප්‍රකාශන ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන | 250<br>1,000<br>20,503<br>20,465<br>5477<br>330<br>1,325<br>1,599 | |

| අනු අංකය | ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා ඉටුකළ ක්‍රියාකාරකම් | මිනුම් දර්ශකය | ලබාගත් ප්‍රගතිය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| G11 | **කර්මාන්ත තොරතුරු ප්‍රචාරණය** | | | 324,027 |
| | උපදේශණ සේවා | සේවාදායකයින් සංඛ්‍යාව | 1,604 | |
| | විමසුම් සහ පිළිතුරු සේවාව | විමසුම් සංඛ්‍යාව | 682 | |
| | කාර්මික සංවර්ධන මණ්ඩලය පිළිබඳ ප්‍රචාරණය ලබා දීම පිණිස අත්පත්‍රිකා බෙදා හැරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) | පත්‍රිකා සංඛ්‍යාව | 4,500 | |
| | **නිෂ්පාදන ගොනු සකස් කිරීම** | නිෂ්පාදන ගොනු සංඛ්‍යාව | 03 | |
| | ආහාර රසකාරක සහ කල්තබා ගැනීමේ ද්‍රව්‍ය<br>ආහාර නියාමන<br>නැවුම් පළතුරු සහ එළවළු පිරිසැකසුම් කිරීම | | | |
| | **ප්‍රකාශන සම්පාදනය කිරීම** | | | |
| | අලුතින් ලබා ගත් පොත්පත් | අලුතින් ලබා ගත් පොත්පත් සංඛ්‍යාව | 12 | |
| | ප්‍රවෘත්ති සඟරා | ප්‍රවෘත්ති සඟරා සංඛ්‍යාව | 04 | |
| | පුස්තකාල මාර්ගෝපදේශ සංග්‍රහය | පොත් සංඛ්‍යාව | 01 | |
| | සාර්ථක ව්‍යාපාරයක් ගොඩනගමු | ප්‍රකාශන සංඛ්‍යාව | 01 | |
| | **කර්මාන්ත තොරතුරු ලබාගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩල වෙබ්අඩවිය හරහා විද්‍යුත් ප්‍රචාරණය** | | | |
| | පුස්තකාල පොත්, පටුන පිටු, | පටුන පිටු සංඛ්‍යාව | 317 | |
| | කර්මාන්ත තොරතුරු | ලිපිලේඛන සංඛ්‍යාව | 13 | |
| | **වෙබ් පිටු නිර්මාණය කිරීම සහ යාවත්කාලීන කිරීම** | | | |
| | නව වෙබ් පිටු | පිටු සංඛ්‍යාව | 50 | |
| | වෙබ් පිටු යාවත්කාලීන කිරීම | පිටු සංඛ්‍යාව | 137 | |



මිනිස්බල සහ රැකීරක්ෂා
දෙපාර්තමේන්තුවට අනුයුක්ත
නිලධාරීන්ට ව්‍යවසායකත්ව
සංවර්ධන සහ උපදේශකත්ව සේවා
මධ්‍යස්ථානය විසින් පුහුණුව ලබා දීම



2015 වර්ෂයේදී මැදිගිරිය මූලික
රෝහලේ පැවති ඵලදායීතා ප්‍රවර්ධන
වැඩසටහනෙහි අවස්ථාවක්



මහවැලි ප්‍රදේශයක් වන බකමූණ
ප්‍රදේශයේ 2015 වර්ෂයේදී පවත්වන
ලද ගොඩනැගිලි ඉදිකිරීම් පුහුණු
වැඩසටහනෙහි අවස්ථාවක්

## 4.9 තාක්ෂණ සේවා අංශය

**සාමාන්‍ය**

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රජාවේ තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරා දීමට කටයුතු කරන තාක්ෂණික සේවා අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන අංශ වලින් එකක් වේ. ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර පිළිබඳ සංකල්පයෙහි සිට සැලසුම් සකස් කිරීම හරහා ක්‍රියාත්මක කිරීම දක්වාත්, පවතින ව්‍යාපාර පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම සහ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහාත් අවශ්‍ය කරන තාක්ෂණ සහාය සපයාදීම තාක්ෂණ සේවා අංශයේ මූලික අරමුණ වේ. තාක්ෂණ සේවා අංශය මගින් සපයනු ලබන සේවාවන් ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන උප අංශ පහ හරහා සපයනු ලබයි. තාක්ෂණ සහාය සපයාදීම ප්‍රධාන වශයෙන්ම හොඳින් සැලසුම්කළ ප්‍රායෝගික අංගයක් ද සහිත එක් දින තාක්ෂණය සපයාදීමේ වැඩමුළු හරහා සිදු කරනු ලැබේ. එයට අමතරව, මෑතකදී ආරම්භ කරන ලද කර්මාන්ත විද්‍යාපීඨය මගින් ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර ආවරණය වන සහතිකපත්‍ර පාඨමාලා ගණනාවක් පවත්වනු ලැබේ.

**කාර්යසාධන ජයග්‍රහණ**

**තාක්ෂණ සේවා අංශය විසින් 2015 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කර තිබේ:**

### (1) කර්මාන්ත පුහුණු වැඩසටහන් සහ තාක්ෂණ නිරූපණය කිරීම් සහ වැඩමුළු

- තාක්ෂණය ලබාදීමේ වැඩමුළු

තාක්ෂණ සේවා අංශයේ කාර්ය මණ්ඩලය විසින් කර්මාන්ත විශේෂඥයින් සහ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල සමග එක්ව තාක්ෂණ සේවා අංශයෙහිදී ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඛණිජ යන උප අංශ යටතේ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු 115 ක් සහ නිරූණය කිරීම් 39 ක් පවත්වන ලද අතර එම වැඩමුළු හා නිදර්ශණය කිරීම් හරහා සමස්තයක් ලෙස ව්‍යවසායකයින් සහ කර්මාන්තකරුවන් 2093 දෙනෙකුට පුහුණුව සහ සහාය ලබාදෙමින් රු. 4,519,170/- ක මුදලක් උපයාගෙන ඇත.

තාක්ෂණ සේවා අංශය විසින් 2015 වර්ෂය තුළදී තාක්ෂණය ලබා දීමේ වැඩමුළු / නිරූපණය කිරීම් හරහා පහත සඳහන් තාක්ෂණයන් ලබා දී ඇත

**ආහාර**

- නැවුම් පළතුරු බීම
- එළවළු සහ පළතුරු ටින් කිරීම සහ බෝතල් කිරීම
- ක්ෂණික පළතුරු බීම සහ කෝඩියල්
- පපඩම්
- රටකජු, කිරි සහ පොල් ටොෆි
- අච්චාරු, චට්නි සහ මාළු ඇඹුල්තියල්
- පොල් මද නිෂ්පාදන
- චිලි පේස්ට් සහ උම්බලකඩ සම්බෝල
- තක්කලි සෝස් සහ මිරිස් සෝස්
- හතු වගාව
- ටාර්ට් වර්ග, පැටිස් සහ පේස්ට්‍රි
- කුකීස් සහ ඩෝනට්ස් නිෂ්පාදනය
- විජලනය කළ එළවළු
- ජෙලි ක්‍රිස්ටල්ස්, ජෙලි කප්, සහ කස්ටඩ් පුඩිං
- ඉඟුරු දෝසි, අල දෝසි, තල දෝසි සහ පුහුල් දෝසි
- දෙහි චට්නි, දෙහි සෝස්, දෙහි අච්චාරු සහ ක්ෂණික ලුණුදෙහි
- යෝගට්
- යෝගට් පානය සහ මුදවාපු කිරි
- ඖෂධීය සහ රසගැන්වූ තේ
- අතින් සාදනු ලබන චොකලට්
- පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන
- සෝයා ආශ්‍රිත නිෂ්පාදන
- තල ආශ්‍රිත නිෂ්පාදන
- කුළු බඩු පිරිසැකසුම් තාක්ෂණය
- බේකරි නිෂ්පාදන
- බයිට් සහ මිශ්‍ර බයිට් වර්ග
- අයිස් පැකට්
- අයිස් ක්‍රීම් සහ පොප්සිකල්
- ආහාර ඇසුරුම් කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය
- විසිතුරු මත්ස්‍ය වගාව
- ජුජුබ්ස්, මාෂ්මෙලෝස් සහ කිසස්
- වට්ටක්කා කල්තබා ගැනීම, තල බෝල සහ තල කැරලි නිෂ්පානය

**තෙල් සහ කෙඳි:**

- රෙදි සෝදන සබන්
- ස්ක්‍රීන් ප්‍රින්ටිං
- කොසු සහ ඉදල්
- පිරිසිදු පොල්තෙල්
- අභ්‍යාස පොත් සහ ලියුම් කවර

**ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඛණිජ:**

- ෆයිබර්ග්ලාස් සවිගන්වන ලද ප්ලාස්ටික තාක්ෂණය
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- සිමෙන්ති මගින් ස්ථායී කළ මැටි බ්ලොක් ගල්
- සිමෙන්ති මල්පෝච්චි
- කොන්ක්‍රීට් බිම් ගඩොල්
- භූ දර්ශනය කිරීම සහ ගෙවතු අලංකරණය

**රසායනික ද්‍රව්‍ය:**

- බැටරි වතුර, බැටරි ඇසිඩ් සහ රේඩියේටර් කූලන්ට්
- මැලියම්
- ඉටිපන්දම් සහ විසිතුරු ඉටිපන්දම්
- හඳුන්කූරු
- මෝටර් වාහන සේදුම්කාරක ද්‍රව්‍ය
- ගෙදරදොර පිරිසිදු කාරක ද්‍රව්‍ය
- තිනර් සහ ටර්පන්ටයින්

**පරිගණක තාක්ෂණය:**

- පරිගණක දෘඩාංග සහ ජාලගත කිරීම

**(2) දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

"ලෝක කාන්තා දිනය" හා සමගාමීව පහත සඳහන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් දෙක පවත්වන ලදී.

(i) මහජන බැංකුවේ ඉල්ලීම පරිදි 2015 මාර්තු මස 08 වැනි දින මහජන බැංකුවේ රත්මලාන ශාඛාවේදී සහභාගීවන්නන් 76 දෙනෙකු සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

(ii) බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2015 මාර්තු මස 24 වැනි දින සහභාගීවන්නන් 48 දෙනෙකු සඳහා තවත් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

**(3) ප්‍රචාරණ වැඩසටහන**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය සහ ව්‍යවසායකත්ව සංවර්ධන හා උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය එක්ව කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම පිණිස සපයා දෙනු ලබන සේවාවන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස 2015 මැයි මස 27 වැනි දින ස්වාධීන රූපවාහිනී සේවයේ පැවති "නිස්කලංක 7.30" නම් වූ රූපවාහිනී වැඩසටහනට සහභාගී විය.

**(4) සහතිකකරණය ලබා ගැනීම සඳහා සහාය වීම**

තාක්ෂණ සේවා අංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමග එක්ව පහත සඳහන් කර්මාන්ත සඳහා ISO 22000 (ආහාර සුරක්ෂිතතා කළමනාකරණ ක්‍රමවේදය) සහතිකය සහ SLS සහතිකය ලබා ගැනීමට සහාය ලබා දෙන ලදී:

- සී.ස. ප්‍රැන්කා (පුද්) සමාගම, බෙලිඅත්ත - (ISO 22000)
- ෆෝර්කොන්ස් කැනරීස්, නො. 10, පංසල පාර, බේරුවල. - (SLS)
- සී.ස. ලක්මී එක්ස්පෝර්ට් ලංකා (පුද්) සමාගම - (ISO 22000)

**(5) නිෂ්පාදන සංවර්ධන ක්‍රියාකාරකම්**

කර්මාන්තකරුවන්ගෙන් ලැබුණු ඉල්ලීම් කිහිපයක් සැලකිල්ලට ගෙන, අනාගත කර්මාන්තකරුවන්ට තාක්ෂණය ලබාදීමේ අරමුණ ඇතිව පහත සඳහන් ආහාර නිෂ්පාදන පිළිබඳව පර්යේෂණ සිදු කරන ලදී:

- කුළුබඩු රසැති බිස්කට්
- තක්කාලි පිටි
- ක්ෂණික කරි පේස්ට්

**(6) පරිගණක දෘඩාංග සහ ජාලගතකරණ පාඨමාලාව**

2015 වර්ෂය තුළදී පරිගණක දෘඩාංග සහ ජාලගතකරණ සහතික පත්‍ර පාඨමාලා 03 ක් පවත්වන ලදී. එම තොරතුරු තාක්ෂණ පාඨමාලා මගින් උපයා ගත් ආදායම රු. 747,000/- ක් විය. එම පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් 43 දෙනා අතරින් 40 දෙනෙකු ම පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.

## තාක්ෂණ නිදර්ශන වැඩසටහන්













## 4.10 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා 1998 වර්ෂයේදී සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය විසින් කෙටිකාලීන සහ දිගුකාලීන පාඨමාලා පැවැත්වීම, පුහුණු කම්කරුවන් සැපයීම, සුදුසු තාක්ෂණික තොරතුරු සපයාදීම, සහ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම ආදී සේවාවන් සපයනු ලබයි. මෙහි ප්‍රධාන මධ්‍යස්ථානය මොරටුව, කටුබැද්දෙහි පිහිටා ඇති අතර වාරියපොළ සහ විතාරන්දෙනිය යන නගරවල ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

**මෙම මධ්‍යස්ථානය මගින් සපයාදෙනු ලබන සේවාවන් පහත සඳහන් පරිදි වේ:**

- පාවහන් පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම
- සම්භාණ්ඩ පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම
- පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර සැකසීම
- නව නිෂ්පාදන සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ නවෝත්පාදන අදහස් සහ තොරතුරු සපයාදීම
- වෙළඳ සහ යන්ත්‍රසූත්‍ර තොරතුරු සපයාදීම
- මූලික අවදානම අඩුකිරීම සඳහා සහනදායී මිල ගණන් යටතේ සේවා සපයාදීම
- කර්මාන්තය සඳහා පුහුණු ශ්‍රමිකයින් සපයාදීම
- පුහුණු සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම:
  - සැලසුම් සහ මෝස්තර සකස් කිරීම
  - පාවහන්වල ඉහළ වැස්ම
  - සම් කැපීම
  - කාන්තා පාවහන් නිෂ්පානය
  - පිරිමි පාවහන් නිෂ්පාදනය
  - සම් භාණ්ඩ නිෂ්පාදනය

**මධ්‍යස්ථානයෙන් පහත සඳහන් පහසුකම් ලබා ගත හැක:**

- සම් කැපීමේ යන්ත්‍රය
- පැලුම් යන්ත්‍රය
- සම් පටිකැපීමේ යන්ත්‍රය
- හැඩ කැපීමේ යන්ත්‍රය
- සම්පීඩකය සහ දියර විදීමේ කාමරය
- ඔප කිරීමේ සහ නිමාව ගැනීමේ යන්ත්‍රය
- පාවහන්වල අඩිය තද කිරීමේ යන්ත්‍රය
- ප්‍රතික්‍රියක යන්ත්‍රය

මධ්‍යස්ථානය විසින් 2015 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් වලින් 150% ට වැඩි කාර්ය සාධනයක් අත් කර ගෙන ඇති අතර එමගින් රු. 5,918,337/- ක ආදායමක් උපයාගෙන තිබේ.

**මධ්‍යස්ථානය විසින් ඉටුකරන ලද විශේෂ ක්‍රියාකාරකම්**

- සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය සම සංවිධාකයෙකු ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්වී 2015 පෙබරවාරි 6 – 8 යන දිනවල කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පවත්වන ලද හතර වැනි ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2015 සංවිධානය කරන ලදී.
  මෙම ප්‍රදර්ශනයෙහිදී දේශීය මෙන්ම විදේශීය ව්‍යාපාරිකයින් විසින් වෙළඳ කුටි 225 ට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කර තිබුණි. සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ප්‍රදර්ශන කුටි 33 ක්, පාවහන් හා සම්භාණ්ඩ නිර්මාණ තරග, වැඩමුළු සහ අතින් සාදන සපත්තු නිෂ්පාදනය පිළිබඳ නිරූපණය කිරීම් ඇතුලත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සෘජුවම සංවිධානය කළේය.

- කිලිනොච්චිය, වවුනියාව, යාපනය, අම්පාර, ගාල්ල, බදුල්ල, පුත්තලම, කුරුණෑගල, අනුරාධපුරය, කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කවල තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් 25 ක් පවත්වන ලදී. රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව ව්‍යවසායකයින් 227 දෙනෙකුට පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබා ගැනීමට මෙන්ම ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට ද හැකි වී තිබේ. මෙම වැඩසටහන් පැවැත්වීම හරහා මධ්‍යස්ථානයට රු. 2,867,499/- ක ආදායමක් උපයා ගැනීමට හැකි විය.
- මෙම ක්ෂේත්‍රය සංවර්ධනය කර තරුණ උපාධිධාරීන් මෙම ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීම පිණිස මොරටුව විශ්ව විද්‍යාලය සහ දෘශ්‍ය හා රංගකලා විශ්ව විද්‍යාලය සමග එක්ව දැනුම්වත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (කාර්මික සංවර්ධන මණ්ඩලය), ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව විවිධ කමිටුවල ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට සහභාගීවීම සහ දායකත්වය ලබාදීම. මෙම උපදේශක කමිටු මගින් ශ්‍රී ලංකාවේ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පාසල් සිසුන්ට සපත්තු පරිත්‍යාග කිරීමේ ජාතික වැඩසටහන සඳහා සපත්තු සාම්පල තෝරා ගැනීමට අවශ්‍ය කරන තාක්ෂණික දැනුම, උපදෙස් සහ උපදේශකත්වය සපයා දීම.
- පාවහන් අංශයේ ජාතික වෘත්තීය සුදුසුකම් IV වැනි මට්ටම සංශෝධනය කිරීම සඳහා සහ බෑග් අංශයේ ජාතික වෘත්තීය සුදුසුකම් සකස් කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසමට සහාය වීම.

- ශ්‍රී ලංකාවෙහි සිටින පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින් සහ පුහුණු ආයතන පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම. මෙම ක්ෂේත්‍රයෙහි සියලුම අංශ පිළිබඳව තොරතුරු ඇතුලත් මෙය මෙම ක්ෂේත්‍රයෙහි ඇති විශාලතම දත්ත සංචිතය වේ.

- කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පුහුණුව ලැබූවන්ගේ මුල් ආයෝජනයෙහි ඇති අවදානම අඩු කර ගැනීම පිණිස ඔවුන්ට අඩු ගාස්තු පදනමක් යටතේ අවශ්‍ය සේවා සහ පහසුකම් සපයා දීම.

- කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පුහුණුව ලැබූවන්ගේ මුල් ආයෝජනයෙහි ඇති අවදානම අඩු කර ගැනීම පිණිස ඔවුන්ට අඩු ගාස්තු පදනමක් යටතේ අවශ්‍ය සේවා සහ පහසුකම් සපයා දීම.

- විවිධ රාජ්‍ය ආයතනවලට අවශ්‍ය පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රසම්පාදන අවශ්‍යතාවලදී ඒවායෙහි තාක්ෂණ ඇගයීම් කමිටුවලට සහභාගීවීම.

# මූල්‍ය ප්‍රකාශන

- විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 13 | 1,297,336,805 | 1,183,148,184 |
| ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | | 18,321,826 | 62,230,193 |
| ස්ථාවර තැන්පතු | 14 | 11,129,111 | 10,536,959 |
| | | 1,326,787,742 | 1,255,915,336 |
| **ජංගම වත්කම්** | | | |
| බඩුවට්ටෝරු (තොග සහ ක්‍රියාත්මක වෙමින් ඇති වැඩ) | 15 | 34,375,687 | 30,859,050 |
| වෙළඳ සහ ලැබීමට ඇති අනෙකුත් (ණයගැතියන්) | 16 | 33,568,714 | 28,245,619 |
| අනෙකුත් ජංගම වත්කම් | 17 | 47,571,314 | 39,106,477 |
| පූර්ව ගෙවීම් | 18 | 53,498,511 | 64,101,314 |
| විශේෂ ව්‍යාපෘති | 19 | 36,509,324 | 26,072,964 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 20 | 84,557,954 | 46,786,787 |
| | | 290,081,503 | 235,172,211 |
| **මුළු වත්කම්** | | 1,616,869,245 | 1,491,087,547 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| රජයේ ශුද්ධ දායකත්වය | 21 | 277,910,082 | 278,694,719 |
| ප්‍රාග්ධන සංචිත | | 6,243,013 | 6,243,013 |
| පවරාදෙන ලද වත්කම්වල වටිනාකම | 22 | 13,447,061 | 13,447,061 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම මත අතිරික්තය | 23 | 999,334,417 | 953,015,969 |
| රජයේ වෙනත් ප්‍රදාන | 24 | 165,498,934 | 125,933,744 |
| | | 1,462,433,506 | 1,377,334,506 |
| රජයේ ප්‍රදාන | 25 | 1,930,291,117 | 1,930,291,117 |
| සමුච්චිත අලාභ | | (2,175,923,391) | (2,136,683,921) |
| | | (245,632,274) | (206,392,804) |
| **මුළු හිමිකම්** | | 1,216,801,232 | 1,170,941,702 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 26 | 155,623,529 | 100,395,508 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 27 | 71,715,838 | 58,754,659 |
| සංස්ථාවට ගෙවිය යුතු හිඟ | 28 | 32,348,955 | 51,758,331 |
| | | 259,688,322 | 210,908,498 |
| **ජංගම වගකීම්** | | | |
| රජයට ගෙවිය යුතු හිඟ | 29 | 80,114 | 69,679 |
| සංස්ථාවට ගෙවිය යුතු හිඟ | 30 | 26,130,935 | 16,516,256 |
| බැංකු ණය ශේෂ | 20 | 1,146,939 | 1,784,411 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | 31 | 113,021,702 | 90,867,002 |
| | | 140,379,690 | 109,237,347 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 1,616,869,245 | 1,491,087,547 |

**අධ්‍යක්ෂ මුදල් - ඒ. ඩබ්. ජී. ගුරුගේ**

**" පිටු අංක 05 සිට 11 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 12 සිට 23 දක්වා ඇති සටහන් මෙම ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ; "**

| | |
|---|---|
| **මහින්ද ජිනසේන** | **ශාමින් පෙරේරා** |
| **සභාපති** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

**(සියලුම මුදල් ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් කර ඇත)**

| | සටහන් | 2015 | 2014 |
|---|---|---|---|
| අලෙවි සහ සේවා | **5** | 211,713,216 | 188,539,103 |
| අලෙවි සහ සේවා පිරිවැය | **6** | (125,953,022) | (103,502,334) |
| **දළ ලාභය** | | 85,760,194 | 85,036,769 |
| වෙනත් ආදායම් | **7** | 66,149,632 | 62,283,658 |
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | **8** | 296,750,000 | 250,000,000 |
| පරිපාලන වියදම් | **9** | (425,139,797) | (396,572,923) |
| අලෙවි බෙදාහැරීම් වියදම් | **10** | 4,128,236 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල** | | 27,648,266 | 747,504 |
| මූල්‍ය පිරිවැය | **11** | (389,155) | (328,192) |
| ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය) | | (389,155) | (328,192) |
| බදු ගෙවීමට ශුද්ධ පෙර ලාභය | | 27,259,111 | 419,312 |
| **වර්ෂය සඳහා ලාභය / පාඩුව** | | **27,259,111** | **419,312** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | **12** | **(2,894,499)** | **961,019,480** |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ පාඩුව / ආදායම** | | **24,364,612** | **961,438,792** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

**(සියලුම මුදල් ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් කර ඇත)**

| | ශුද්ධ රජයේ දායක මුදල | ප්‍රාග්ධන සහ සංචිත | පවරාදෙන ලද වත්කම් වටිනාකම | ප්‍රත්‍යාගණන අතිරික්තය | වෙනත් රජයේ ප්‍රදාන | රජයේ ප්‍රදාන | සමුච්චිත අතිරික්තය / හිගය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | 274,328,481 | 6,243,013 | 13,447,061 | 14,820,830 | 76,047,329 | 1,930,291,117 | (2,146,388,663) | **168,789,172** |
| පෙර වර්ෂයේ ගැළපීම් | | | | | | | (9,826,031) | **(9,826,031)** |
| වර්ෂය සඳහා අලාභය | | | | | | | 419,312 | **419,312** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | | 941,908,020 | | | | **941,908,020** |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | | | | | | 19,111,460 | **19,111,460** |
| රජයේ ප්‍රදාන | 35,000,000 | | | | 54,048,778 | | | **89,048,778** |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (30,633,762) | | | | (4,162,367) | | | **(34,796,129)** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | | (3,712,881) | | | | **(3,712,881)** |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 278,694,719 | 6,243,013 | 13,447,061 | 953,015,969 | 125,933,740 | 1,930,291,117 | (2,136,683,923) | **1,170,941,701** |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 278,694,719 | 6,243,013 | 13,447,061 | 953,015,969 | 125,933,740 | 1,930,291,117 | (2,136,683,923) | **1,170,941,701** |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | (163,157) | - | (17,407,674) | **(17,570,831)** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | - | 27,259,111 | **27,259,111** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | 46,318,448 | - | - | - | **46,318,448** |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | - | - | - | - | - | - | (49,090,907) | **(49,090,907)** |
| රජයේ ප්‍රදාන | 45,000,000 | - | - | - | 48,624,461 | | - | **93,624,461** |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (45,784,637) | - | - | - | (8,896,113) | - | - | **(54,680,750)** |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **277,910,082** | **6,243,013** | **13,447,061** | **999,334,417** | **165,498,930** | **1,930,291,117** | **(2,175,923,392)** | **1,216,801,232** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**(සියලුම මුදල් ගණන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇත)**

| | | 2015 |
|---|---|---|
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | 27,259,111 |
| **මූල්‍ය නොවන අයිතම සඳහා ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 32,771,415 | |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (54,680,750) | |
| ස්ථාවර වත්කම් විකිණීම මගින් ලැබූ ලාභය | (187,200) | |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (2,894,499) | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 16,536,613 | |
| හඳුනා නොගත් තැන්පතු | (1,842,520) | |
| බොල් සහ අඩමාන ණය | (4,128,236) | |
| පෙර වර්ෂයේ ගැලපීම් | 112,958 | |
| | | (14,312,219) |
| | | 12,946,892 |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | (10,399,498) |
| | | 2,547,393 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් හේතුවෙන් සිදුවූ මුදල් ගලනයන්** | | |
| තොග (වැඩිවීම / අඩුවීම) | (3,516,637) | |
| ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම | (1,194,859) | |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම) / අඩුවීම | (8,464,838) | |
| පූර්ව ගෙවීම් (වැඩිවීම) / අඩුවීම | 10,602,804 | |
| විශේෂ ව්‍යාපෘති (වැඩිවීම) / අඩුවීම | (10,436,360) | |
| ණය හිමියෝ සහ උපචිත ගාස්තු (වැඩිවීම) / අඩුවීම | 12,370,439 | (639,451) |
| **මෙහෙයුම් තුළින් ජනිත වූ මුදල්** | | 1,907,943 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ මුදල් ගලනය** | | |
| ස්ථාවර තැන්පතුවල වර්ධනය | (592,152) | |
| වත්කම් අලෙවියෙන් ලැබූ ආදායම | 187,200 | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම / ඉදිකිරීම | (69,679,991) | (70,084,943) |
| | | (68,177,001) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනයන්** | | |
| රජයෙන් ලැබුණු ප්‍රදාන | 93,624,461 | |
| විශේෂ ව්‍යාපෘතිවල ආයෝජන | 12,961,179 | 106,585,640 |
| | | 38,408,639 |
| එකතු කළා: 2015.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ | | **45,002,376** |
| **2015.12.31** දිනට මුදල් සහ මුදල් වලට සමාන දෑ | | **83,411,015** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1 සාමාන්‍ය තොරතුරු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ ලංකා කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්ත දිරිමත් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට සහායවීම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යය වේ

### 2 වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගෙන ඇති ප්‍රධානතම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. අන්‍යාකාරයෙන් සඳහන් කර නැත්තේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඉදිරිපත් කර ඇති සියලුම වර්ෂවලට අදාළ වන පරිදි යොදාගෙන ඇත.

#### 2.1 සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) / (LKAS) අනුගමනය කරමින් එහි මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) අන්තර්ගත කිරීම පිණිස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සංශෝධනය කරන ලද අතර ඒ අනුව 2012 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන වර්ෂය සහ ඉන් පසු එළඹෙන වර්ෂ සඳහා සියලුම ආයතන විසින් මෙම ප්‍රමිති යොදා ගත යුතු වේ.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති 2011 ජනවාරි මස 1 වැනි දිනට සහ ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේද පුරා මූල්‍ය තත්ත්වයෙහි ආරම්භක ප්‍රකාශනය සකස් කිරීමේදී සියලුම කාලවලට අදාළ වන පරිදි මෙම ප්‍රතිපත්ති සැමවිටම බලපැවැත්වෙමින් තිබුණා සේ යොදා ගෙන ඇත. පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් වැදගත් වෙනස්කම් සිදුවූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ස්වභාවය සහ බලපෑම ද ඇතුළත්ව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයට මාරුවීමෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්තා කර ඇති මූල්‍ය තත්වයට සහ මූල්‍ය කාර්ය සාධනයට ඇතිවී ඇති බලපෑම සටහන 5 මගින් පෙන්වා ඇත.

මූල්‍ය වත්කම් සහ වගකීම් පිළි ඇගයීම සහ සාධාරණ ඇගයීම මගින් සංශෝධනය කර ඇති පරිදි ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඉතා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීම අවශ්‍ය කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් සිය විනිශ්චය යොදා ගැනීම ද අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ විනිශ්චයක් හෝ සංකීර්ණ බවක් ඇතුළත්වන ක්ෂේත්‍ර, නැතහොත් උපකල්පන සහ ඇස්තමේන්තු කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට වැදගත් වන ක්ෂේත්‍ර 4 වැනි සටහනෙහි පෙන්වා ඇත.

#### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තියෙහි වෙනස්කම් සහ අනාවරණ

නිකුත් කර ඇති නමුත් 2012 ජනවාරි 01 වැනි දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා බලාත්මක නොවන සහ කලින් යොදා නොගත් නව ප්‍රමිති, සංශෝධන සහ අර්ථ නිරූපණ..

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. (SLFRS) - 13 , ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. පුරා යොදා ගැනීම පිණිස සාධාරණ වටිනාකම යන්නෙහි තනි නිශ්චිත නිර්වචනයක් සහ සාධාරණ වටිනාකම් මිනුම් සහ හෙළිදරව් කිරීම් අවශ්‍යතා වල එක් තනි මූලාශ්‍රයක් සපයාදීම මගින් අනුරූපත්වය වැඩිදියුණු කර සංකීර්ණත්වය අඩු කිරීම 'සාධාරණ වටිනාකම් මිනුම්' මගින් අරමුණු කෙරේ. මෙම ප්‍රමිතියෙහි පූර්ණ බලපෑම කළමනාකරණය විසින් තක්සේරු කළ යුතුව තිබේ.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9, 'මූල්‍ය සාධන පත්‍ර' විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම, ඇගයීම සහ හඳුනාගැනීම් නිරාකරණය කරයි. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 යටතේ මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය කිරීම සහ ඇගයීමට අදාළ කොටස් ප්‍රතිස්ථාපනය කරයි. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 අනුව මූල්‍ය වත්කම් ඇගයීම් කාණ්ඩ දෙකකට වර්ග කළ යුතු වේ. එම කාණ්ඩ දෙක සාධාරණ වටිනාකමට ඇගයීම කරනු ලබන කාණ්ඩය සහ ක්‍රමක්ෂය කළ පිරිවැයට ඇගයීම් කරනු ලබන කාණ්ඩය වශයෙන් වේ. නිර්ණය කිරීම මුල්වරට හඳුනාගැනීමේදී සිදු කරනු ලැබේ. එම වර්ගීකරණය ආයතනයේ මූල්‍ය සාධන පත්‍ර කළමනාකරණය කිරීම සඳහා ආයතනයේ ඇති ව්‍යාපාර අනුරූපය සහ සාධන පත්‍රයේ ඇති ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලක්ෂණ මත රඳා පවතී. මූල්‍ය වගකීම් සඳහා මෙම ප්‍රමිතිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 39 හි ඇති අවශ්‍යතාවලින් බොහොමයක් එලෙසම තබාගෙන ඇත. ප්‍රධාන වෙනස්කම වන්නේ මූල්‍ය වගකීම් සඳහා සාධාරණ වටිනාකම විකල්පය වශයෙන් ගෙන ඇති අවස්ථාවලදී, ගිණුම්කරණ නොගැළපීමක් ඇතිවීමට හේතු නොවන්නේ නම් මිස, ආයතනයක සිය ණය අවදානම ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනවාට වඩා වෙනත් විස්තීර්ණ ආදායමක වාර්තා කිරීම හේතුවෙන් සාධාරණ වටිනාකමක කොටස වෙනස් වීමයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත මූර්ත බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබිය හැකි, තවමත් ක්‍රියාත්මකව නොමැති වෙනත් ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථ නිරූපණ නොමැත.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.3 දේපළ, පිරියත සහ උපකරණ**

සියලුම දේපළ, පිරියත සහ උපකරණ මුල් අවස්ථාවේදී පිරිවැයට වාර්තා කර ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම දරණ ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාලපරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම වන එම අයිතම ගලවා ඉවත්කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරියවැයට ඇතුළත්වේ.

වත්කමක් නැවත අගය කරන විට, ධාරණ වටිනාකමෙහි යම් වෙනස්වීමක් සිදුවුවහොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩුවීමකට ප්‍රතිවර්ත නොවන්නේ නම්, එය සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී, වැඩිවීම පූර්වයෙන් ලියා ගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තන නොකරන්නේ නම් වියදමක් ලෙස හඳුනාගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එයින් එය අය කරනු ලැබේ. වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරිවී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමෙහිදී හෝ බැහැර කිරීමෙහිදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුළත් කිරීම හෝ වෙනමම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදු කරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අළුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරන ලද මූල්‍ය කාලපරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

*(ආ). ක්ෂයවීම්*

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම අරම්භවූ දිනයේ සිටම ක්ෂවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු, එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂවීම් අඩු කරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තුමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

| | | | |
|---|---|---|---|
| ඉඩම් වැඩිදියුණු කිරීම | 2.5% | පරිගණක මෘදුකාංග | 7.0% |
| ගොඩනැගිලි | 2.5% | පරිගණක | 20.0% |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර | 10.0% | මෝටර් වාහන | 20.0% |
| මුද්‍රණ යන්ත්‍ර | 10.0% | ලීබඩු සහ සවිකිරීම් | 10.0% |
| කාර්යාලයීය උපකරණ | 10.0% | පාපැදි | 10.0% |
| විද්‍යාගාර උපකරණ | 10.0% | විවිධ වත්කම් | 10.0% |
| මෙවලම් | 25.0% | උපයෝජ්‍යා සේවා | 10.0% |
| පොත් | 25.0% | PABX සේවා | 10.0% |
| ගමන් මලු | 25.0% | වෙනත් වත්කම් | 10.0% |

වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සෑම ශේෂපත්‍ර දිනයකදීම සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමෙහි ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම් එකෙනෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැර කිරීමේදී සිදුවන ලාභය / පාඩුව බැහැර කිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. මේවා ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

**2.4 මූල්‍ය වත්කම්**

**2.4.1 වර්ගීකරණය**

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කරගත් කාරණය පදනම් කරගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

*ණය සහ ලැබිය යුතු මුදල්*

ණය සහ අයවිය යුතු මුදල් සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂපත්‍ර දිනෙන් පසු මාස 12කට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම්වල ඇතුළත් කර ඇත.

### 2.4.2 මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගනුදෙනු පිරිවැය එකතු කළ අගයට හඳුනාගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලැබේ.

### 2.4.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම

හඳුනාගත් වටිනකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවිට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව්කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

### 2.4.4 මූල්‍ය වත්කම් හානිකරණය

*(අ) ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)*

සෑම වාර්තා කිරීමේ කාලපරිච්ඡේදයක් අවසානයේදීම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වත්කම්වලට හානි සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇති කරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානිවී ඇති බවට සළකණු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරණු ලැබේ.

හානිකරණයට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩුකරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාලපරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩුවන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනාගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂා කිරීම 2.10 සටහනෙහි විස්තර කර ඇත.

### 2.5 මූල්‍ය වගකීම්

කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර ඉන් පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැළකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඒවා මනිනු ලබන අතර ඒවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

### 2.6 තොග

තොග වටිනාකම පිරිවැයෙහි පහළ අගයට සහ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කරනු ලැබේ. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය යොදාගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇසත්මේන්තු කළ පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය කරන පිරිවැය අඩුකළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගණන් ගනු ලැබේ:

අමුද්‍රව්‍ය - පෙර පිවිසි පෙර නිකුතු පදනමින් සත්‍ය පිරිවැයට
නිමි භාණ්ඩ - පිරිවැයට
කෙරෙමින් පවතින වැඩ - ඍජු ද්‍රව්‍ය සහ ඍජු ශ්‍රම පිරිවැයට සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගෙන නිෂ්පාදන පොදු කාර්යවලින් යෝග්‍ය කොටසක්

### 2.7 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේදී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටුකරන ලද සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් අයවීමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අයකර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නො එසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.7 වෙළඳ ලැබිය යුතු දෑ (ඉතිරි)**

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ ට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අයකර ගැනීමට නොහැකිවනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත්භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැරහැරීම හෝ කඩකිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. ප්‍රතිපාදන පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ: වසර 5 ට වැඩි නම් 100% ප්‍රතිපාදනය කරනු ලබන අතර අනෙක්වා සඳහා 10% කි.

**2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් සහ මුදල් හා සමාන දේට අත ඉතුරු මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු, මාස තුනක හෝ එයට අඩු මුල් කල්පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම වගකීම්වල ණය ගැනුම් යටතේ පෙන්වා ඇත.

**2.9 ප්‍රතිපාදන**

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍යවිය හැකි සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

**2.10 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**

ශේෂ පත්‍රයෙහි වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂපත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයෙහි සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයකදී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

**2.11 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම**

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශ්‍රාම ගැනීමේදී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දිය වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරණ පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ..

නිර්වචිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කරවල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල්පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසිවලට ආසන්න වන කොන්දේසි සහිත අනාගත මුදල් ගලායාම් වට්ටම් කරමින් නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයුගණක උපකල්පනයන්හි වෙනස්කම් මගින් හටගන්නා ආයුගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටගන්නා කාලපරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අයකිරීම හෝ බැරකිරීම සිදු කරනු ලැබේ.

සැලැස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාලපරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නෙහි නම් අතීත සේවා පිරිවැය එකෙනෙහිම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙසේ කිරීමෙහිදී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.12 නිර්වචිත දායක සැලැස්ම**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවක භාරකාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලබයි.

**2.13 ආයෝජන**

ආයෝජන තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙන යනු ලැබේ.

**2.14 රජයේ ප්‍රදාන**

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබේ. මෙහිදී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසිවලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මගින් හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය සමග ගැළපීමට අවශ්‍ය කරන කාලපරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ රජයේ ප්‍රදාන විලම්බිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම්වල ඇතුළත් කර ඇති අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**2.15 පරිත්‍යාග**

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදායකයා වෙත නාමික ප්‍රතිෂ්ඨාව ලබාදෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, ප්‍රදායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව අසාධාරණ හුවමාරු ගණුදෙනුවක් ප්‍රතිඵලය වන තරමට ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැළකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනාගත යුතුය.

**2.16 ආදායම් හඳුනාගැනීම**

*(අ). විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා*

අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරාදී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයාගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පිරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනාගනු නොලැබේ.

*(ආ). පොළී ආදායම*

පොළී ආදායම කාල ප්‍රමාණ පදනමකින් හඳුනාගනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙහිදී ලැබුණු හෝ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම නිසා ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවන්හි සාධාරණ වටිනාකම්වලින් ආදායම සමන්විත වේ. ආදායම අගය එකතු කිරීමේ බද්ද, ප්‍රතිලාභ, ප්‍රතිදාන සහ වට්ටම්වල ශුද්ධ වටිනාකම ලෙස පෙන්වා ඇත.

**2.17 වියදම් හඳුනාගැනීම**

*(අ). මෙහෙයුම් වියදම්*

වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහිදී දරන ලද සියලුම වියදම් ආදායමට අයකරනු ලැබේ.

*(ආ). ශුද්ධ මූල්‍ය පිරිවැය*

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය, සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරන ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

## 3 මූල්‍ය අවදානම් කළමනාකරණය

**3.1 මූල්‍ය අවදානම් සාධක**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම්වල ද්‍රවශීලතාවය ඉහළනැංවීම සහ පවත්වාගෙන යාම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුවම ඇතිවන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධ වූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම්වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

***(i) පොළී අනුපාත අවදානම***

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පාවෙන අනුපාත සහිත ණය බැඳීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම් සහ තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිසගැනීම ආදී ක්‍රම මගින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

***(ii) ණය අවදානම***

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම හිග ලැබිය යුතු දෑ සහ සිදුකළ ගනුදෙනු ද ඇතුළත්ව විදේශ ගනුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

## 3 මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි)

### 3.1 මූල්‍ය අවදානම් සාධක (ඉතිරි)

සාමාන්‍යයෙන් ණය ආවදානමට ලක්වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්වයන් ඒවායේ ධාරණ වටිනාකම්වලට සමාන වේ. උපරිම අවදානම් තත්ත්වයන් පහත සඳහන් වගුව මගින් පෙන්වා ඇත (2015.12.31 දිනට).

| | වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | අදාළ පාර්ශවයන් ගෙන් ලැබිය යුතු වටිනාකම් | මුදල් සහ මුදල් හා සමාන දෑ | එකතුව |
|---|---|---|---|---|
| **අවදානම් නිරාවරණය** | | | | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 33,568,714 | | | 33,568,714 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 84,557,954 | 84,557,954 |
| | **33,568,714** | **-** | **84,557,954** | **118,126,667** |

### 3.2 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත් ප්‍රාග්ධන පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීමත්ය.

කර්මාන්තයේ නියැළී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම්වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම්වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මුළු හිමිකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති මුළු හිමිකම ලෙස ගණනය කරනු ලැබේ.
2015 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය:

| | 2015 | 2014 |
|---|---|---|
| මුළු ණයට ගැනීම් | - | - |
| මුළු හිමිකම් | 1,216,801,232 | 1,170,941,702 |
| **තෝලන අනුපාතය** | **-** | **-** |

## 4 අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරුකිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

### 4.1 ඉතා වැදගත් ගිණුම්කරණ තක්සේරු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ තක්සේරු සහ උපකල්පන සිදුකරයි. එයින් ප්‍රතිඵලවන ගිණුම්කරණ තක්සේරු ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵලවලට සමානවන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැළපීමක් සිදුකිරීමට හේතුවන සැළකිය යුතු අවදානමක් සහිත තක්සේරු සහ උපකල්පනයන් පහත අනාවරණය කර ඇත.

**(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික**

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පන වලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්යභාරයෙන් ඉවත්වීමේ සහ ආබාධිතවීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පනවලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ස්වායත්ත ආයුගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදාගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලායෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන වෙළඳපොළ තත්ත්වයන් මත ද රඳා පවතී. අමතර තොරතුරු සටහන 26 හි සඳහන් කර ඇත.

## 4 අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරුකිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු (ඉතිරි)

**(ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්**

කාර්මික සංවර්ධන මණ්ඩලය ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩිදියුණු කිරීම් වැනි සාධක පදනම් කර ගෙන දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන්කළ සාධකවල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තුවල ඇතිවිය හැකි වෙනස්කම් මෙහෙයුම්වල අනාගත ප්‍රතිඵලවලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩුවීමක් සිදුවීම මගින් වාර්තා කර ඇති ක්ෂය අයකිරීම් වැඩිවිය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

**4. අවිනිශ්චිත වගකීම්**

(අ). ජීවන වියදම් දීමනාව මත සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවීම හේතුවෙන් එකතුවී ඇති රු.2,911,406.00 ක වගකීම මෙතෙක් මණ්ඩලය වෙත දන්වා නොමැති නිසා එම වගකීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැත.

(ආ). මුදල් වර්ෂය අවසානය වන විට මණ්ඩලයට එරෙහිව අධිකරණයේ පවරා තිබූ, විභාග කර අවසන්වී නොමැති නඩු 09 ක් තිබුණි. කෙසේ වෙතත්, නීති අංශයට අනුව, මෙම නඩුවල ප්‍රතිඵලය ලෙස කිසිදු වන්දියක් ගෙවීමට සිදුවිය හැකිව නොතිබුණි. එබැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කිරීමේ වගකීමක් පැන නැගී නොතිබුණි.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**5** ආදායම

| | 2015 | 2014 |
|---|---|---|
| **5 a විකුණුම්** | | |
| විකුණුම් | 29,241,401 | 32,722,576 |
| විකුණුම් (යකඩ නොවන ලෝහ ව්‍යාපෘතිය) | 103,970,263 | 83,946,899 |
| කැස්පර් ව්‍යාපෘතිය විකුණුම් ආදායම් | 2,101,575 | 2,396,950 |
| ප්‍රකාශන අලෙවිකිරීම | 402,040 | 574,495 |
| | **135,715,279** | **119,640,920** |
| **5 b සේවා** | | |
| කුලිය - කාර්මික ජනපද | 41,985,200 | 40,610,482 |
| ජල ගාස්තු | 7,441,537 | 6,728,096 |
| යටිතල පහසුකම් | - | 324,017 |
| වැඩිපුර අයකරගත් ගාස්තු | 1,533,423 | 1,381,702 |
| රක්ෂණ වාරික | - | 44,897 |
| පුහුණු වැඩසටහන් | 17,449,627 | 16,176,184 |
| ව්‍යාපෘති වාර්තා | 3,179,144 | 972,527 |
| කාර්මික ජනපද සඳහා සේවා ගාස්තු | - | 712,229 |
| සේවා ගාස්තු | 4,409,007 | 1,948,050 |
| | 75,997,937 | 68,898,184 |
| | **211,713,216** | **188,539,103** |

**06** අලෙවි සහ සේවා පිරිවැය

| | 2015 | 2014 |
|---|---|---|
| අලෙවි පිරිවැය - සෘජු ද්‍රව්‍ය | 23,722,894 | 21,235,949 |
| අලෙවි පිරිවැය - මිලදී ගැනීම් - යකඩ නොවන අබලි ව්‍යාපෘතිය | 73,950,390 | 51,768,776 |
| අලෙවි පිරිවැය - සෘජු ශ්‍රමය | 2,954,694 | 2,734,821 |
| අලෙවි පිරිවැය - සෘජු නොවන ද්‍රව්‍ය | 4,308,755 | 3,543,638 |
| පාරිභෝජ්‍ය ඉංජිනේරු අමුද්‍රව්‍ය | 106,306 | 2,500 |
| පාර්භෝජ්‍ය - වාත්තු වැඩපොළ අමුද්‍රව්‍ය | 54,637 | - |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර නඩත්තු | 535,069 | 279,962 |
| විදුලි බලය | 3,600,318 | 3,272,020 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම් | 912,995 | 1,209,956 |
| උපකරණ ක්ෂයවීම් | - | 49,810 |
| මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම් | - | 335,536 |
| යකඩ නොවන අබලි ද්‍රව්‍ය එකතු කිරීම් කොමිස් | 16,400 | 3,300 |
| ඉංජිනේරු වැඩ ගාස්තු | 48,664 | 336,752 |
| අලෙවිකරණ වියදම් | 154,028 | 93,032 |
| උප කොන්ත්‍රාත් ගාස්තු | 877,100 | 976,400 |
| කර්මාන්තශාලා පොදු කාර්ය පිරිවැය | (1,517,652) | (1,957,432) |
| සාමාන්‍ය පොදු කාර්ය වශයෙන් අය කර ගත් මුදල | (2,701,869) | (2,206,175) |
| කාර්මික ජනපද නඩත්තු කිරීම | 1,254,680 | 2,185,823 |
| විද්‍යාගාර උපකරණ නඩත්තු කිරීම | 800 | 2,500 |
| මුද්‍රණ යන්ත්‍ර නඩත්තු කිරීම | 300 | 25,336 |
| ප්‍රවාහන ගාස්තු | 529,806 | 1,641,375 |
| ජා.ගො.බ. වියදම් - ලක්කම් | 189,361 | 155,562 |
| පුහුණු වැඩසටහන් | 16,955,344 | 17,812,894 |
| **එකතුව** | **125,953,022** | **103,502,334** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**07 වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| කොමිස් (උපකොන්ත්‍රාත් හුවමාරු) | 592,935 | 112,488 |
| කොමිස් - ලක්කම් මධ්‍යස්ථානය | 1,990,777 | 2,366,892 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 752,400 | 746,310 |
| ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු | 16,400 | 7,080 |
| ලක්කම් ශාලා ගාස්තු | 32,000 | 7,500 |
| නොතාරිස් ගාස්තු | 212,320 | 190,260 |
| දඩ | 76,356 | 60,363 |
| වෙබ්අඩවි පළකිරීමේ ආදායම් | - | 10,385 |
| සංචාරක බංගලා ගාස්තු | 172,386 | 179,674 |
| ස්ථාවර වත්කම් විකිණීම | 187,200 | 3,083,676 |
| විවිධ ආදායම් | 3,319,944 | 1,445,833 |
| ඉතිරිකිරීමේ පොළී | 1,699,789 | 1,007,771 |
| රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු | 842,286 | 299,116 |
| කාර්ය මණ්ඩල ණය පොළී | 1,574,088 | 1,568,637 |
| මාරුකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | 54,680,750 | 34,796,129 |
| ප්‍රදර්ශන ආදායම | - | 16,401,543 |
| | **66,149,632** | **62,283,658** |

| **8 ප්‍රදාන** | **2015** | **2014** |
|---|---|---|
| ආදායම් ප්‍රදාන | 296,750,000 | 250,000,000.00 |
| | **296,750,000** | **250,000,000.00** |

| **9 පරිපාලන වියදම්** | **2015** | **2014** |
|---|---|---|
| මූලික වැටුප් | 120,452,632 | 120,318,962 |
| සභාපතිවරයාගේ වේතනය | 716,071 | 600,000 |
| විධායක අධ්‍යක්ෂවරුන්ගේ දීමනා | 292,857 | - |
| විශේෂ දීමනා 5% | 75,636,336 | 27,007,835 |
| ජීවන වියදම් දීමනාව | 46,171,006 | 44,676,537 |
| වෙනත් දීමනා | 4,739,482 | 4,744,184 |
| සේ.අ.අ. (දායක මුදල්) | 20,326,548 | 20,212,520 |
| සේ.නි.භා.අ. (දායක මුදල්) | 5,080,517 | 5,053,948 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා ප්‍රසාද දීමනා | 6,132,375 | 453,000 |
| වර්ෂය සඳහා පාරිතෝෂික අයකිරීම් | 16,536,613 | 13,577,657 |
| පුහුණු දීමනා | 872,025 | 802,281 |
| දෛනික ගෙවීම් කරනු ලබන සහ මුරකරු දීමනා | 954,154 | 2,623,593 |
| ලබා නොගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම් | 10,655,041 | 10,025,747 |
| අතිකාල | 8,674,760 | 10,628,180 |
| නිවාඩු දින ගෙවීම් | 741,709 | 787,890 |
| ගමන් වියදම් (දේශීය) | 5,472,333 | 7,041,001 |
| ගමන් වියදම් (විදේශීය) | 1,810,359 | 869,230 |
| නවාතැන් වියදම් | 200,185 | 222,296 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 2,703,208 | 2,848,544 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | - | 24,579 |
| ඉන්ධන වියදම් | 3,763,667 | 4,430,757 |
| නිළ ඇඳුම් | 1,591,278 | 1,159,872 |
| ඉඩම් නඩත්තු කිරීම | 232,544 | 103,852 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 774,188 | 1,021,795 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 732,235 | 157,272 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

| 9 පරිපාලන වියදම් (ඉතිරි) | 2015 | 2014 |
|---|---|---|
| පරිගණක උපාංග නඩත්තු කිරීම | 551,904 | 448,736 |
| මෝටර් වාහන නඩත්තු කිරීම | 3,452,808 | 3,638,854 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 742,384 | 492,193 |
| ලිබඩු, සවිකිරීම් සහ කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 141,041 | 357,565 |
| පාපැදි නඩත්තු කිරීම | - | 2,515 |
| PABX සේවා නඩත්තු කිරීම | - | 42,927 |
| විවිධ වත්කම් නඩත්තු කිරීම | 20,801 | 51,628 |
| ජල සැපයුම නඩත්තු කිරීම | 43,888 | 478,711 |
| ඉඩම් නඩත්තු කිරීම | 12,400 | 26,685 |
| විදුලිය ගාස්තු | 8,798,008 | 9,356,840 |
| දුරකථන ගාස්තු | 5,623,813 | 4,779,402 |
| ආරක්ෂක සේවා සඳහා ගෙවීම් | 20,359,707 | 21,064,040 |
| තැපැල් සහ විදුලි පණිවුඩ ගාස්තු | 785,427 | 938,753 |
| ජල ගාස්තු | 6,056,540 | 4,438,770 |
| කුලී, වරිපණම් සහ බදු | 3,693,590 | 14,279,489 |
| රක්ෂණ | 1,557,541 | 1,266,014 |
| පුවත්පත් සහ සඟරා | 746,459 | 600,891 |
| හැකියා සංවර්ධන වැඩසටහන් | - | 613,690 |
| අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු | 259,200 | 649,800 |
| උපදේශන ගාස්තු | - | 251,200 |
| වෛද්‍ය ආධාර යෝජනාක්‍රම දායක මුදල් | 286,235 | 241,500 |
| විගණන ගාස්තු | 600,000 | 600,000 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 21,000 | 16,000 |
| සුභසාධන | 1,287,859 | 1,316,021 |
| විනෝදාස්වාද | 381,721 | 331,062 |
| වෙළඳ දැන්වීම් | 913,035 | 1,357,720 |
| නීති සේවා ගාස්තු | 93,554 | 325,772 |
| වෘත්තීය පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු | 19,762 | 82,555 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පුහුණු | 273,944 | 1,211,792 |
| වෘත්තීයවේදී සංවිධාන (දේශීය සහ විදේශීය) සඳහා සාමාජික ගාස්තු | 9,768 | 8,820 |
| බලපත්‍ර ගාස්තු | 217,880 | 195,120 |
| ප්‍රවර්ධන වියදම් | - | 1,000 |
| ප්‍රදර්ශන වියදම් | 223,910 | 22,644,445 |
| අච්චුවේලි කා.ජ. විවෘත කිරීමේ වියදම් | - | 1,089,550 |
| පර්යේෂණ සහ සංවර්ධන | 170,177 | 223,720 |
| තක්සේරු කිරීමේ සහ මැනුම් කිරීමේ ගාස්තු | 59,024 | |
| ශක්‍යතා අධ්‍යයන | 191,215 | 16,460 |
| ප්‍රකාශන | 20,000 | 91,659 |
| ඡායාරූප | 6,300 | 2,380 |
| රජයේ ප්‍රදාන පුනප්‍රකාශනය | - | 39,730 |
| විවිධ වියදම් | 341,418 | 596,639 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **9** | **පරිපාලන වියදම් (ඉතිරි)** | | |
| | ලියාපදිංචි කිරීම් ගාස්තු | 56,940 | 39,300 |
| | ඉඩම් වැඩිදියුණු කිරීම් ක්ෂයවීම | 577,667 | 1,485,667 |
| | ගොඩනැගිලි ක්ෂයවීම | 11,396,473 | 4,271,633 |
| | පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම | 2,792,194 | 2,476,074 |
| | පරිගණක උපාංග ක්ෂයවීම | 3,845,927 | 3,958,607 |
| | රසායනාගාර උපකරණ ක්ෂයවීම | 275,328 | 96,194 |
| | මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම | 249,437 | - |
| | මෝටර් වාහන ක්ෂයවීම | 7,910,000 | 6,066,753 |
| | කාර්යාල උපකරණ ක්ෂයවීම් | 1,694,709 | 2,003,434 |
| | ගමන් මලු ක්ෂයවීම් | 20,781 | 20,616 |
| | ලී බඩු සහ සවිකිරීම් ක්ෂයවීම | 1,124,472 | 1,094,915 |
| | පාපැදි ක්ෂයවීම් | 10,762 | 10,308 |
| | උපකරණ සහ අමතර කොටස් ක්ෂයවීම් | 177,272 | 48,320 |
| | පුස්තකාල පොත් ක්ෂයවීම් | 820,223 | 396,107 |
| | PABX සේවා ක්ෂයවීම් | 279,484 | 269,934 |
| | උපයෝගිතා සේවා ක්ෂයවීම් | 327,848 | 340,464 |
| | විවිධ වත්කම් ක්ෂයවීම් | 355,843 | 281,356 |
| | JICA උපකරණ ක්ෂයවීම් | - | 151,061 |
| | | **425,139,797** | **396,572,923** |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **10** | **විකුණුම් සහ බෙදාහැරීම් පිරිවැය** | | |
| | බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 4,128,236 | - |
| | | **4,128,236** | **-** |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **11** | **මූල්‍ය පිරිවැය** | | |
| | බැංකු ගාස්තු | 378,655 | 328,192 |
| | අයිරා පොළී | 10,500 | - |
| | | **389,155** | **328,192** |

**වෙනත් විස්තීරණ ආදායම්**

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **12** | වර්ෂය සඳහා ආයුගණක ලාභය (අලාභය) | (49,090,907) | 19,111,460 |
| | ප්‍රත්‍යාගණන අතිරික්තය | 46,196,408 | 941,908,020 |
| | | **(2,894,499)** | **961,019,480** |

| | 2015 | 2014 |
|---|---|---|
| වර්ෂය තුළ සේවයේ යෙදී සිටි සේවකයින්ගේ සාමාන්‍ය සංඛ්‍යාව | | |
| ස්ථිර | **485** | **500** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 13. 2015.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් | ඉඩම් සංවර්ධන | ගොඩනැගිලි | පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සවිකිරීම් | මුද්‍රණ යන්ත්‍ර | JICA ව්‍යාපෘති වත්කම් | කාර්යාල උපකරණ | විද්‍යාගාර උපකරණ |
|---|---|---|---|---|---|---|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 6,585,262 | 50,117,230 | 122,314,905 | 15,751,488 | 1,683,010 | 151,058 | 9,560,690 | 347,978 |
| කාල පරිච්ඡේදය තුළ එකතුකිරීම් | - | 20,113,799 | 606,208 | 168,000 | - | - | 1,303,151 | 7,500 |
| ගැලපීම් | | | 4,617,973 | 416,650 | | | (76,160) | |
| ගැලපීම් | (6,585,262) | (44,324,713) | 60,172,804 | | | | | |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 8) | | (1,485,667) | (4,183,776) | (3,644,365) | (335,536) | (151,061) | (2,003,434) | (96,194) |
| ගැලපීම් | | (852,995) | (87,505,054) | (333,320) | | | | |
| ගැලපීම් | | (3,770,741) | (4,272,458) | | | | | |
| ප්‍රත්‍යාගණනය | 676,552,750 | | 311,884,530 | | | | | |
| **ශුද්ධ පොත් අවසන් වටිනාකම්** | **676,552,750** | **19,796,913** | **403,635,131** | **12,358,453** | **1,347,474** | **(3)** | **8,784,250** | **259,285** |
| **2014 දෙස්මබර් 31 දිනට** | | | | | | | | |
| පිරිවැය | | 23,567,654 | 129,706,335 | 111,280,176 | 7,612,955 | 228,842,382 | 39,197,550 | 8,846,898 |
| ප්‍රත්‍යාගණනය | 676,552,750 | | 311,884,530 | | | | | |
| ගැලපීම් | | | | | | | (76,160) | |
| සමුච්චිත ක්ෂය | | (3,770,741) | (37,955,734) | (98,921,723) | (6,265,481) | (228,842,385) | (30,337,142) | (8,587,613) |
| **ශුද්ධ පොත් මුළු වටිනාකම** | **676,552,750** | **19,796,913** | **403,635,131** | **12,358,453** | **1,347,474** | **(3)** | **8,784,250** | **259,285** |
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 676,552,750 | 19,796,913 | 403,635,131 | 12,358,453 | 1,347,474 | (3) | 8,784,250 | 259,285 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | 2,586,362 | - | - | - | 34,000 | - |
| පෙර වර්ෂයේ ගැළපීම්වලින් පසුව ශුද්ධ ආරම්භක පොත් වටිනාකම | 676,552,750 | 19,796,913 | 406,221,494 | 12,358,453 | 1,347,474 | (3) | 8,818,250 | 259,285 |
| එකතුකිරීම් | 67,595,691 | - | 15,897,195 | 2,319,957 | - | - | 1,029,643 | 2,706,555 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | (3,587,762) | - |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 9) | (577,667) | - | (11,396,473) | (3,705,189) | (249,437) | - | (1,694,709) | (275,328) |
| වත්කම් නැවත තක්සේරු කිරීමට ශුද්ධ පොත් වටිනාකම් මාරුකිරීමේ ගිණුම | | | | (10,973,222) | (1,098,038) | | (8,153,183) | (2,690,512) |
| බැහැර කළ වත්කම් සඳහා ගිණුම් ක්ෂය | | | | | | | 3,587,762 | |
| ප්‍රත්‍යාගණනය | - | - | - | 45,671,000 | 1,213,500 | - | 5,657,000 | - |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **743,570,774** | **19,796,913** | **410,722,216** | **45,671,000** | **1,213,500** | **(3)** | **5,657,000** | **-** |
| **2015 දෙසැම්බර් 31 දිනට** | | | | | | | | - |
| පිරිවැය | 767,716,095 | - | 457,488,060 | (0) | - | 228,842,382 | 0 | - |
| ප්‍රත්‍යාගණනය | - | - | - | 45,671,000 | 1,213,500 | - | 5,657,000 | - |
| සමුච්චිත ක්ෂය | (4,348,408) | - | (46,765,844) | - | - | (228,842,385) | - | - |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **763,367,687** | **-** | **410,722,216** | **45,671,000** | **1,213,500** | **(3)** | **5,657,000** | **-** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 13. 2015.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | ගමන් මලු | ලී බඩු සහ සවිකිරීම් | බයිසිකල් පිරිවැය | උපකරණ සහ අමතර කොටස් | පුස්තකාල පොත් | PABX සේවා | උපයෝජ්‍ය සේවා |
|---|---|---|---|---|---|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 38,910 | 5,997,884 | 70,411 | 317,926 | 496,373 | 1,302,274 | 1,705,259 |
| කාල පරිච්ඡේදය තුළ එකතුකිරීම් | 18,800 | - | - | - | 308,266 | 11,620 | - |
| ගැලපීම් | | | | | 1,625,075 | | |
| ගැලපීම් | | | | | | | |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 8) | (20,616) | (1,094,915) | (10,308) | (98,130) | (233,599) | (269,934) | (340,464) |
| ගැලපීම් | | | | | (500,884) | | |
| ගැලපීම් | | | | | | | |
| ප්‍රත්‍යාගණනය | | | | | | | |
| **ශුද්ධ පොත් අවසන් වටිනාකම්** | **37,094** | **4,902,969** | **60,103** | **219,796** | **1,695,231** | **1,043,960** | **1,364,795** |
| **2014 දෙස්ම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 1,234,805 | 14,556,563 | 198,838 | 10,530,926 | 12,027,618 | 4,214,731 | 15,864,011 |
| ප්‍රත්‍යාගණනය | | | | | | | |
| ගැලපීම් | | | | | | | |
| සමුච්චිත ක්ෂය | (1,197,711) | (9,653,594) | (138,734) | (10,311,130) | (10,332,387) | (3,170,771) | (14,499,217) |
| **ශුද්ධ පොත් මුළු වටිනාකම** | **37,094** | **4,902,969** | **60,103** | **219,796** | **1,695,231** | **1,043,960** | **1,364,795** |
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 37,094 | 4,902,969 | 60,103 | 219,796 | 1,695,231 | 1,043,960 | 1,364,795 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | (500,369) | 2,000 | - |
| පෙර වර්ෂයේ ගැළපීම්වලින් පසුව ශුද්ධ ආරම්භක පොත් වටිනාකම | 37,094 | 4,902,969 | 60,103 | 219,796 | 1,194,862 | 1,045,960 | 1,364,795 |
| එකතුකිරීම් | 36,200 | 1,482,326 | 13,063 | 761,173 | 168,463 | 94,000 | - |
| බැහැර කිරීම් | - | - | (17,425) | - | - | - | - |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 9) | (20,781) | (1,124,472) | (10,762) | (177,272) | (820,223) | (279,484) | (327,848) |
| වත්කම් නැවත තක්සේරු කිරීමට ශුද්ධ පොත් වටිනාකම් මාරුකිරීමේ ගිණුම | | (5,260,823) | (62,404) | (803,698) | | | |
| බැහැර කළ වත්කම් සඳහා ගිණුම් ක්ෂය | | | 17,425 | | | | |
| ප්‍රත්‍යාගණනය | - | 5,456,750 | 250,000 | - | - | - | - |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **52,513** | **5,456,750** | **250,000** | **-** | **543,102** | **860,476** | **1,036,947** |
| **2015 දෙසැම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 1,271,005 | (0) | - | - | 12,196,081 | 4,308,731 | 15,864,011 |
| ප්‍රත්‍යාගණනය | - | 5,456,750 | 250,000 | - | - | - | - |
| සමුච්චිත ක්ෂය | (1,218,492) | - | - | - | (11,652,979) | (3,448,255) | (14,827,064) |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **52,513** | **5,456,750** | **250,000** | **-** | **543,102** | **860,476** | **1,036,947** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 13. 2015.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | විවිධ වත්කම් | පරිගණක සහ සංනිවේදන උපකරණ | පරිගණක මෘදුකාංග | මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 3,436,733 | 11,106,648 | (0) | 12,217,731 | **243,201,769** |
| කාල පරිච්ඡේදය තුළ එකතුකිරීම් | 590,781 | 2,655,615 | - | | **25,783,741** |
| ගැලපීම් | (6,845,707) | (7,350) | | (5,954,570) | **(6,224,089)** |
| ගැලපීම් | | | | | **9,262,829** |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 8) | (581,337) | (3,958,081) | | (6,059,328) | **(24,566,743)** |
| ගැලපීම් | 5,143,203 | (526) | | | **(84,049,576)** |
| ගැලපීම් | | | | (203,834) | **(8,247,033)** |
| ප්‍රත්‍යාගණනය | | | | 39,550,000 | **1,027,987,280** |
| **ශුද්ධ පොත් අවසන් වටිනාකම්** | **1,743,674** | **9,796,306** | **(0)** | **39,550,000** | **1,183,148,184** |
| **2014 දෙස්මබර් 31 දිනට** | | | | | |
| පිරිවැය | 10,966,554 | 48,428,692 | 987,850 | 1,295,433 | **669,359,972** |
| ප්‍රත්‍යාගණනය | | | | 39,550,000 | **1,027,987,280** |
| ගැලපීම් | (1,702,503) | (7,876) | | | **(1,786,540)** |
| සමුච්චිත ක්ෂය | (7,520,377) | (38,624,510) | (987,850) | (1,295,433) | **(512,412,532)** |
| **ශුද්ධ පොත් මුළු වටිනාකම** | **1,743,674** | **9,796,306** | **(0)** | **39,550,000** | **1,183,148,184** |
| **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 1,743,674 | 9,796,306 | (0) | 39,550,000 | **1,183,148,184** |
| පෙර වර්ෂයේ ගැළපීම් | 10,524 | (3,210) | - | - | **2,129,307** |
| පෙර වර්ෂයේ ගැළපීම්වලින් පසුව ශුද්ධ ආරම්භක පොත් වටිනාකම | 1,754,198 | 9,793,096 | (0) | 39,550,000 | **1,185,277,491** |
| එකතුකිරීම් | 1,542,646 | 4,987,409 | - | - | **98,634,320** |
| බැහැර කිරීම් | - | (7,088,832) | - | - | **(10,694,019)** |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 9) | (355,843) | (3,845,927) | - | (7,910,000) | **(32,771,415)** |
| වත්කම් නැවත තක්සේරු කිරීමට ශුද්ධ පොත් වටිනාකම් මාරුකිරීමේ ගිණුම | (2,941,001) | (10,934,577) | 0 | (20,324,000) | **(63,241,457)** |
| බැහැර කළ වත්කම් සඳහා ගිණුම් ක්ෂය | | 7,088,832 | | | **10,694,019** |
| ප්‍රත්‍යාගණනය | 1,702,205 | 7,487,409 | - | 42,000,000 | **109,437,864** |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **1,702,205** | **7,487,409** | **-** | **53,316,000** | **1,297,336,805** |
| **2015 දෙසැම්බර් 31 දිනට** | | | | | |
| පිරිවැය | (0) | (0) | 987,850 | 14,154,501 | **1,502,828,716** |
| ප්‍රත්‍යාගණනය | 1,702,205 | 7,487,409 | - | 42,000,000 | **109,437,864** |
| සමුච්චිත ක්ෂය | - | (0) | (987,850) | (2,838,500) | **(314,929,777)** |
| **ශුද්ධ පොත් මුළු ගණන** | **1,702,205** | **7,487,409** | **-** | **53,316,001** | **1,297,336,805** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**14** ස්ථාවර තැන්පතු

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - ඉඩම ශාඛාව | 25,000 | 31,000 |
| මහජන බැංකුව | 11,104,111 | 10,505,959 |
| | 11,129,111 | 10,536,959 |

**15** තොග සහ කෙරෙමින් පවතින වැඩ

| | **2015** | **2014** |
|---|---|---|
| ඉංජිනේරු අමුද්‍රව්‍ය - (ප්‍රධාන කාර්යාලය) | 1,054,434 | 1,073,494 |
| මුද්‍රණ අමුද්‍රව්‍ය | 140,668 | 145,223 |
| ලිපිද්‍රව්‍ය | 1,890,847 | 2,007,499 |
| වෙනත් අමුද්‍රව්‍ය | 2,233,136 | 1,865,500 |
| ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ තොග | 7,621,843 | 6,502,888 |
| උප ගබඩාව - වාත්තු වැඩපොළ | 2,329,633 | 3,106,776 |
| උප ගබඩාව - රබර් | 4,843,280 | 6,006,949 |
| උප ගබඩාව - සම් | 144,616 | 226,026 |
| උප ගබඩාව - පො.සේ.ම.- මාතර | 107,580 | 122,984 |
| උප ගබඩාව - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 947,855 | 978,880 |
| උප ගබඩාව - යෝ.තා.ප.සං.ම. පන්නල | 1,052,936 | 897,722 |
| උප ගබඩාව - දිවිනැගුම | 138,555 | 138,555 |
| උප ගබඩාව - කිතුල් සංවර්ධන වැඩසටහන | 5,837,942 | 5,221,932 |
| පිත්තල මධ්‍යස්ථානය - පිළිමතලාව | 178,367 | 318,612 |
| කෙරෙමින් පවතින වැඩ - සෘජු ද්‍රව්‍ය (ප්‍රධාන කාර්යාලය) | 335,496 | 605,281 |
| කෙරෙමින් පවතින වැඩ - සෘජු ශ්‍රමය | 63,636 | 192,357 |
| කෙරෙමින් පවතින වැඩ - සාමාන්‍ය පොදුකාර්ය | 30,418 | 123,500 |
| කෙරෙමින් පවතින වැඩ - කර්මාන්තශාලා පොදුකාර්ය | 14,387 | 69,915 |
| යකඩ නොවන ලෝහ අබලි | 8,458,614 | 4,303,513 |
| චලනය නොවන තොග හානිකරණය සඳහා ප්‍රතිපාදන | (1,584,236) | (1,584,236) |
| කල් ඉකුත්වූ තොග හානිකරණය සඳහා ප්‍රතිපාදන | (1,464,321) | (1,464,321) |
| | **34,375,687** | **30,859,050** |

**16** වෙළඳ සහ අනෙකුත් අයවිය යුතු දෑ

| | **2015** | **2014** |
|---|---|---|
| විවිධ ණයගැතියෝ - ප්‍රධාන කාර්යාලය | 264,713 | 264,713 |
| විවිධ ණයගැතියෝ - සම් | 18,270 | 18,270 |
| විවිධ ණයගැතියෝ - ඉංජිනේරු | 604,611 | 599,611 |
| විවිධ ණයගැතියෝ - ඉංජිනේරු - (වැඩපොළ) | 18,327,913 | 20,218,991 |
| විවිධ ණයගැතියෝ - රබර් අංශය | 1,919,979 | 1,217,201 |
| විවිධ ණයගැතියෝ - යෝ.තා.ප.සං.ම. පන්නල | 2,147,128 | 1,388,715 |
| විවිධ ණයගැතියෝ - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 73,272 | 53,795 |
| විවිධ ණයගැතියෝ - මුද්‍රණ | 374,061 | 374,061 |
| විවිධ ණයගැතියෝ - විදුලි | 701,826 | 701,826 |
| විවිධ ණයගැතියෝ - වාත්තු වැඩපොළ | 4,399,365 | 4,399,365 |
| විවිධ ණයගැතියෝ - සිවිල් | 2,155,803 | 2,155,803 |
| විවිධ ණයගැතියෝ - ලක්නිපැයුම් | 42,120 | 42,120 |
| විවිධ ණයගැතියෝ - පො.සේ.ම. - මාතර | 346,492 | 60,317 |
| විවිධ ණයගැතියෝ - පො.සේ.ම. අ'පුර | 15,025 | 15,025 |
| ණයගැතියෝ - ආපසු එවූ චෙක්පත් | 209,398 | 209,398 |
| බදුකරු ණයගැතියෝ | 34,342,809 | 33,028,715 |
| විවිධ ණයගැතියෝ | 406,707 | 406,707 |
| | 66,349,491 | 65,154,632 |
| අඩු කළා: බොල් සහ අඩමාන ණය හානිකරණය සඳහා ප්‍රතිපාදන | (32,780,778) | (36,909,013) |
| | **33,568,714** | **28,245,619** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**17 අනෙකුත් ජංගම වත්කම්**

| | 2015 | 2014 |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 376,600 | 617,300 |
| යතුරු පැදි ණය | 803,735 | 1,261,046 |
| පාපැදි අත්තිකාරම් | 225,254 | 281,104 |
| ආපදා ණය | 38,759,161 | 37,739,859 |
| අඩුකළා - ප්‍රමාදවූ කාර්ය මණ්ඩල පිරිවැය | (37,226,305) | (37,226,305) |
| විශේෂ අත්තිකාරම් පොත | 12,700 | 11,900 |
| අනෙකුත් දෙපාර්තමේන්තුවලින් ලැබිය යුතු | 454,978 | 421,933 |
| මැතිවරණ කොමසාරිස්ගෙන් ලැබිය යුතු | (54,446) | - |
| උප කොන්ත්‍රාත් හුවමාරු | 837,418 | 837,418 |
| හැකියා සංවර්ධන | 1,456,826 | 1,227,381 |
| රඳවාගැනීම් බද්ද | 1,679,828 | 1,679,834 |
| භාණ්ඩ හා සේවා බද්ද ( G S T ) | 1,424,654 | 1,424,654 |
| ලැබිය යුතු වැට් | 25,476,691 | 16,843,917 |
| හම්බන්තොට ගම සඳහා අයවිය යුතු මුදල් | - | 2,020,949 |
| යකඩ නොවන - වැට් | 10,741,854 | 10,741,854 |
| අවිනිශ්චිත ගිණුම | - | 6,524 |
| කිතුල් - අලෙවිකරණ | 281,675 | 281,675 |
| යකඩ නොවන පාලන ගිණුම | 742,661 | 742,661 |
| ලක්කම් ණයහිමියෝ | 1,407,159 | 21,902 |
| ආර්ථික සේවා ගාස්තු | 170,872 | 170,872 |
| | **47,571,314** | **39,106,477** |

**18 තැන්පතු සහ පූර්ව ගෙවීම්**

| | 2015 | 2014 |
|---|---|---|
| ආරක්ෂක තැන්පතු | 229,428 | 218,267 |
| පූර්ව ගෙවීම් | 19,211,842 | 29,991,070 |
| පූර්ව ගෙවීම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (7,226,319) | (7,226,319) |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් - (ප්‍රධාන කාර්යාලය) | 192,206 | 192,206 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 1,203,306 | 1,024,062 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (560,073) | (560,073) |
| කාර්යමණ්ඩලය සඳහා ඉන්ධන අත්තිකාරම් - (ප්‍රධාන කාර්යාලය) | 261,882 | 269,862 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (235,612) | (235,612) |
| ගමන්වියදම් අත්තිකාරම් | - | 6,000 |
| ලැබිය යුතු වෙනත් තැන්පතු | 3,004,926 | 3,004,926 |
| කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය (IFRs ගැලපීම්) | 37,226,305 | 37,226,305 |
| ගමන්වියදම් අත්තිකාරම් (විදේශීය) | 190,620 | 190,620 |
| | **53,498,511** | **64,101,314** |

| **19 විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන** | **2015** | **2014** |
|---|---|---|
| සේවා මධ්‍යස්ථානය සහ බෙදාහැරීම සඳහා තොගයේ ඇති භාණ්ඩ | 15,540,765 | 11,097,019 |
| Casper ව්‍යාපෘතිය - අමාත්‍යාංශය | 16,872,541 | 10,898,904 |
| දිවිනැගුම ව්‍යාපෘතිය - ගෘහ කර්මාන්ත | 4,096,018 | 4,077,042 |
| **විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්** | **36,509,324** | **26,072,964** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**20 මුදල් සහ බැංකු ශේෂ**

| ගිණුම් කේතය | ගිණුම් අංක | 2015 | 2014 |
|---|---|---|---|
| බැංකු ගිණුම - ලක්නිපැයුම් - පොළොන්නරුව | | 11,605 | 11,605 |
| 185065 දිවිනැගුම ව්‍යාපෘතිය - ගෘහ කර්මාන්ත | **71889197** | (24,863) | 7,379 |
| 185200 ජංගම ගිණුම - IRDP - මාතර | **00022667-9** | 2,076 | 2,076 |
| 185080 ජංගම ගිණුම - උප කොන්ත්‍රාත් - අලෙවිකරණ | **683133** | 2,015,143 | 42,050 |
| 185040 ජංගම ගිණුම - ආපදා ණය | **683218** | 596,657 | 2,393,125 |
| 185010 ජංගම ගිණුම - ඉඩම - මොරටුව | **682974** | 2,112,336 | (1,784,411) |
| 185110 ජංගම ගිණුම - පැලියගොඩ - RPD&SC | **4064199** | 4,349,059 | 3,080,995 |
| 185020 ජංගම ගිණුම - ප්‍රාග්ධන ප්‍රදාන බැංකු ගිණුම | **683231** | (1,122,076) | 3,971,481 |
| 185030 බැංකු ශේෂය - ඉංජිනේරු අංශය | **683144** | 5,638,052 | 2,463,635 |
| 185050 බැංකු ශේෂය - REAP | **1118722801** | 15,697 | 15,697 |
| 185180 බැංකු ශේෂය - ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය | **4204245** | 218,749 | 2,252,445 |
| 185070 බැංකු ශේෂය - යකඩ නොවන | **682519** | 20,069,523 | 5,259,165 |
| 185060 බැංකු ශේෂය - ප්‍රාදේශීය අංශය (කිතුල්) | **683237** | 1,490,134 | 522,915 |
| 185412 ලංකා බැංකුව - "ඉඩම" අබලි ව්‍යාපෘතිය ඉතිරිකිරීමේ ගිණු | **7271240** | 179,891 | 172,849 |
| 185090 ජංගම ගිණුම - මහජන බැංකුව | **100153657035** | 10,000 | 10,000 |
| 185415 ජංගම ගිණුම - ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | **7153282** | 487,938 | 813,052 |
| 185015 ජංගම ගිණුම - නිදහස්කරන ලද හර බද්ද | **70034730** | 609,643 | 1,023,359 |
| 185125 දිස්ත්‍රික් කාර්යාලය - බැංකු ගිණුම (ප්‍රාදේශීය) | **74791255** | 1,195,770 | 1,911,023 |
| 185413 ඉතුරුම් ගිණුම - CESS අරමුදල | **9123868** | 11,528,630 | 11,114,909 |
| 185025 ඉතුරුම් ගිණුම - ප්‍රාග්ධන අරමුදල් | **71648764** | 29,178,407 | 3,265,242 |
| 185135 ඉතුරුම් ගිණුම - ජනපද තැන්පතු | **71582414** | 4,771,419 | 8,351,060 |
| අග්‍රිම ගිණුම | | 15,524 | 42,117 |
| විශේෂ අග්‍රිම - අයකැමි | | 23,379 | 23,379 |
| මාර්ගස්ථ මුදල් | | 25,783 | 24,690 |
| මාර්ගස්ථ මුදල් - ලෝහ අබලි ව්‍යාපෘතිය | | 12,540 | 12,540 |
| | | **83,411,015** | **45,002,376** |
| **හර ශේෂ** | | 84,557,954 | 46,786,787 |
| **ණය ශේෂ** | | (1,146,939) | (1,784,411) |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **83,411,015** | **45,002,376** |

**21 ශුද්ධ රාජ්‍ය දායකය**

| | 2015 | 2014 |
|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට රජයේ ප්‍රාග්ධන | 278,694,719 | 243,694,719 |
| 2015 වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 45,000,000 | 35,000,000 |
| මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | (45,784,637) | - |
| | **277,910,082** | **278,694,719** |

**22 පවරාදෙන ලද වත්කම්වල වටිනාකම**

| | 2015 | 2014 |
|---|---|---|
| 1969 ට පෙර කා.සං.ම. | 4,403,441 | 4,403,441 |
| කාර්මික ජනපද සංස්ථාව | 9,043,620 | 9,043,620 |
| | **13,447,061** | **13,447,061** |

**23 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය**

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙනා ශේෂය | 953,138,009 | (8,003,511) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 46,196,408 | 961,019,480 |
| | **999,334,417** | **953,015,969** |

**24 අනෙකුත් රජයේ ප්‍රදාන**

| | 2015 | 2014 |
|---|---|---|
| එ.ජා.සං.වැ. වෙතින් ලැබුණු ප්‍රදාන | - | 1,010,000 |
| මැටි සැකසුම් යන්ත්‍ර ප්‍රදාන | 29,250 | 58,500 |
| සෙස් අරමුදල | 10,500,000 | 10,500,000 |
| Sirap අරමුදල - ගොඩනැගිලි | 26,236,185 | 27,232,449 |
| Sirap අරමුදල - යන්ත්‍රසූත්‍ර | - | 458,850 |
| අමාත්‍යාංශ අරමුදල් අච්චුවෙලි | 16,932,430 | 17,407,084 |
| අමාත්‍යාංශ අරමුදල් කාර්මික ජනපද | 101,801,068 | 59,266,860 |
| ලෝහ නොවන | 10,000,000 | 10,000,000 |
| | **165,498,934** | **125,933,744** |

**25 රජයේ ප්‍රදාන**

| | 2015 | 2014 |
|---|---|---|
| ශේෂය | 1,930,291,117 | 1,930,291,117 |
| සමුච්චිත අලාභය | (2,136,683,921) | 2,146,388,663 |
| ගැලපීම් | (17,407,674) | (9,826,030) |
| ඉදිරියට ගෙනා හිගය | (21,831,796) | 19,530,771 |
| සමුච්චිත අලාභ | **(2,175,923,391)** | **(2,136,683,921)** |
| | **(245,632,274)** | **(206,392,804)** |

**26 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගන්නා ලද වටිනාකම් පහත සඳහන් පරිදි තීරණය කරනු ලැබේ:

| | 2015 | 2014 |
|---|---|---|
| අරමුදල් සපයා නොමැති බැදීම්වල වර්තමාන වටිනාකම | 155,623,529 | 100,395,508 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම** | **155,623,529** | **100,395,508** |

වර්ෂය තුළ නිර්වචිත ප්‍රතිලාභ බැදීම්වල චලනය පහත සඳහන් පරිදි වේ:

| | 2015 | 2014 |
|---|---|---|
| ජනවාරි 01 වැනි දිනට | 100,395,508 | 115,063,782 |
| වර්තමාන සේවා පිරිවැය | 9,896,983 | 6,627,285 |
| පොළී පිරිවැය | 6,639,630 | 6,950,372 |
| පශ්චාත් සේවා ප්‍රතිලාභ බැදීම් මත ආයුගණක පාඩුව / (ලාභය) | 49,090,907 | (19,111,460) |
| | **166,023,028** | **109,529,980** |
| ගෙවූ ප්‍රතිලාභ | (10,399,498) | (9,134,472) |
| **මාර්තු 31 දිනට** | **155,623,529** | **100,395,508** |

භාවිතා කරන ලද මූලික ආයුගණක උපකල්පන පහත සඳහන් පරිදි විය:

| | 2015 | 2014 |
|---|---|---|
| **වට්ටම් අනුපාත** | | |
| අනාගත වැටුප් වැඩිවීම් | 5% | 5% |
| කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත | 7% | 7% |
| විශ්‍රාම ගැනීමේ වයස | 60 | 60 |

**27 විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන**

| | 2015 | 2014 |
|---|---|---|
| සුනාමි | 1,540,899 | 1,540,899 |
| ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති | 52,800,966 | 49,260,118 |
| කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය | 10,536,151 | 1,253,682 |
| අමාත්‍යංශ අරමුදල් දිවිනැගුම | 6,699,960 | 6,699,960 |
| තල මිලදී ගැනීම - යාපනය | 137,863 | - |
| | **71,715,838** | **58,754,659** |

**28 මණ්ඩල සහ සංස්ථාවට ගෙවිය යුතු හිග**

| | 2015 | 2014 |
|---|---|---|
| ගෙවිය යුතු සේ.අ.අ. හිග මුදල් | 32,348,955 | 51,758,331 |
| | **32,348,955** | **51,758,331** |

**29 රජයට ගෙවිය යුතු හිග**

| | 2015 | 2014 |
|---|---|---|
| දේශීය ආදායම් කොමසාරිස් | 28,879 | 28,879.00 |
| දේශීය ආදායම් කොමසාරිස් - මුද්දර ගාස්තු | 51,235 | 40,800.00 |
| | **80,114** | **69,679.00** |

**30 මණ්ඩල සහ සංස්ථාවලට ගෙවිය යුතු හිග**

| | | 2015 | 2014 |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව - සේ.අ.අ.. | | 3,138,778 | 3,218,069 |
| සේ.භ.අ. ගෙවිය යුතු හිග | 19,409,376 | - | - |
| කල් තබා ගෙවූ වාරික 2 | (3,234,896) | 16,174,480 | 6,469,792 |
| ගෙවිය යුතු සේ.නි.භා.අ. හිග | | 6,389,567 | 6,389,567 |
| සේවක භාරකාර අරමුදල | | 428,110 | 438,828 |
| **මණ්ඩල සහ සංස්ථාවට ගෙවිය යුතු හිග** | | **26,130,935** | **16,516,256** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 31 වෙළඳ සහ අනෙකුත් ණයහිමියෝ, වෙන්කිරීම් සහ උපචිත වියදම්

| | 2015 | 2014 |
|---|---|---|
| ලුණුවිල ජනපදය තැන්පතු | 1,458,835 | 1,458,835 |
| සේවක පරිත්‍යාග | 8,695 | 8,695 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද 2% | 3,165,169 | 1,640,769 |
| ගෙවිය යුතු කාර්යමණ්ඩල අවකරණ | (1,203) | 178,527 |
| ගෙවියයුතු උපයන විට බදු | 79,307 | 25,778 |
| විවිධ ණයහිමියෝ | 3,072,949 | 3,072,949 |
| විවිධ ණයහිමියෝ - ප්‍රධාන කාර්යාලය | 6,762,741 | 6,162,741 |
| විවිධ ණයහිමියෝ - යකඩ නොවන | 641,048 | 2,948,762 |
| අවිනිශ්චිත තැන්පතු | 1,113,704 | - |
| ගෙවියු යුතු වැටුප් | 1,991 | 1,991 |
| ලක්නිපැයුම් අලෙවි සහ ප්‍රදර්ශන මධ්‍යස්ථාන - ණය හිමියෝ | 92,398 | 74,898 |
| කාර්යය මත අත්තිකාරම් | 1,863,108 | 4,817,455 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 937,239 | 937,239 |
| ආරක්ෂක තැන්පතු | 229,428 | 218,267 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 42,123,248 | 33,858,338 |
| බෞද්ධ සංගමය පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 4,230 | 4,140 |
| සකසුරුවම් සමිතිය පාලන ගිණුම | 36,510 | 36,510 |
| අනෙකුත් දෙපාර්තමේන්තු පාලන ගිණුම | 61,061 | 44,639 |
| ගෙවිය යුතු ශත පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 2,379 | 2,354 |
| වෘත්තීය සමිති පාලන ගිණුම | 4,529 | 4,529 |
| රක්ෂණ පාලන ගිණුම | 994,798 | 709,462 |
| ගණුදෙනුකරුවන්ට වැඩිපුර ගෙවීම් | 2,077,120 | 627,948 |
| වෛද්‍ය යෝජනාක්‍රමය | 608,491 | 2,368,791 |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | 4,406,389 | 4,406,389 |
| උප කොන්ත්‍රාත් කෘෂි උපකරණ | 2,421,515 | 2,583,297 |
| උපචිත වියදම් | 38,925,438 | 24,673,699 |
| ලක්කම් ණය හිමියෝ | 1,930,587 | - |
| | **113,021,702** | **90,867,002** |

# මණ්ඩලයේ අදහස්

# දැක්වීම පිණිස

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | අයිඑම්යු/ඒ/අයිඩීබී/1/15/එෆ්ඒ | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2017 ඔක්තෝබර් 16 දින | | |

සභාපති

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 මාර්තු 14 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 29 හා 15 වගන්ති ප්‍රකාරව තීරණ ගැනීමේදී ප්‍රමාණාත්මකව වැදගත් වන විෂයයන් වෙන්ව නිරූපනය කල යුතු වුවත්, වටිනාකම රු.67,595,691 ක් වූ මණ්ඩලයේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්වල අගය එක්ව දක්වා තිබුණි. එසේම ඉඩම් වැඩිදියුණු කිරීම් සඳහා වූ රු.577,667 ක්වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය ඉඩම් යටතේම ගලපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

සෙමෙන් චලනය වන හා යල්පැනගිය තොග වෙනුවෙන් වෙන්කිරීම් රු.3,048,557 ක් ප්‍රමිතයේ 29 වගන්තිය ප්‍රකාරව කිසිදු සමාලෝචනයකින් තොරව 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 36 වගන්තිය අනුව, යම් වත්කම් පන්තියක ප්‍රත්‍යාගණනයක් සිදු කරන්නේ නම් ඊට අදාළ සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ වත්කම් ප්‍රත්‍යාගණනයේදී මණ්ඩලය භාවිතා කරන මෝටර් වාහන 40 ක් අතුරින් මෝටර් වාහන 25 ක් පමණක් ප්‍රත්‍යාගණනයට ලක් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

ප්‍රමිතයේ 24 සිට 29 දක්වා වගන්තිවලට අනුකූලව කටයුතු කිරීමෙන් තොරව 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු රු.36,509,323 ක් වූ විශේෂ ව්‍යාපෘතීන් සඳහා වූ රාජ්‍ය ප්‍රදාන, ජංගම වත්කම් යටතේද එදිනට මණ්ඩලය වෙත ලැබී තිබුණු රු.71,715,838 ක් වූ මුළු රාජ්‍ය ප්‍රදාන, ජංගම නොවන වගකීම් ලෙසද දක්වා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36

භාවිතයෙන් ඉවත් කර තිබූ ප්‍රත්‍යාගණිත අගය රු. මිලියන 2.5 ක් වටිනා ජංගම තාක්ෂණ සේවා බස් රථය සම්බන්ධයෙන් ප්‍රමිතයේ ප්‍රකාරව හානිකරණය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, යන්ත්‍රෝපකරණ, විවිධ වත්කම් සහ පරිගණක යන වත්කම් කාණ්ඩ තුළ පිළිවෙලින් එම කාණ්ඩවලට අයත් නොවන එකතු වටිනාකම රු.2,703,783 ක් වූ වෙනත් වත්කම් ඇතුළත් වී තිබූ අතර ක්ෂය අනුපාත එකිනෙකට වෙනස්වීම හේතුවෙන් එම වත්කම්වල ශුද්ධ අගය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 03 කට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් තැන්පතු ශේෂය රු.2,300,062 ක් වූ අතර මෙම ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්මික ජනපද අංශයෙන් ලබාදුන් වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට කාර්මික ජනපදවල කර්මාන්තකරුවන්ගෙන් මණ්ඩලයට අයවිය යුතු මුදල සහ එදිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟ ශේෂය අතර එකතුව රු.13,473,162 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව, දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය සහ ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ ශේෂයන් අතර එකතුව රු. 6,232,030 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අවසන් තොග ලෙස දක්වා තිබූ තොග අයිතමයන් 14 කට අදාළ ශේෂයන්ගේ එකතුව තොග සමීක්ෂණ වාර්තාව සමග සැසඳීමේදී රු.522,972ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, අබලි යකඩ එක් රැස් කර විකිණීමේ ව්‍යාපෘතියේ තොග වටිනාකම රු.8,458,614 ක් වුවද විගණනය සඳහා ලබාදුන් තොග වාර්තා අනුව එම වටිනාකම රු.2,746,359 ක් වූයෙන් රු.5,712,255 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ මිලදීගෙන තිබූ අබලි යකඩ තොගයේ වටිනාකම රු.78,105,492 ක් වුවත් ඊට අදාළ උපලේඛනය අනුව එම වටිනාකම රු.67,397,042 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩ සටහන් වලින් ලද ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය අංශයේ ආදායම් වාර්තා සහ එම වැඩසටහන් සංවිධානය කරනු ලැබූ මණ්ඩලයේ එක් එක් අංශවල වාර්තා අතර එකතුව රු.5,582,169 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.1,113,704 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඉන් රු.374,027 ක ශේෂ 2017 ජුනි 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සේවා ආදායම් තුළ ඇතුළත්ව තිබුණු රු.4,047,845 ක අභ්‍යන්තර විකුණුම් ආදායම සනාථ කරගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) මණ්ඩලයේ වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු මණ්ඩලයේ සේවයේ නිරත දේපළ තක්සේරුව පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරියෙකු විසින් සිදු කර තිබූ අතර, ප්‍රත්‍යාගණනය කරන ලද යන්ත්‍ර උපකරණ හා වෙනත් වත්කම් වල උපලේඛණය, 2015 දෙසැම්බර් 31 දිනට එම වත්කම් කාණ්ඩ යටතේ ලබාදෙන ලද වෘත්තීමය තක්සේරුව යනාදී තොරතුරු 2017 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබූ ලක්කම් ණයහිමි ගිණුමේ පැවති රු.1,407,159 ක් වූ අසාමාන්‍ය හර ශේෂය සහ ජංගම බැරකම් යටතේ දක්වා තිබූ රු.1,930,587 ක බැර ශේෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සහ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබූ එකතුව රු.8,765,537 ක කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර එම ශේෂයට එරෙහිව මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදු කර තිබුණි. තවද, වෙනත් ජංගම වත්කම් යටතේ වර්ෂ ගණනාවක් තිස්සේ අඛණ්ඩව දක්වා තිබූ එකතුව රු.15,597,281 ක් වූ අක්‍රීය ශේෂ, නිවැරදිව හඳුනාගෙන අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට එකතුව රු.2,443,961 ක තැන්පතු හා කලින් ගෙවීම් අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුන අතර ඊට අදාළ උපලේඛන සමග පොදු ලෙජරයේ ඇතුළත් වූ සංඛ්‍යා කාලීනව සැසඳීම් නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,259,111 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.419,312 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,839,799 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු.46,750,000 කින් ඉහල යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.6,757,459 ක් වූ ඌනතාවය 2013 වර්ෂය වන විට රු.84,728,727 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර 2014 වර්ෂයේදී රු.419,312 ක අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනයේ දායකත්වය හිතකර අගයක් ගෙන තිබූ

අතර, 2011 වර්ෂයේදී එය රු.239,876,864 ක් වී තිබුණි. එහෙත් 2012 වර්ෂයේදී එය රු.224,882,033 ක් දක්වා අඩුවී තිබුණද ඉන්පසු වර්ෂවලදී අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.376,186,473 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාපනය කරන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම, හා සංවර්ධනය කිරීම වන අතර , කාර්මික ජනපද 19 ක් හා ප්‍රාදේශීය කාර්යාල 25 ක්ද, ඇතුළත්ව ඉංජිනේරු තාක්ෂණික සේවා, අලෙවි, රබර් සංවර්ධන සහ සම්භාණ්ඩ සංවර්ධන යනාදී අංශයන්ගෙන් සමන්විත වේ. මණ්ඩලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායමින් සියයට 49 ක් නියෝජනය වී තිබුණේ අබලි යකඩ එක් රැස්කර විකිණීමේ ව්‍යාපෘතියේ කටයුතුවලින් ලැබී තිබූ අතර මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන වාත්තු අංශය, වැඩ හල, සේවා මධ්‍යස්ථාන සහ අනෙකුත් මෙහෙයුම් කටයුතු වලින් ආදායමට ලැබී තිබුණේ සියයට 14 ක් වූ අවම දායකත්වයකි. මේ අනුව මණ්ඩලයේ මූලික අරමුණු ඉටුකරනු ලබන අංශ වල කාර්යසාධනය ඵලදායී නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) කාර්මික තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් පිහිටුවන ලද තාක්ෂණික සේවා අංශය ප්‍රධාන ක්‍රියාකාරකම් 08 ක් යටතේ ක්‍රියාත්මක වන අතර එම අංශය මගින් සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් 05 ක් පමණක් පවත්වා තිබීමෙන් කාර්මික තාක්ෂණ දැනුම හුවමාරු කිරීමේ ප්‍රගතිය මන්දගාමී බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ රබර් සංවර්ධන අංශය මගින් ක්‍රියාකාරකම් 14 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණු නමුත් නව ව්‍යාපාර බිහි කිරීම සහ විදේශීය වෙළඳපල ඉලක්ක කර ගත් ගුණාත්මක නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රමුඛ ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉංජිනේරු අංශය මගින් පවත්වා ගෙන යන වැඩහල මගින් නව නිර්මාණ බිහි කිරීම අපේක්ෂා කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු නව නිර්මාණයක් බිහි කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂ 03 ක කාලය තුළ කර්මාන්තකරුවන් වෙත නව නිර්මාණ 02 ක් පමණක් හඳුන්වාදීම තුළින් වැඩහල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව, පන්නල පිහිටි යෝග්‍ය තාප මධ්‍යස්ථානය මගින් බාහිර ආදායම් ජනනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් 229 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණද, ක්‍රියාකාරකම් 68 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. තවද මණ්ඩලයේ වාත්තු අංශය මගින් ක්‍රියාකාරකම් 100 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 10 ක් පමණි.

(iii) ශ්‍රී ලංකාව තුළ වාත්තු කටයුතු සම්බන්ධව තාක්ෂණික උපකරණ වර්ධනය කිරීම සඳහා රු 18,643,306 ක් වටිනා යන්ත්‍ර 1996 වර්ෂයේදී ජපන් රජයේ ආධාරයක් වශයෙන් මණ්ඩලය වෙත ලැබී තිබුණු නමුත් අදාළ යන්ත්‍ර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කළ හැකි වන පරිදි පුහුණු වැඩ සටහන් පැවැත්වීමට මණ්ඩලයේ ඉංජිනේරු අංශය කටයුතු කර නොතිබුණි.

(ඉ) කාර්මික තොරතුරු බාහිර පාර්ශ්වයන් වෙත සන්නිවේදනය කිරීම මණ්ඩලයේ සැලසුම් අංශය සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්ත සංගණනයක් පැවැත්වීමට සැලසුම් කර තිබුණු නමුත් එවැනි සංගණනයක් පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි මොරටුව කටුබැද්දේ පිහිටි ඉඩමේ නෛතික අයිතිය හා මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබූ අතර දීර්ඝ කාලයක් තිස්සේ වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

## 4.3 මූල්‍ය කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අයවැය ලේඛනය අනුව, ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනය රු.45,000,000 ක් වූ අතර එම මුදල වර්ෂය තුළ උපයෝජනය කිරීමට හැකි වන අයුරින් ප්‍රසම්පාදන කටයුතු කාලීනව සැලැසුම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව

ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයෙන් රු.19,280,501 ක් පුනරාවර්තන වියදම් වශයෙන් උපයෝජනය කර තිබුණි. තවද, ඉදිකිරීම් කටයුතු සඳහා රු.6,500,000 ක මුදලක් වෙන්කර තිබුණු නමුත් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් නොවූ ඉදිකිරීම් කාර්යයන් 08 ක් සඳහා රු.2,784,253 ක් වැය කර තිබුණි.

(ආ) අබලි යකඩ සැපයුම්කරුවන් වෙත සම්පූර්ණ වටිනාකම අත්තිකාරම් වශයෙන් පළමු අවස්ථාවේදීම ගෙවා තිබුණු නමුත් අදාළ අබලි යකඩ නිශ්චිත කාල සීමාවක් තුළදී සැපයුම්කර නොතිබුණි. මේ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ද්‍රව්‍ය සැපයීමකින් තොරව රු.3,249,428 ක් සැපයුම්කරුවන් අත රඳවා ගෙන තිබුණි.

## 4.4 හඳුනාගත් පාඩු

මණ්ඩලය විසින් සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් නියමිත පරිදි ගණනය කර ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.39,965,665 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පිරිවැය රු.18,643,856 ක් වූ ස්පෙක්ට්‍රෝ මීටර් ඕරීස් 5500 නැමැති උපකරණය 2012 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයෙන් ඉංජිනේරු අංශයේ ගබඩා කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය, තනතුරු 714 කින් සමන්විත වන අතර 2015 දෙසැම්බර් 31 දිනට තනතුරු 227 ක පුරප්පාඩු පැවතුණි. මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ තනතුරු වන අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක්, අධ්‍යක්ෂ තනතුරු 04 ක්, සහකාර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 15 ක් හා සංවර්ධන නිලධාරි තනතුරු 30 ක් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩු වී පැවතුණි. තවද, ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී තනතුරු 94 ක් අනුමත වී පැවතියද ඉන් තනතුරු 86 ක් වර්ෂයට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. කෙසේ වෙතත්, ඉහත තනතුරු පිරවීමකින් තොරව විදුලි ඉංජිනේරු, මණ්ඩලීය ලේකම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ හා උපදේශක තනතුරු සඳහා පුද්ගලයින් 09 දෙනෙක් කාර්ය පැවරුම් පදනම මත බඳවා ගෙන තිබුණු අතර ඔවුන්ගේ දීමනා වශයෙන් රු.430,000 බැගින් මාසිකව වැය කර තිබුණි. මේ අතුරින් උපදේශක හා විධායක අධ්‍යක්ෂ යන තනතුරු බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් වී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ කටයුතු ජනගත කිරීම සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් දිවයින පුරා අනුයුක්ත කිරීම අවශ්‍ය කරුණක් වුවත්, කිලිනොච්චිය, නුවරඑළිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලවලට අවම වශයෙන් එක් ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරියෙකුවත් අනුයුක්ත කර නොතිබුණි. කෙසේවෙතත්, මාතර දිස්ත්‍රික් කාර්යාලයේ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් 05 දෙනෙකු වෙනුවට 06 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. තවද, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන අංශය සහ ගාල්ල, පුත්තලම, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලවල කළමනාකරණ සහකාර නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා අනුයුක්ත කර තිබුණු අතර කිලිනොච්චිය, මන්නාරම හා කෑගල්ල දිස්ත්‍රික් කාර්යාල වලට එක් නිලධාරියෙක් හෝ අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) වංචනික ක්‍රියාවන්ට සම්බන්ධ මණ්ඩලයේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය. ඒ අනුව පතරොම් කොපු අක්‍රමිකතාවයකට සම්බන්ධ නිලධාරියෙකු 2010 සැප්තැම්බර් 09 සිටද, තාක්ෂණික සේවා අංශයේ මුදල් අවභාවිතයක් සම්බන්ධ නිලධාරියෙකු 2014 දෙසැම්බර්19 සිටද, මඩකලපුව වාරි මාර්ග කාර්යාලයෙන් අබලි යකඩ මිලදී ගැනීම සම්බන්ධ ගනුදෙනුවට චෝදනා ලත් නිලධාරියෙකු 2012 ඔක්තෝබර් 16 සිටද වැඩ තහනමකට ලක්කොට ඇතත් ඉදිරි විනය ක්‍රියාමාර්ග 2015 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඈ) 1969 අංක 36 දරන කර්මාන්ත මණ්ඩල පනතේ 17 (අ) වගන්තියට පටහැනිව 2015 පෙබරවාරි 15 දිනැති අංක 116/ඒබීඩී/අයිඩීබී දරන ලිපිය මගින් වාණිජ හා කර්මාන්ත කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවූ විධායක අධ්‍යක්ෂක තනතුර සඳහා නිලධාරියෙකු පත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම අඛණ්ඩව ප්‍රමාද කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 22 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 13 විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. 2015 දෙසැම්බර් 09 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2015 දරන චක්‍රලේඛයේ 3.3 වන ඡේදය අනුව, වාර්ෂික ගිණුම් නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ප්‍රසාද දීමනා ලබාගැනීම සඳහා ඉටුකළ යුතු පූර්ව කොන්දේසියක් වුවද උක්ත චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව රු.4,042,375 ක ප්‍රසාද දීමනාවක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම තුළ මණ්ඩලයේ අංශවල ප්‍රාග්ධන අවශ්‍යතාවයන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.3 අයවැය ලේඛනමය පාලනය

මණ්ඩලයේ එක් එක් අංශ මගින් වාර්ෂික අයවැය ලේඛන වෙන් වෙන්ව පිළියෙල කර තිබුණු නමුත් මණ්ඩලය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

1971 අංක 38 දරන මුදල් පනත අනුව, වාර්ෂික වාර්තාව අදාළ වර්ෂය ඉකුත් වී මාස 10 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2013 හා 2014 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තා 2017 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | i. බැංකු සැසඳුම් ප්‍රකාශන ඊළඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් නොකිරීම.<br>ii. මුදල් තැන්පත් කිරීම හා ලදුපත් නිකුත් කිරීම අතර දිනයන් හි සැලකිය යුතු කාල පරාසයක් තිබීම.<br>iii. නිශ්චිත සැපයුම්කරුවන්ගෙන් වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය හඳුනාගත හැකි වන පරිදි ගිණුම් පද්ධතිය පවත්වා නොතිබීම හා මෙම ගිණුම් පද්ධතියේ ඇතුලත් කරන දත්ත වගකිව යුතු නිළධාරියකුගේ අධීක්ෂණයට ලක් නොවීම.<br>iv. විවිධ අංශ වල මූල්‍ය ගනුදෙනුවලට අදාළ ලියකියවිලි ගිණුම් අංශය වෙත කාර්යක්ෂමව රැස් නොකිරීම. |

| | | |
|---|---|---|
| (ආ) පුහුණු වැඩ සටහන් පැවැත්වීම | i. | මණ්ඩලයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉලක්ක කරන ලද වැඩ සටහන් සකස් නොවීම හා පසුවිපරම් නොකිරීම. |
| | ii. | සම්පත් දායකයින් තෝරාගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම. |
| | iii. | වැඩ සටහන්වලට අදාළ අයවැය ඇස්තමේන්තු පිළියෙල නොකිරීම. |
| (ඇ) ඉඩම් බදුදීම | i. | මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි බදු දීමේ ක්‍රමවේදයක් නොතිබීම. |
| | ii. | බදු ගිවිසුම් අත්සන් නොකර පැවතීම. |
| | iii. | කාර්මික ජනපද වල මණ්ඩලය විසින් බදු පදනම මත ඉඩම් ලබාදුන් කර්මාන්ත පිළිබද පසු විපරම් නොකිරීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
இலங்கை கைத்தொழில் அபிவிருத்திச் சபை
INDUSTRIAL DEVELOPMENT BOARD OF CEYLON
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
கைத்தொழில் மற்றும் வணிகம் பற்றிய அமைச்சு MINISTRY OF INDUSTRY AND COMMERCE
615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව, ශ්‍රී ලංකා.
615, காலி வீதி, கட்டுபெத்தை, மொரட்டுவ, இலங்கை.
615, Galle Road, Katubedda, Moratuwa, Sri Lanka.
Tel : +94-11-2605394,2624846-7,2605326-7
Fax : +94-11-2607002
E-mail : info@idb.gov.lk Web : www.idb.gov.lk

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) ( C) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ විමසුම් අංක 2.2.8 සිට වාර්තාවට අදාල සම්පූර්ණ පිළිතුර කාරුණිකව මේ සමඟ ඉදිරිපත් කරමි.

**2.2.8 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1) 2016.03.08 දිනැතිව මේ සම්බන්ධයෙන් මා විසින් ඔබ අමතා කල කරුණු පැහැදිලි කිරීමේ ලිපියේ පිටපතක් කරුණාවෙන් ඉදිරිපත් කරමි. ( ඇ: 01 )

2) එන්.සිකන්දර් මහතා වෙත මාසිකව රු.40,000/- බැගින් ගෙවීම් කර ඇත්තේ ඔහුගේ සේවය වෙනුවෙන් මණ්ඩලය විසින් ගෙවනු ලබන මාසික දීමනාව වේ.

3) මු.රෙ.115 ට පටහැනිව ගෙවූ නියැදි පරීක්ෂණයට ලක්කල රු.528,405/- ට අදාල විස්තරාත්මක තොරතුරු ( උදා: එක් එක් වවුචර් අංකය හා මුදල ) ලබාදෙන්නේ නම් මැනවි. එසේ ලද විට පරීක්ෂාකර බලා හේතු වාර්තා කල හැකිය.

4) ආයතනයේ කාර්ය සාධනය 2015 වර්ෂය තුල පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කරන ලද හෙයින් සේවකයන් වාර්ෂික ප්‍රසාද දීමනා දෙසැම්බර් මාසය තුලදී ලබාගැනිම වඩාත් උචිත හා අපේක්ෂාව වූ බව කළමනාකරණය වෙත නියෝජනය කරන ලද හෙයින්, දෙසැම්බර් මාසයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවකින් ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය ලබාගන්නා ලදී. වාර්ෂික ගිණුම් ප්‍රකාශන නියමිත පරිදි සකස් කොට අප්‍රේල් මස අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කලද විස්තරාත්මක අධ්‍යයනයක් කර අනුමැතිය ලබාදිය යුතු හෙයින්, ඊට අනුමැතිය ලබාදීම ඊට පසුව එළඹුන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම දක්වා දීර්ඝ විය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද විගස අවසාන ගිණුම විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

1) මූල්‍ය ප්‍රතිඵලය, සාපේක්ෂ වැඩිවීම හා පුනරාවර්තන ප්‍රධාන සම්බන්ධව ඔබගේ නිරීක්ෂණ සියල්ල නිවැරදිය. කෙසේ වෙතත් ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.419,312/- 2015 වර්ෂය වනවිට රු.60,140,257/- දක්වා වර්ධනය කරගෙන ඇත. වෙනත් ආදායම් ලෙස 2014 වර්ෂයේදී උපයාගත් Revaluation surplus රු.මිලියන 941.9 2015 වර්ෂයේදී රු.මිලියන 46 දක්වා අඩුවීම මෙයට ප්‍රධාන හේතුව විය. එම ආදායම් ප්‍රභවය සෑම වර්ෂයකටම අදාල නොවන්නකි. ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය කටයුතු සිදුකිරීම මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය වන අතර ඒ සඳහා රාජ්‍ය ප්‍රදාන උපයෝගි කරගනු ලැබේ.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 2015 වර්ෂයේදී සතුටුදායක මට්ටමක පවතී.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

නඩු 09 ට අදාල මුල්‍ය වටිනාකම් කෙතෙක්දැයි ගණනය කල නොහැකි හෙයින් අසම්භාව්‍ය බැරකම් වෙනුවෙන් වෙන් කිරීමක් සිදු නොකල අතර 2015 සංශෝධිත අවසාන ගිණුමේ සටහනක් මඟින් ඒ බැව් අනාවරණය කරමි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**(අ)** මෙම වැඩසටහන පැවැත්වීමේ මූලික අරමුණ ලෙස අප විසින් බලාපොරොත්තු වූයේ කළුතර දිස්ත්‍රික්කයට නව තාක්ෂණය මත පදනම් වූ ස්වයං රැකියා ආරම්භ කිරීමටත්, වෙළඳපොලක් සහිත කර්මාන්තයක් ආරම්භ කිරීමට තාක්ෂණය ලබාදීමත්ය. වර්තමානයේ සෑම නිවසකම ජංගම දූරකථන දෙකකට වැඩි ප්‍රමාණයක් ඇති අතර, බොහෝ පුද්ගලයින් අද වනවිට ජංගම දූරකථනයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීම සිදුකරයි.
මෙම දූරකථනවල ඇතිවන දෝෂ හඳුනා ගැනීමට ජංගම දූරකථන භාවිතා කරන සෑම පුද්ගලයෙකුටම නොහැකි අතර, ඒ සඳහා විශේෂ පුහුණුව ලැබූ පුද්ගලයින්ගේ සහාය ලබාගැනීමට අවශ්‍ය වේ. පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේදී අප ලබාගත් තොරතුරු අනුව.

- ❖ ජංගම දූරකථන අළුත්වැඩියා කරන්නන් ප්‍රධාන නගරවලට පමණක් සීමාවීම.
- ❖ ඒ හේතුව මත පාරිභෝගිකයන්ට නියමිත වේලාවට තම ජංගම දූරකථන අළුත්වැඩියා කරගැනීමට නොහැකිවීම.
- ❖ නියමිත මිලක් නොමැතිවීම.
- ❖ විශේෂයෙන්ම ඒ සඳහා නගරයට ඒමට සිදුවීම.

මෙම හේතු මත නගරයෙන් පිටත මෙම කර්මාන්තය සඳහා හොඳ වෙළඳපලක් ඇති බව පැහැදිලි වූ බැවින් මෙම වැඩසටහන දිස්ත්‍රික්කයටම ඉතා යෝග්‍ය වැඩසටහනක් ලෙස හඳුනාගන්නා ලදී.

අප මණ්ඩලයේ එම අවස්ථාවේ තිබූ එක් අරමුණක් වන්නේ ස්වයං රැකියා බිහි කිරීමයි. ඒ අනුව වැඩසටහනට 35 දෙනෙකු සහභාගි වූ අතර, ඉන් 11 දෙනෙකු ස්වයං රැකියා ආරම්භ කර ඇත. මින් එක් අයෙක් සුළු කර්මාන්තයක් ලෙස තව එක් අයෙකුට රැකියා අවස්ථා ලබාදී ආරම්භ කර ඇත.

ඒ අනුව බිහිවී ඇති රැකියා අවස්ථා ප්‍රමාණය 12 කි. මෙම වැඩසටහනේ ප්‍රතිඵල එක් වර්ෂයකට සීමාකල නොහැකි අතර, කාර්මික විද්‍යාලයේ වසරක් පාසා විද්‍යුත් තාක්ෂණ පාඨමාලාව හදාරන සිසුන් සඳහා මෙම දැනුම ලබාදෙන බැවින් වසර ගණනාවක් ඉදිරියට වැඩසටහනේ ප්‍රතිඵල තරුණ පිරිස් වෙත ලැබීමත්, ඒ තුලින් බිහිවන රැකියා ප්‍රමාණය රටේ රැකියා නියුක්තියට දායකවීමත් නිසා එය මෙම වැඩසටහන තුලින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභයක් ලෙස දැක්විය හැක.
නියැදි පරීක්ෂාවේදී 95% ක් කර්මාන්තයේ නියැලෙන්නේ නැති බව සඳහන් කලද 11 දෙනෙකු මෙම කර්මාන්තයේ නියැලී සිටින බව අප කල විමසුම අනුව පැහැදිල විය. පුහුණුලාභීන් විසින් ඒ බව ලිඛිතව අප වෙත දන්වා ඇති අතර අදාල ලිපි ඉදිරිපත් කල හැකිය.

ඒ අනුව මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යාංශයේ අරමුණුවලට මෙම වැඩසටහන තුලින් හානියක් සිදුවී නොමැති බව සඳහන් කරමි.

1. මෙම පුහුණුව තුලින් දිස්ත්‍රික්කය පුරා විසිර ඇති ජංගම දූරකථන අළුත් වැඩියා කිරීමේ කටයුතු පුළුල් කිරීම විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ගත්විට එහි මෙම දූරකථන අළුත්වැඩියා මධ්‍යස්ථාන නගරයටම පමණක් සිමාවිම, ගම්බද ප්‍රදේශවල කැඩී ගිය දූරකථන නගරයටම ගෙනැවිත් නැවත අළුත් වැඩියා කිරීම වෙනුවට ගම තුලින් බිහිවන ස්වයං රැකියාලාභීන් හට රැකියා අවස්ථා ලැබීම, වඩා ලාභදායි මිළට සේවා සපයා ගැනිමට හැකිවීම, ස්වයං රැකියාලාභීන්ගේ ආර්ථික ගැටළු විසඳීමට හැකිවීම මෙම වැඩසටහන පැවැත්වීමේ පරමාර්ථයකි.

2. පාසැල් හැරගිය තරුණයින් සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීම තුලින් ස්වයං රැකියා අවස්ථා ඇති කිරීම.

3. කාර්මික විද්‍යාල තුළ විද්‍යුත් තාක්ෂණ පාඨමාලාව හදාරන සිසුන් සඳහා අවශ්‍ය ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ තාක්ෂණ දැනුම එහි තාක්ෂණික සහායන් ලබාදෙන පිරිසට ලබාදීම.

4. වැඩසටහන මඟින් සාර්ථක ව්‍යවසායකයන් මඟින් ස්වයං රැකියා 20 ක් බිහිකර ගැනීම මඟින් රැකියා අවස්ථා 20 ක් ඇති කිරීම.

5. ප්‍රාදේශීයව පවත්නා ජංගම දුරකථන අළුත්වැඩියා ස්ථානනවල පවතින හිඟය අවම කිරීම සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් බිහිකරදීම.

6. කුරුණෑගල, අම්පාර සහ ගාල්ල දිස්ත්‍රික්කවල පිහිටි ආයතනවලට අවශ්‍ය පුහුණු ශ්‍රමය ලබාදීම.

**(ආ)** 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනතේ 15 වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ පරමාර්ථය වන්නේ ලංකාවේ කර්මාන්ත සංවර්ධනයට දායකවීමය. කර්මාන්ත සඳහා උනන්දු කරවීම, සංවර්ධනය කිරීම, කර්මාන්තකරුවන් අතර සමායෝජනය ආදි කරුණු රාශියකින් සමන්විත පනතේ එම පරමාර්ථ (ඇ.02) ලෙස අමුණා කාරුණිකව ඉදිරිපත් කරමි. මණ්ඩලය ලාභ ලැබිය යුතු යයි පනතේ සඳහන් නොවන අතර සේවය ලබාදීම ප්‍රධාන පරමාර්ථය වේ.

**(ඇ)** සේවාවන් සැපයීමට අමතරව කර්මාන්තරුවන්ට යකඩ අමුද්‍රව්‍ය ලබාදීමට මැදිහත්වීම මෙම අංශයේ ප්‍රධාන කර්තව්‍ය වන අතර ඒ තුළින් ලාභ ඉපයීමද සිදුවේ.

**(ඈ)** නිෂ්පාදන බිහිකිරීම සඳහා ඇණවුම් ලැබිය යුතු අතර ලද ඇණවුම් අඩුවීමත් 2015 වර්ෂයේ Non-Faros ආදායම ඉහල යාමත් ඔබ දක්වන අනුපාතික අඩුවීමට හේතු වී ඇත.

**(ඉ)** 2015 වර්ෂයේ කාර්මික ජනපද අංශයෙහි ආදායමේ සාපේක්ෂ දායකත්වය 26% සිට 22 % දක්වා අඩු වුවද ආදායම රු.මිලියන 48.780 සිට රු.මිලියන 50.890 දක්වා රු.මිලියන 2.110 කින් වැඩිවී ඇත. උපචිත පදනම මත ගිණුම් තබයි.

මෙසේ සාපේක්ෂ දායකත්වය අඩුවීමට හේතු වී ඇත්තේ එම වසරේ අබලි විකුණුම් වැඩිවීමය.

**(ඊ)** ඉංජිනේරු අංශය යටතේ වන වාත්තු අංශයේ ලේඛන ප්‍රකාර වාත්තු අංශයේ ආදායම් පහත පරිදිය.

2014 වර්ෂය රු.540,454.66

2015 වර්ෂය රු.1,219,011.20

2016 වර්ෂය රු.6,961,186.25

කරුණාකර වාත්තු අංශය නඩත්තු කරන ඇණවුම් හා ආදායම් ලේඛනය බලන්න.

**(උ)** යකඩ මිළට ගෙන ව්‍යාපාරයක් ලෙස යකඩ වැඩි මුදලට විකුණා ලාභ ලබමින් සිටි ගැණුම්කරුවන් ක්ෂේත්‍ර පරීක්ෂාව මඟින් පසුව හඳුනාගෙන යකඩ ආශ්‍රිත කර්මාන්ත සත්‍ය වශයෙන්ම සිදුකරන කර්මාන්තකරුවන් පමණක් රඳවා ගැනීමට ක්‍රියාකරන ලද හෙයින් මෙම තත්ත්වය ඇතිවී ඇත.

**(ඌ)** කාර්මික ජනපද අංශය වෙනුවෙන් 2015 වර්ෂය සඳහා වු ක්‍රියාකාරි සැලැස්ම තුල රු.6,710,000/- මුදලකට ඇස්තමේන්තු කරන ලද වැඩ සටහන් 05 ක් අන්තර්ගත වී නොමැති බව කරුණාවෙන් දන්වා සිටිමි.

## (එ) ප්‍රාදේශීය සංවර්ධන අංශය

### 4.1.එ.1

ප්‍රාදේශීය සංවර්ධන අංශයට වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රාග්ධන මුදල් මඟින් සිදුකරනු ලබන තාක්ෂණික පැවරුම් වැඩසටහන් ලාභ අපේක්ෂාවෙන් සැලසුම් නොකලද වියදමෙන් 50% ක් ඉපයීමේ අරමුණින් තාක්ෂණික පැවරුම් වැඩසටහන් සැලසුම් කර ඇත. එසේ වුවද ප්‍රාදේශීය වැඩසටහන්වල ස්වභාවය අනුව වැඩසටහනේ පිරිවැයෙන් 30% - 60% අතර ප්‍රමාණයන් ආදායම ලෙස ලබාගැනීම සිදුකර ඇත. එසේම සමහර දිස්ත්‍රික්ක කිසිදු මුදලක් අය නොකර තාක්ෂණික වැඩසටහන් පවත්වා ඇත. උදා:ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, වාර්ෂිකව වෙන්කල ප්‍රාග්ධන මුදල් එසේ වැය කලද බාහිර පාර්ශවයන් වෙතින් ලබාගන්නා අරමුදල් වලින් පවත්වනු ලබන තාක්ෂණික පැවරුම් වැඩසටහන් සඳහා යම් ලාභ ප්‍රතිශතයක් තබාගැනීම සිදු කරයි.

පුත්තලම, පොළොන්නරුව හා මුලතිව් ආදි දිස්ත්‍රික්ක කිහිපයක් බාහිර පාර්ශවයන්ගෙන් අරමුදල් ලබාගෙන සිදුකල පුහුණු වැඩසටහන් නිසා අප විසින් අපේක්ෂිත වැඩසටහන් ප්‍රමාණ ඉක්මවා තාක්ෂණික පැවරුම් වැඩසටහන් පැවැත්වීමට සිදුවී ඇත. එසේම තාක්ෂණික පැවරුම් වැඩසටහන්වලට සහභාගිවූ සංඛ්‍යාවද අපේක්ෂිත සංඛ්‍යාව ඉක්මවීම නිසා ඒකපුද්ගල වියදම අඩුවී ඇත.

ඕනෑම වැඩසටහනක් පැවැත්වීමේදී ඒ සඳහා සහභාගි විය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 25 – 30 අතර විය යුතු බව ක්ෂේත්‍රයේ විද්වතුන් ගේ පිළිගැනීමයි. එම නිසා එක් වැඩසටහනකට 20 ක සංඛ්‍යාවක් අපේක්ෂා කර ඇතිවිට ඊට 25 දෙනෙකු සහභාගිවීම තාක්ෂණික වැඩසටහනක ගුණාත්මක බව පහළ යාමට හේතු නොවේ. අපේක්ෂිත ආදායම් මට්ටම ඉහළ යාමට බලපා ඇති ප්‍රධාන හේතුව වන්නේ බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා බාහිර පාර්ෂවයන්ගෙන් වැඩසටහන් සඳහා ලැබූ ඉල්ලුම ඉහල යාම නිසා ලැබූ ආදායම විය.

**උදා :** ( ප්‍රගති වාර්තාවට අනුව )

| | ආදායම් ඉලක්කය | සත්‍ය ඉපයීම |
|---|---|---|
| මුලතිවු දිස්ත්‍රික්කය | රු.150,000.00 | රු.1,374,100.00 |
| පුත්තලම දිස්ත්‍රික්කය | රු.200,000.00 | රු.1,216,467.00 |
| අම්පාර දිස්ත්‍රික්කය | රු.150,000.00 | රු. 564,982.00 |
| පො.දිස්ත්‍රික්කය | රු.175,000.00 | රු.1,129,610.00 |

සමාලෝචිත වර්ෂයේ පුහුණු වැඩසටහන් වලින් අපේක්ෂිත ආදායම රු.4,375,000.00 කි. ලැබී ඇති ආදායම රු.8,909,191.00 කි.

එසේම බාහිර පාර්ශවයන් ගෙන් මුදල් ලබානොගෙන කරනු ලබන පුහුණු වැඩසටහන්වල දී වුවද පුහුණුලාභීන්ගෙන් කිසියම් මුදලක් සෑම පුහුණු වැඩසටහනකදීම අයකර ඇත. එය බොහෝ විට වැඩසටහනේ පිරිවැයෙන් 30% - 60% අතර ප්‍රමාණයක් වේ. එයද ආදායම ඉහල යාමට හේතු වී ඇත.

### 4.1.එ.2

මෙම ක්‍රියාකාරකම් ත්‍රිත්වය පිළිබඳ කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොමැති බව විගණන විමසුමේ සඳහන් වුවද එහිදී ඇතිකර ගෙන ඇති ප්‍රගතිය මෙසේය.

| | බලාපොරොත්තු ආදායම රු. | සත්‍ය ආදායම රු. | % |
|---|---|---|---|
| 5. ව්‍යාපෘති වාර්තා/ශක්‍යතා අධ්‍යයන | 1,300,000.00 | 615,698.00 | 47 |
| 6. තක්සේරු වාර්තා | 625,000.00 | 124,233.00 | 20 |
| 9. විනිශ්චය අධ්‍යානයන් | 1,700,000.00 | 28,475.00 | 0.02 |
| **එකතුව** | **3,625,000.00** | **768,406.00** | **21** |

ඉදිරියේදී අපහසු වුවද යථාර්ථයට සමීප වන ලෙස ඇස්තමේන්තු සකස් කරන ලෙස අදාල පාර්ශවයන්ට උපදෙස් ලබාදෙමි.

**4.1.එ.3**

අබලි ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කිරීමේදී අබලි මිළදී ගැනීමට යන වියදම හා ඉන් ලබන ආදායම ඇස්තමේන්තු කර ඇත. නමුත් වාර්තා කිරීමේදී අබලි ප්‍රමාණ විකිණීමෙන් ලබන ආදායම සම්පූර්ණයෙන්ම වාර්තා කර ඇති අතර පිරිවැය සටහන් කිරීමේදී අබලි මිලදී ගැනීමේදී ඊට ගෙවූ පිරිවැය වාර්තා නොකර එම අබලි මිළදී ගැනීමට යන නිලධාරින් ගේ ගමන් වියදම්, ඉන්ධන වියදම්, අතිකාල ආදිය පමණක් පිරිවැය ලෙස වාර්තා කර ඇත. උදාහරණ ලෙස දිස්ත්‍රික්ක තුනක අබලි අලෙවියේ ආදායම හා වියදම සටහන් කර ඇති ආකාරය මෙසේය.

***ගාල්ල දිස්ත්‍රික්කය***

| | ඇස්තමේන්තු ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| අබලි ප්‍රමාණය | 40 MTS | 60 MTS |
| වියදම රු. | 880,000.00 | 10,500.00 |
| ආදායම රු. | 1,200,000.00 | 872,587.00 |

***ගම්පහ දිස්ත්‍රික්කය***

| | ඇස්තමේන්තු ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| අබලි ප්‍රමාණය | 40 MTS | 313 MTS |
| වියදම රු. | 880,000.00 | 99,000.00 |
| ආදායම රු. | 1,200,000.00 | 4,466,711.00 |

***හම්බන්තොට දිස්ත්‍රික්කය***

| | ඇස්තමේන්තු ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| අබලි ප්‍රමාණය | 40 MTS | 1 MTS |
| වියදම රු. | 880,000.00 | 500.00 |
| ආදායම රු. | 1,200,000.00 | 21,575.00 |

ඉදිරියේදී අබලි මිලට ගැනීමේ පිරිවැය හා ආශ්‍රිත සෘජු වියදම් ඇතුලත් කර ප්‍රගති වාර්තා සකස් කරන ලෙස ප්‍රාදේශීය කාර්යාල වෙත උපදෙස් ලබාදෙමි.

**4.1.ඒ (1) තාක්ෂණික සේවා අංශය**

**4 (ඒ) (1)** 2015 වර්ෂය තුල තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 05 ක් පවත්වා ඇත.

- **(අ)** ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් මහජන බැංකුවේ ඉල්ලීම මත සහභාගිවන්නන් 67 දෙනෙකු සඳහා 2015 මාර්තු 08 වන දින රත්මලානේදී පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන.
- **(ආ)** 2015 මාර්තු 24 වන දින සහභාගිවන්නන් 48 දෙනෙකු සඳහා බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන.
- **(ඇ)** කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයේදී 36 දෙනෙකු 2015 පෙබරවාරි මාසයේදී පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන.
- **(ඈ)** කිතුලක වරුණ ප්‍රදර්ශණය 2015 අප්‍රේල් මස 03 සහ 05 දිනවල පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන.
- **(ඉ)** ව්‍යවසායකත්ව සංවර්ධන අංශය සමඟ එක්ව 2015 මැයි 27 වන දින ස්වාධීන රූපවාහිණී සේවයේ පැයක දැනුවත් කිරීමේ වැඩසටහන.

මේ අනුව 2015 වර්ෂයේදී අදාල අංශය මඟින් තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් නොපවත්වා ඇති බවට ඇති සටහන එසේ නොවන බවට නිවැරදි විය යුතුය.

පවතින කර්මාන්ත පවතින මට්ටමින් නඟා සිටුවීම පිළිබඳ ක්‍රියාකිරීම සඳහා මෙම වර්ෂයේ ප්‍රමාණවත් තරම් ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකාරවරුන් සිටියේ නැත. මෙම වර්ෂයේදී අංශයේ සිටිනු ලැබුවේ ආහාර ඒකකය සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකාරිනියන් තිදෙනෙකු සහ ගොඩනැගිලි ද්‍රව්‍ය හා ඛනිජ ඒකකය සඳහා එක් ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවකු බැගින් පමණි. රසායන ඒකකය සහ තෙල් සහ කෙඳි ඒකකය සඳහා කිසිදු ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවකු සිටියේ නැත. මීට අමතරව සහකාර අධ්‍යක්ෂවරුන්ද කිසිවෙක් නොසිටියේය. රසායනාගාර සහකාරවරුන් 04 දෙනෙකු සිටිය යුතු වුවත්, කිසිවෙක් සිටියේ නැත. රසායනාගාර සහායකයින් සිටියේ එක් අයෙකු පමණි. මෙම තනතුර සඳහා 04 දෙනෙකු සිටිය යුතුය. කළමනාකාර සහකාරවරුන් දෙදෙනෙකු සිටිය යුතු වුවත් සිටියේ එක් කළමනාකාර සහකාරවරියක් පමණි. මෙවැනි තත්ත්වයක් යටතේ එදිනෙදා රාජකාරි කටයුතු පවා නිසි අන්දමින් පවත්වාගෙන යාමට බලවත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. මේ නිසා ක්ෂේත්‍ර රාජකාරි කටයුතු ද ඇතුලත් වන මෙම ක්‍රියාකාරකම ඉටුකිරීමට මෙම වර්ෂයේදී නොහැකි විය.

**4.1.ඒ.(2)**

උපදේශක සේවා සහ පහසුකම් සැලසීම සහ ගුණාත්මක භාවය සහ ඵලදායිතාවය ඉහල නැංවීම යන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අඩු වුයේද ප්‍රමාණවත් තරම් ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් අංශයේ නොසිටීම නිසාය. ක්‍රියාකාරකම් සැලැස්ම අනුව අවශ්‍ය ප්‍රගතිය අත්කර ගැනීම සඳහා අංශය තුල ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 08 දෙනෙකු සිටිය යුතු වුවත් 2015 වර්ෂයේ සිටින ලද්දේ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 04 දෙනෙකු පමණි. සේවක ඌනතාවය මත අප ලබා ගන්නා ලද ප්‍රගතියේ අඩු වීමක් තිබුණි.

**(3)** අදාල ප්‍රගති වාර්තාවල අදාල ආදායම් සහ වියදම් දක්වා ඇත.

**(4)** අදාල අංශය විසින් රැස් කරන ලද මුළු ආදායම අංශයේ ප්‍රගති වාර්තාවල නිවැරදිව දක්වා ඇත.

**(5)** ඉදිරියේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**4.1.ඔ**

**<u>ව්‍යවසායකත්ව සංවර්ධන අංශය</u>**

2015 වර්ෂයේ ප්‍රාග්ධන වැය යටතේ රු.1,000,000/- ක මුදලක් Business Health Certificate වැඩසටහන සඳහා වෙන්කර ඇත.

මෙම මුදල වෙන්කර දෙන ලද්දේ එම වැඩසටහනේ නිර්ණායකයන් සකස් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකිරීම සහ 2015 වසර අවසානයේදී එහි සමාරම්භක කටයුතු වෙනුවෙනි.

ඉහත කාර්යයන් සහතිකකරණයට ( Business Health Certification ) ප්‍රථමයෙන් සිදුකල යුතු පූර්ව කටයුතු බැවින් සහතිකකරණය 2015 වසරේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් නොකරන ලදී. කෙසේ වෙතත් මෙම කාර්යය අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන අංශයට පවරා අදාල සියළු කටයුතු දැන් සම්පූර්ණ කර ඇත. මේවනවිට සහතික පත්‍ර ලබාදීම සඳහා කර්මාන්තකරුවන් ඇගයීමට ලක් කරමින් සිටී.

**4.1.ඕ**
**රබර් සංවර්ධන මධ්‍යස්ථානය**

එම අවස්ථාවේදී සියළු ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා අවශ්‍යවන්නා වූ මානව සම්පත්වල හිඟකම මෙයට බලපා ඇත. අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ යන සියළු තනතුරු පුරප්පාඩුව පැවත තිබේ.

**4.1.ක**
**ඉංජිනේරු අංශය**

1) නව නිර්මාණ කිරීම සඳහා සැලසුම් ඉංජිනේරු තනතුර සහ පුහුණු සේවකයන් ගේ හිඟය බලපා ඇත. මණ්ඩලයේ පවතින වැටුප් පරිමාණයන්ට අදාල අයවලුන් බඳවා ගැනීමේ ගැටළුවක් පවතින බවත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවත් කාරුණිකව වාර්තා කරමි.

2) මේ සඳහා ද ඉහත හේතුව බලපා ඇත. කෙසේ වෙතත් අත ඇති සේවක සම්පත උපයෝගී කරගෙන අයකිරීමකින් තොරව උපදෙස් පතා පැමිණෙන සියළු කර්මාන්තකරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලබන බව වගකීමෙන් යුතුව සටහන් කරමි.

3) සැලසුම් කල ක්‍රියාකාරකම් 30% කින් පමණක් ලඟා කර ගැනීමට සිදුවූයේ ඉහත 1) සඳහන් කල පරිදි නිලධාරින් නොමැතිකම වන අතර පිරිවැය ඉහළ යාමට හේතුව නිලධාරින් ගේ වැටුප් වැඩි කිරීම නිසා ශ්‍රම පිරිවැය ඉහල යාමත්, වෙළඳපොලේ අමුද්‍රව්‍ය මිල ඉහල යාමත්ය. ලැබෙන ඇණවුම් එක සමාන නොවන අතර එය අනුපාතිකව ගණන් බැලීම නිවැරදි නොවේ.

$$\left( \frac{\text{මුළු පිරිවැය}}{\text{ක්‍රියාකාරකම්}} \times \text{සත්‍ය ක්‍රියාකාරකම්} \right)$$

4) වත්කම් අගය රු.මිලියන 25 සැලසුම් කල ක්‍රියාකාරකම් 100 ඉටුකර ගත් ක්‍රියාකාරකම් 10 අපේක්ෂිත ආදායම රු.මිලියන 5 යි. උපයාගත් ආදායම රු.350,149/- දක්වා ඇති උපයාගත් ආදායම නිවැරදි නොවන අතර වාත්තු අංශයේ ප්‍රගති වාර්තා සටහන ප්‍රකාර රු.මිලියන 1.21 ක ආදායමක් උපයා ඇත.

5) ඇණවුම් අඩුවීම හා ඉහත 1) දැක්වූ පරිදි පුහුණු සේවක හිඟයද මෙයට බලපා ඇත. මණ්ඩලයෙන් කාර්යයන් ඉටුකර ගැනීමේදී ගෙවිය යුතු මුදලට වඩා අඩු මුදලකට වෙළඳපොලෙන් ඉටුකර ගැනීමට හැකිවීමද මෙම තත්ත්වය ඇතිවීමට හේතු පාදක වී ඇත. පිරිවැය පත්‍රිකා සමාලෝචනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

6) මේ සඳහාද හේතු වී ඇත්තේ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟතාවයයි. මධ්‍යස්ථානයේ ආදායම හා ප්‍රගති සමාලෝචන වාර්තාවේ ආදායම අතර වෙනසට හේතුව Invoice කිරීම, මුදල් ලැබීම, ගිණුම්ගතවීම ආදි ජාලයේ ක්‍රියාකාරකම්වලට ගතවන කාලය බව කාරුණිකව වාර්තා කරමි.

**(ග) සැලසුම් අංශය**

1) මෙම ඉලක්කගත කාර්යය සැලසුම් කිරීමේදී නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙකු ඇතුළු තවත් නිලධාරින් තිදෙනෙක් මෙම රාජකාරි කටයුතුවල නියැලී සිටියද, 2015 මුල් කාර්තුව තුළ ඉහත මෙම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනා සේවයෙන් ඉල්ලා අස්වීම හේතු කොටගෙන ප්‍රමාණවත් නිලධාරින් නොමැතිකම නිසා මෙම කාර්ය සාධනයට ලඟාවීමට නොහැකි විය.

2) බාහිර පාර්ශවවල ඉල්ලීම පරිදි මෙවැනි සංඛ්‍යාන තොරතුරු නිකුත් කිරීම සාමාන්‍ය තත්ත්වයයි. එසේම අදාල ඉලක්ක නිර්ණය කිරීමේදි වසර 02 ක පමණ කාර්යය සාධනය සැලකිල්ලට ගනු ලබයි. ඒ අනුව 2015 වර්ෂය සඳහා ඉලක්ක 10 ක් සැලසුම් කළද බාහිර ඉල්ලීම් දෙකකට පමණක් සීමා වු හෙයින්, නියමිත ඉලක්කයකට ලඟාවීමට අපොහොසත් විය.

3) 2015 නියමිත කාර්ය සාධන වාර්තාව අනුව ප්‍රගතිය අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම ( Preparing Progress Monitoring & evaluation report ) සහ 2016 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීම ( Action Plan - 2016 ) පමණක් 100% කාර්යය සාධනයට ලඟාවී ඇත. ඒ අනුව මෙම කාර්යයන් අපගේ අරමුණුගත සංවර්ධන කාර්ය භාරයන්ට හා සෘජුවම බලනොපාන බැවින්, දින වකවානු පිළිබඳ සැලකිල්ලට ගැනීම තාර්කික නොවේ. එසේ වුවද වර්ෂය අවසන්වීමට ප්‍රථම මෙම කාර්යයන් අවසන් කර ඇති නිසා, කාලවකවානු සැලකිල්ලට ගැනීමේදී එය ප්‍රමාණවත් වේ.

**(ජ) අලෙවි අංශය**

1) අලෙවි අංශයේ කාර්යය සාධනය හඳුනා ගැනීම සඳහා වාර්ෂික ඉලක්ක සහ එම ඉලක්ක සපුරාගත් ආකාරය දැක්වෙන වාර්තාවක් සැලසුම් අංශයට ඉදිරිපත් කර ඇත. ( පිටපත මේ සමඟ අමුණා ඇත.)

2) 2015 වර්ෂය සඳහා සකස් කල ක්‍රියාකාරි සැලැස්මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය පිළිබඳව පහත සඳහන් ලෙස ඉලක්ක සඳහන් කර තිබුණි.

| Sub Activity | Key Performance Indicator (KPI) | Annual Target |
|---|---|---|
| Access to raw material | No of new registration | 250 |
| At Concessionary price | Amount MT (Materials) Collected | 1000 |
| | Amount (MT) Distribute | 1000 |
| | No of Industrialists Scrap Distributed | 750 |

3) ප්‍රාග්ධන අයවැයෙන් රු.මිලියන 20 ක් වෙන්කර තිබුනේ SMIDEX ප්‍රදර්ශනය සඳහා හා හොඳම ව්‍යවසායකයා තේරීමේ තරඟය සඳහාය. එම මුදල ප්‍රාග්ධන අයවැයෙන් ලබා නොගෙන වෙනත් මාර්ග වලින් උපයා ගැනීමට අදහස් කල හෙයින් මණ්ඩලයේ ප්‍රාග්ධන අයවැය තුල ඇතුලත්ව නැත.

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

1) දක්වා ඇති අඩුපාඩු සිදුවී ඇති කාල පරිච්ඡේදය තුල ස්ථිර පරිපාලන අධ්‍යක්ෂවරයෙකු ආයතනයේ නොසිටි අතර මණ්ඩලීය නීති නිලධාරිනිය ඇගේ නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව වැඩබලන පරිපාලන හා මානව සම්පත් අධ්‍යක්ෂ ලෙසද කටයුතු කර ඇත. අදාල කාලසීමාව තුල ස්ථිර, පළපුරුදු පරිපාලන හා මානව සම්පත් අධ්‍යක්ෂවරයෙකු නොමැතිවීම හේතුවෙන් අදාල කාර්යයන් සැලසුම් සහගතව ක්‍රියාත්මක නොවූ අතර මේවනවිට අතපසු වූ කාර්යයන් ක්‍රමානුකූලව, සීග්‍රයෙන් සිදුකරමින් පවතී.

2) එම මුදල අනුව සකස් වී ඇත්තේ පහත පරිදිය.

i. Sub Contract Exchange නමින් පවතින ගිණුම් ශේෂය වන රු.837,418/- ක හර ශේෂය 2007 වර්ෂයේ සිට පවතින ශේෂයකි. මෙය අලෙවි අංශයේ උපකොන්ත්‍රාත් ගෙවීම් ගිණුම්ගත කිරීමේදී නිරවුල් නොවූ ශේෂයකි.

ii. Capacity Building වශයෙන් 2015.12.31 දිනට පවතින රු.1,679,828/- ශේෂය ප්‍රාදේශීය සංවර්ධන අංශයෙන් කරන ලද විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රාග්ධන ගිණුමින් දරණ ලද වැය කිරීම් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව මෙය අයභාර වියදමක් ලෙස සලකා ගිණුම්ගත කළ යුතුව ඇත.

iii. Withholding tax නමින් පවතින රු.1,424,654/- ක හර ශේෂය රඳවා ගැනීම් බදු වශයෙන් සටහන් වුවද එය 2010 වර්ෂයේ භාණ්ඩ හා සේවා බදු වශයෙන් ගෙවන ලද මුදලකි. මෙය අයභාර වියදමක් ( Goods and services tax ) සේ සලකා ගිණුම්වල ගැලපීම් කිරීමට පියවර ගෙන ඇත.

iv. Non-Ferrous Vat රු.10,741,854/- අබලි ද්‍රව්‍ය මිලට ගැනීමේදී 2007 වර්ෂයේ සිට පවතින හර ශේෂයකි. සෑම ගිණුම් වර්ෂයකම ඉදිරියට ගෙන යන ශේෂයක් ලෙස පවතී. ඒ අනුව මෙය අයභාර වියදමක් සේ සලකා ගිණුම්ගත කළ යුතුව ඇත.

v. Non-ferrous Control Account වශයෙන් පවතින රු.742,661/- ශේෂය 2012 වර්ෂයේ සිට අබලි ද්‍රව්‍ය පාලන ගිණුමේ ශේෂය වශයෙන් ඉදිරියට ගෙන ආ ශේෂයක් ලෙස මෙයින් නියෝජනය වේ.

vi. ආර්ථික සේවා ගාස්තු ගෙවීමේ බැඳියාව (ESC ) අප මණ්ඩලයේ කාර්ය භාරය අනුව අදාල නොවේ. එසේ වුවත් 2011 සිට ආර්ථික සේවා ගාස්තු වශයෙන් රු.170,872/- ශේෂයක් ඉදිරියට ගෙනවිත් ඇත. නිසි පරිදි අධ්‍යයනය කිරීමෙන් පසු මෙය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. එකතුව රු.15,597,287/-.

ඉහත දැක්වූ සියළු අයිතමයන් ජංගම වත්කම් හෙයින් පොත් වලින් කපා හැරීම, අයභාර වියදමක් ලෙස ගැලපීම හරස් සටහන් මඟින් ගැලපීම පරික්ෂා කිරීමකින් තොරව සිදුකල නොහැකිය. තවදුරටත් නිශ්චිතව කරුණු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන 2016 අවසාන ගිණුම මඟින් අවශ්‍ය ගැලපීම් කිරීමට ක්‍රියාකරමි.

3) 2015 අවසන් ගිණුමේ " 16, Other current Assets " යටතේ මෙම රු.574,570/- මුදල දැක්වෙන්නේ කුමන අයිතමයන්ගේ එකතුවෙන්ද යන්න අප වෙත ලබාදෙන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටින අතර අනතුරුව පැහැදිලි කිරීම් ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

4) මෙම වෙන් කිරීම් 2014 වර්ෂයට පෙර සිට වෙන්කොට පැවත එන ශේෂයන් වේ. 2015 වර්ෂය සඳහා අළුතින් වෙන් කිරීමක් සිදුකර නැත. ඔබ පෙන්වාදුන් කරුණුද නිවැරදිය. කෙසේ වෙතත් 2016 අවසාන ගිණුම මඟින් අධි වෙන්කිරීම් ආදායමට බැර කිරීමට කටයුතු කරමි.

5) 2015.12.31 දිනට පැවති හිඟ ශේෂය වන රු.20,869,142/- මුදලෙන් 2016 වසර තුල රු.10,861,129.30 ක් අයකර ගෙන ඇත. ඉතිරි මුදල්ද ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

## 4.3 මතභේදයට තුඩුදෙන කරුණු

1) සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම Nations Building Involvement තේමාව යටතේ දැන්වීමක් පල කරන ලෙස 2014.10.31 දිනැති ලිපියෙන් ඉල්ලා ඇත. ඒ අනුව ජනාධිපතිවරයාගේ 9 වැනි වර්ෂ පූර්ණය හා ඊට අත්පත් කරගත් ජයග්‍රහණයන් සමරමින් ජාතිය ගොඩනැගීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දායකත්වය විදහා දැක්වීම සඳහා මෙම දැන්වීම පලකර ඇත.

2) මණ්ඩලය විසින් වර්ෂ කිහිපයක් තිස්සේ විශේෂ ව්‍යාපෘති සඳහා ගිණුම් තැබීම “ මුදල් පදනම “ මත සිදුකර ඇත. එපරිදි සිදුවී ඇත්තේ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙනි. සමහර අවස්ථාවල මණ්ඩලයේ අරමුදල් වලින් වියදම් දරා ඊලඟ වර්ෂයේදී අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගන්නා අතර, සමහර අවස්ථාවලදී කෙලින්ම අමාත්‍යාංශයෙන් අරමුදල් ලැබී එම වර්ෂය තුල සම්පූර්ණයෙන් වියදම් දැරීමට කාලයක් නොවුනහොත් අදාල

පරමාර්ථ ඉටුකර ගැනීම කල යුත්තේ එලඹෙන වර්ෂයේදීය. දක්වා ඇති රු.මිලියන 1.025 මුදලද පෙර වර්ෂයේ ලද අරමුදල් වලින් දරණ ලද මුදලකි.

## 4.4 දෘෂ්‍ය අක්‍රමිකතා

ජීවන වියදම් දීමනාව මත සේ.අ.අ. හා සේ.භා.අ. දායකත්ව නොගෙවීම ආර්ථික ලාභයක් ලැබීම උදෙසා අරමුණු සහගතව මණ්ඩලය අනුගමනය කල උපක්‍රමයක් නොවුන අතර එවකට සිදුවූ වැටුප් පරිවර්තනයේදී උද්ගත වූ අපහැදිලිතාවයක් මත ඇති වූ ප්‍රමාද දෝෂයක් කඩිනමින් නිවැරදි නොකිරීමේ ප්‍රතිඵලයකි. අනාගතයේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවන ලෙස ඉතා සැලකිල්ලෙන් මේ සම්බන්ධව කාලීන විධිවිධාන පිළිපදින ලෙසත් අදාල ආයතන වලින් අවශ්‍ය පැහැදිලි කරගැනීම් අප්‍රමාදව ලබාගන්නා ලෙසත් අදාල අංශවලට උපදෙස් දී ඇත.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

1. 2015 වර්ෂයේ දිනපොත් සඳහා අංශ වලින් ලැබී තිබු ඉල්ලීම් අනුව ඇණවුම් කර මිලට ගෙන තිබුණද අදාල අංශවලින් ඒවා රැගෙන නොයාම සම්බන්ධයෙන් අදාල නිලධාරින් දැනුවත් කල අතර ඉදිරියේදී සමාන සිදුවීම් ඇති නොවීමට වගබලා ගන්නා ලෙස එම නිලධාරින්ට උපදෙස් දුනිමි. අපහරණය කිරීමට කටයුතු කරන ලෙස ගණකාධිකාරි (ගබඩා) වෙත උපදෙස් දුනිමි.

2. රු.මිලියන 12, 2015 සංශෝධිත අවසාන ගිණුම මඟින් නිවැරදි කරන ලදී. ඉතිරි රු.මිලියන 7.2 න් රු.මිලියන 1.7 ක් වියදම් කර ඇති අතර ඔබ දක්වා ඇති ආකාර එම වියදම දරා ඇත්තේ ප්‍රාග්ධන වියදම් සඳහා නොවේ. රු.මිලියන 5.5 ක් ඔබ දක්වා ඇති ආකාර වියදම් කොට නැත. මේ වනවිට මෙම තත්ත්වය නිවැරදි කිරීමට වැය ලෙජර් ගත පාලනයක් දැන් ස්ථාපිත කර ඇත. ඒ තුලින් ලද අරමුදල් අංශවල ඉල්ලීම් මත ප්‍රමුඛතා හඳුනාගෙන වෙන්කර දී ඇති අතර තත්ත්වයන් කාලීනව සමාලෝචනය කිරිමටද කටයුතු කරමින් පවතී.

3. අදාල අත්තිකාරම් ගෙවීම් ( උදා: විදුලිබල මණ්ඩලය ) ලේඛනගතවන අතර භාණ්ඩ ලැබෙන ආකාර අත්තිකාරම පියවා ගනු ලැබේ. ඉතිරි මුදල ලැබිය යුතු මුදලක් ලෙස සටහන්ව පවතින අතර අදාල ආයතනවල තොග රැස්වූ වහාම ලබාගැනීමට ක්‍රියාකරනු ලැබේ.
කෙසේ වෙතත් මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා මේවනවිට සම්පූර්ණ අබලි ද්‍රව්‍ය තොගයේ වටිනාකම සඳහා ගෙවීම් නොකරන අතර 80% ක් ගෙවා අබලි ලබාගෙන අනතුරුව සියළු තොග ලද පසු ඉතිරි 20% ගෙවනු ලැබේ.

4. මෙම තත්ත්වය දැන් නිවැරදි කර ඇති බව කාරුණිකව වාර්තා කරමි. වාර්ෂික අයවැය හා ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කරනු ලබන අතර සැලසුම් ප්‍රකාර කටයුතු මෙහෙයවීම සිදුවේ.

5. ඉහත පරිදි වාර්ෂික අයවැය හා ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනයට ලක් කරනු ලබන බැවින් ඉදිරියේදී සමාන තත්ත්වයක් ඇතිවීම පාලනයට හසුකරගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

## 4.6 නිශ්ක්‍රීය ඌන උපයෝජන වත්කම්

1) දක්වා ඇති කරුණු යන්ත්‍ර දෙක සම්බන්ධයෙන් නිවැරදිය. "Spectra meter OES 5500 " යන්ත්‍රය මිලට ගෙන ඇත්තේ 1998 වර්ෂයේදීය. 2012 දක්වා දේශීය නියෝජිත ආයතනය හරහා නඩත්තු හා අළුත්වැඩියා කටයුතු ඉටුකර ගෙන ඒවායේ සේවය ලබාගෙන ඇත. අවු:15 ක පමණ සේවා දායකත්ව කාලසීමාවෙන් පසු වරින්වර එම යන්ත්‍රයේ නිවැරදි ක්‍රියාකාරිත්වයේ නොතිබු බැවින් වර්තමාන දේශීය නියෝජිත ආයතනය වන Hayley's life Science Co.ltd වෙතින් ඉටුකර ගැනීමට උත්සාහ දැරුවද මෙතෙක් එය සාර්ථක වී නැත.

   Carbon Analysis උපකරණය 1988 පෙර සිට අක්‍රිය තත්ත්වයේ පැවතුන අතර වාත්තු අංශය විසින් මෙය ක්‍රියාකරගත හැකිද යන්න සම්බන්ධව අවසානාත්මක ලෙස ශක්‍යතාවක් සිදුකර ක්‍රියාකර ගත නොහැකි නම් නව කට්ටලයක් ලබාගැනීමට කටයුතු කරගෙන යමින් පවතී.

2) පසුවිපරම් කාලයතුල තාක්ෂණය ලංකාවේ වාස්තු ක්ෂේත්‍රයට අදාල යන්ත්‍ර වලින් උපරිමව හා සාර්ථකව ලබාදී ඇති බව JICA ආයතනය වාර්තා කර ඇත. එම වාස්තු තාක්ෂණික සේවා පසුවිපරම් කාලයෙන් පසුවද ලබාදී ඇති අතර එම සේවාවට දායක වු නිලධාරින් හා සේවක මහතුන් විශ්‍රාමයාමේදී සහ සේවයෙන් ඉවත්ව යාමේදී පුරප්පාඩු පිරවීම් සිදුවී නොමැත. එම නිසා මෙම අංශයේ ක්‍රියාකාරි කටයුතුවල යම් පසුබෑමක් සිදුවී ඇත. නව උපදේශකවරයෙකු පත් කිරීමෙන් පසු මෙම තත්ත්වය දැන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

3) මහියංගන මියුගුණගම ගොඩනැගිල්ල කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ස්ථාපනය කර ඇති සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හිමියන්ගේ සංගමයට එම කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කුලී පදනම මත ලබාදීමට කටයුතු කරමින් සිටී. ඉන්පසුව ඒ සඳහා දරණු ලබන ආරක්ෂක වියදම්ද නතර වනු ඇත.

4) ඔබ දක්වා ඇති කරුණු නිවැරදි වුවද මෙම අත්තිකාරම් බොහෝ දුරට යම්කිසි වැඩසටහනකට හෝ වෙනත් කාර්යයකට පෙර ලබාගන්නා අතර ප්‍රායෝගිකව වැයවන පිරිවැය නිශ්චිතව මුලින් සඳහන් කල නොහැක.

5) 2015 වර්ෂය තුල කිතුල් සංවර්ධන වැඩසටහන සඳහා වසර ආරම්භයේ මුදල් ප්‍රතිපාදන නොලැබුණි. එහෙත් 2014 හා 2015 වර්ෂයන් තුල පවත්වන ලද වැඩසටහන් සඳහා අප ආයතනයෙන් මුදල් වියදම් කර ඒවා ප්‍රතිපූර්ණය කිරීම මඟින් අමාත්‍යාංශයෙන් මුදල් ලබාගෙන ඇත. ඒ අනුව රු.9,282,468.68 ක මුදලක් 2015 වර්ෂය තුල අප ආයතනය රේඛිය අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇත. එම මුදලට කිතුලක වරුණ සඳහා වියදම් කර ප්‍රතිපූර්ණය කරන ලද රු.3,902,787.00 ක මුදලද ඇතුලත් වේ.

6) මෙම බස් රථය විකිණීම සඳහා කළමනාකරණ සහ විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබාගැනිම සඳහා යොමුකර අනුමැතිය ලබාගෙන ඇත. ඊට අවශ්‍ය කටයුතු දැන් ඉටුකරමින් පවතී.

## 4.7 ආර්ථික නොවු ගණුදෙනු

1) සැපයුම් අංශය විසින් කඩිනමින් මිලදී ගතයුතු භාණ්ඩ හා සේවා සඳහා මිල සැපයුම් ක්‍රමය යටතේ ෆැක්ස් මඟින් මිළ කැඳවුම්පත් යොමු කර මුද්‍රා තැබු මිළ ගණන් පත් කැඳවීම සඳහා ප්‍රසම්පාදන චක්‍රලේඛනයට යටත්ව අදාල මිළදී ගැනීම් සිදුකිරීම සඳහා කටයුතු සිදුකර ඇති බව දන්වා සිටිමි. සැපයුම් අංශය ප්‍රසම්පාදන කටයුතු ඉතා කඩිනමින් සිදුකිරීම හේතුවෙන් මිළ ගණන් කැඳවීමට අදාල වු කොන්දේසි හා පිරිවිතරයන් ( සම්මත ) යොදා අදාල මිලදී ගැනීම් වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත මිළ කැඳවුම්පත් යොමු කර ඇත. තවද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2015 වර්ෂයට අදාල පරිගණක සඳහා පිරිවිතරයන් සකස් කිරීමේදී පොදු පිරිවිතරයක් සකස් කිරීමට යොමු වුයේ මණ්ඩලයේ ජාලගතකරණයට හසුවීමටත් සෑම අංශයක්ම ආවරණය වන පරිදි කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහාත් බව දැනුවත් කරමි.

2) මණ්ඩලීය ප්‍රාග්ධන භාණ්ඩ මිළදී ගැනීම් අවස්ථා 13 කින් පරිගණක පමණක් මිළදී ගත් අවස්ථා කිහිපයක් වුයේ අවස්ථා ගණනකදී විවිධ අංශ වලින් භාණ්ඩ හා සේවා අයදුම්පත් සැපයුම් අංශයට යොමු කිරිම හේතුවෙනි. එනමුත් 2016 වර්ෂයට අදාල මිළදී ගැනීම්වලදී මිළ සැසඳුම් ක්‍රමයට වඩා මනා විනිවිද භාවයකින් යුත් ප්‍රසම්පාදන කාර්යය භාරයක් ඉටුකිරීමට හැකිවී ඇති බවත්, විවෘත ටෙන්ඩර් කැඳවීමෙන් පරිගණක හා අනෙකුත් භාණ්ඩ හා උපකරණ මිළදී ගැනිමට හැකිවු බවත් 2015 වර්ෂයේදී සිදුවු වරින්වර ඉදිරිපත් වු භාණ්ඩ හා සේවා අයදුම්පත් එකවර වර්ෂය මුලදී සැපයුම් අංශයට ඉදිරිපත් වී තිබු බවත් සඳහන් කරමි.

## 4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති

කරුණාකර ඇමුණුම 03 බලන්න. උපලේඛන (1) සහ (2) හි සඳහන් වැඩ නිමකර ඇති බවට සිවිල් ඉංජිනේරු විසින් වාර්තා කර ඇත.

## 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

1) දැනට බඳවා ගැනීමේ පරිපාටියේ " ගණකාධිකරණ උපාධිය " සුදුසුකමක් ලෙස දක්වා ඇතත් එවකට විශේෂ වාණිජවේදී උපාධියට ගණකාධිකරණ විෂයය ඇතුලත්ව ඇත. අධ්‍යක්ෂ මුදල් එම සුදුසුකම ලබාතිබූ අතර ඊට අමතරව කළමනාකරණ කාණ්ඩයේ අදාල වර්ෂ 05 ක ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබාතිබීම එම පත්වීම ලබාදීමට හේතු විය.

2) මෙම තනතුර සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව ඔහු ලබා ඇති ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා අනිකුත් අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළුව සම්මුඛ පරීක්ෂණයට සාර්ථකව මුහුණදුන් ආකාරය සලකා බලා මෙම තනතුර පී.එල්.එස්.උදයසිරි මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ අනුමැතියද ලබා පත් කිරීම සිදුකර ඇත.

3), 4)

අ) මණ්ඩලයේ තීරණ ගැනීම් හා සෘජුව සම්බන්ධ වන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ම එම තනතුරු අනුමත වූ දින සිටම පුරප්පාඩුව පැවතීම.

වරින්වර මෙම පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත් වූවද ආයතනයේ අවශ්‍යතාවයන්ට සරිලන සුදුස්සන් මෙතෙක් බඳවා ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත.

ආ) මණ්ඩලය සඳහා අනුමතව පවතින අධ්‍යක්ෂ තනතුරු 09 න් තනතුරු 04 ක්ම පුරප්පාඩුව පැවතීම.

පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ තනතුරු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇතත්, තනතුරට සුදුසු පුද්ගලයින් බඳවා ගැනීමට නොහැකි වී ඇත. මේවනවිට එම පුරප්පාඩු පිරවීමට පියවර ගෙන ඇත.

ඇ) සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 51 අනුමතව පවතින අතර ඉන් 15 ක පුරප්පාඩු පැවතීම.

මේ සඳහා අභ්‍යන්තරව අයදුම්පත් කැඳවූ අතර ඒ වනවිට ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් වෙනුවෙන් ලැබී තිබූ අධිකරණ තීන්දුව මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් වක්‍රාකාරයෙන් බලපෑමක් ඇතිකල හෙයින් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි විය. දැනට මේ සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

ඈ) සංවර්ධන නිලධාරින් 30 දෙනෙකු කාර්ය මණ්ඩලය තුල සිටින අතර එම 30 ම පුරප්පාඩුව පැවතීම.

ඉහත සඳහන් අධිකරණ තීන්දුව ක්‍රියාත්මකවීම නිසා MA 5 - 2 කාණ්ඩයේ සිටි නිලධාරින් JM කාණ්ඩයට ඇතුලත් කිරීමේදී සංවර්ධන නිලධාරින් 30 දෙනෙකු සඳහා තිබූ ප්‍රතිපාදන යොදා ගෙන ඇත.

ඉ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු හා බැඳි කාර්යයන් කෙරෙහි සෘජු දායකත්වයක් සලසන ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරින් (MA 5 – 2) 94 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලය තුල සිටියද 86 ක්ම පුරප්පාඩු වී පැවතීම.

ඉහත සඳහන් කාලසීමාව වනවිට සේවයේ යෙදී සිටි ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් ඔවුන්ගේ තනතුර සම්බන්ධයෙන් අධිකරණය වෙත නඩුවක් ගොනු කොට තිබූ බැවින්, එම නඩුවේ තීන්දුව ලබාදෙන තෙක් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුවද මේ වනවිට එම නඩුවේ අවසන් තීන්දුව ලැබී ඇති අතර අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවා අවසන් කර ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී.

5) ප්‍රස්තුත කාලසීමාව තුළ වැඩ පැවරුම් මත බඳවාගත් නිලධාරින් ගේ සේවය අවසන් කිරීමට කටයුතු කර ඇත. පවතින තනතුරු සඳහා සේවයේ යෙදවීමට නිලධාරින් අත්‍යාවශ්‍ය වූ හෙයින් පුවත්පත් දැන්වීමක් මඟින් ස්ථිර සේවකයින් බඳවා ගන්නා තෙක් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගෙන ඇත.

6) අදාල තනතුරට පත්කරන විට බඳවාගැනීමේ පටිපාටිය ප්‍රකාර මූලික සුදුසුකම් සපුරා නොතිබීම.

7) මේවනවිට මෙම තත්ත්වය නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

8) (i) මේ සම්බන්ධයෙන් වු චෝදනා පත්‍රයට ඔහු පිළිතුරු එවා නොමැති හෙයින්, විනයානුකූලව දඩුවම් පැමිණවීමට තීරණයක් ගනු ඇත.

(ii) තාක්ෂණික සේවා අංශයේ මුදල් අවභාවිතා කිරීම යටතේ වැඩ තහනමට ලක්ව සිටින කේ.පී.ඩී.සමන්කුමාර මහතා පිළිබඳ විනය පරීක්ෂණය මේ වනවිට කෙරෙමින් පවතින අතර එය අවසන් අදියරේ පවතී.

(iii) මේ සම්බන්ධයෙන් රහස් පොලීසියේ අත්අඩංගුවට පත්වී දැනට ඇප මත මුදාහැර ඇති මොහු සම්බන්ධව රහස් පොලිසියෙන් විමසන ලදුව ඔවුන්ගේ වාර්තාව නීතිපති වෙත යවා ඇති බවත්, එය ලැබුණු පසු අප වෙත වාර්තා කරන බවත් දන්වා ඇත. මේ පිළිබඳව නිරන්තරයෙන් කරුණු විමසමින් පවතී.

## 5. ගිණුම් කටයුතු පාලනය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ඉදිරියේදී චක්‍රලේඛන අවශ්‍යතා ප්‍රකාර අනුගතවීමට හැකිවන සේ අවශ්‍ය කටයුතු සංවිධානය කරමි.

### 5.2 අභ්‍යන්තර විගණනය

මෙම පුරප්පාඩුව මේවනවිට පුරවා ඇත. එසේම අභ්‍යන්තර විගණන සැලැස්මද විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත. එසේම අභ්‍යන්තර විගණන වාර්තා මු/රෙ 134 (1) ප්‍රකාරව ආයතනයේ ප්‍රධානියා වෙත යොමු කරනු ලැබේ.

### 5.3 විගණන කමිටු

2016 වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් 04 ක්ම පවත්වා ඇති අතර 2017 වර්ෂය සම්බන්ධයෙන් පලමු කාර්තුවට අදාල රැස්වීම පවත්වා ඇත.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

1) මේ වනවිට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ඊට අනුගතව ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවනු ලැබේ.

2) ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් මිළ ගණන් කැඳවා ප්‍රතිචාර නොමැතිවිට Yellow Pages සහ ක්ෂේත්‍රයේ සිටින සැපයුම්කරුවන්ගෙන් විධිමත් පරිදි මිළ ගණන් කැඳවා තරඟයට ඉඩදී අවශ්‍යතාවයන් ඉටුකරගනු ලැබේ.

3) තාක්ෂණික ඇගයීම් කමිටුවට අදාල වගකීම් හා කාර්යභාරයක් වන පිරිවිතර සමාලෝචනය හා නිර්දේශ කිරීම් ඉදිරියේ දැනට පවතින තත්ත්වයට වඩා විධිමත්ව ඉටුකිරීමට පියවර ගත හැකිය. භාණ්ඩ හා සේවා ඉල්ලුම් කරන අංශයේ අංශ ප්‍රධානියා හරහා අදාල පිරිවිතරයන් සකස් කිරීමට කටයුතු සම්පාදනය කරන බවත් දන්වා සිටිමි.

4) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6:2:2 අනුව වෙළඳපල මිළ සැසඳුම් ක්‍රමයේ ලංසු කැඳවීමේ අවම කාලසීමාව වන දින 07 කි. නමුත් හදිසි ප්‍රසම්පාදන කටයුතු හේතුවෙන් මෙම අවම කාලයට අඩු කාලසීමාවක් තුලදී ලංසු කොන්දේසි වලට යටත්ව අදාල මිළදී ගැනීම සිදුකර ඇති බවත් අදාල චක්‍ර ලේඛනයේ අවම (අඩු) කාලසීමාව නොඉක්මවා මිළ ගණන් කැඳවීමට ඉදිරියේදී කටයුතු සිදු කිරීමට සැපයුම් අංශය වගබලා ගන්නා බවත් දන්වා සිටිමි.

5) 2006 මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:6:1 අනුව එකම භාණ්ඩය සැපයීම සඳහා නැවත ඇණවුම් කිරීමේ පදනම යටතේ ( 50 % ) පරිගණක කිහිපයක් මිලදී ගැනීමට හැකි වුයේ අදාල ආයතනය විසින් පිරිවිතරයන්ට යටත්ව හා සැපයු මිළටම අදාල භාණ්ඩ සැපයීමට එකඟවු නිසා බව සඳහන් කරමි. තවද නැවත ඇණවුම් කර මිළදී ගැනීම තුළින් අවශ්‍ය උපකරණ හා හිමිකාර මෘදුකාංග දේශීය නියෝජිත ආයතනයක් මඟින් මිළදී ගැනීමට සැපයුම් අංශය සමත් වී ඇත. එබැවින් සැපයුම් ක්‍රියාවලියට ගතවන කාලය සැපයුමේ ස්වභාවය ( හැකි ඉක්මණින් ) නියමිත දිනයක් නොමැතිවීම යන කරුණු යොදා ගනිමින් අදාල මිළදී ගැනීම් මණ්ඩලයට උපරිම ප්‍රතිලාභයක් වන සේ සිදුකර ඇති බව විගණනයට පෙන්වා දෙමි. නමුත් විගණනය පෙන්වා දෙන පරිදි පරිගණක 32 ක් වැනි ප්‍රමාණයක් එකවර මිළ කැඳවීම් සිදු කලේ නම් ඊට අදාල වට්ටම් මූල්‍යමය වාසිය ලබාගැනීමට හැකියාව තිබු බවත් 2016 වර්ෂයේදී මේ තත්ත්වය වෙනස්වී එකවර ඉල්ලුම් කර අදාල සැපයුම් සිදුකිරීමට විවෘත මිළ ගණන් කැඳවා පරිගණක මිලදී ගෙන ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි.

5.5 අයවැය ලේඛනමය පාලනය

1), 2) ප්‍රාග්ධන අයවැය ලේඛනය යටතට ගැණෙන Development බජට්ටුව මෙයට අදාල වේ. අංශ ප්‍රධානීන් ගේ රැස්වීමකදී ඔවුන් සමඟ සාකච්ඡා කොට ප්‍රමුඛතාවයක් හඳුනාගෙන අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතියෙන් මෙම බජට්ටුව එලිදක්වනු ලබයි. දැනට එම ක්‍රියාදාමය අනුව කටයුතු සිදුවේ. අනතුරුව අධ්‍යක්ෂ ජනරාල් ගේ ප්‍රධානත්වයෙන් ප්‍රගතියද සමාලෝචනය කරනු ලැබේ.

3) ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හා මෙහෙයවීම සිදුකරනු ලබන්නේ සැපයුම් අංශය විසින්ය. ප්‍රාග්ධන අයවැය අවශ්‍යතා ප්‍රමුඛතා හඳුනාගෙන සකස් කිරීම හා පාලනය කිරීම ඉටුකරනු ලබන්නේ මූල්‍ය අංශය විසින්ය. එම ක්‍රියාවලිය කාලීනව සමාලෝචනය කිරීම හා පාලනය කිරීම අයවැය ලේඛනගත පාලනය/Budgetary Control දැන් විධිමත්ව සිදුවේ.

5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 වාර්තාව මේවනවිට සකස් කර මුද්‍රණය කර අවසන්ය. ඊලඟ සතියේදීම පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අමාත්‍යාංශය වෙත යොමු කරමි. 2014 වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාෂා පරිවර්තකයෙකු විසින් පරිවර්තනය කරමින් පවතී. කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරමි.

6. පද්ධති හා පාලකයන්

1) 2015 වර්ෂයේදී මෙම තැන්පතු සඳහා මණ්ඩලයේ මුදල් අයකැමි විසින් මුදල් ලැබීම් පත්‍ර නිකුත් කලේ නම් 2015.12.31 දින වනවිටත් ඒවා හඳුනා නොගත් තැන්පතු ලෙස නොපවතිනු ඇත. මෙම මුදල් බැංකු ජංගම ගිණුම්වලට බැරවී තිබූ අතර හඳුනා නොගත් තැන්පතු ලෙස තවදුරටත් ගිණුම් වලින් බාහිරව තබා ගැනීම අර්ථ විරහිතවූ හෙයින් එවකට උපදේශක මුදල් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් නිසි අනුමැතියකට යටත්ව මණ්ඩලයේ ආදායමට ඇතුලත් කිරීමට කටයුතු කරන ලදී.

2) ඔබ විසින් කරන ලද ඇඟයීමෙන් අනතුරුව ලබාදුන් නිරීක්ෂණ ප්‍රකාර ඉදිරියේදී කටයුතු කිරීමට අදාල අංශවලට උපදෙස් දෙන ලද අතර ඊට අනුව කටයුතු සිදුවන්නේදැයි අධ්‍යක්ෂ ජනරාල් මඟින් අධීක්ෂණය කරවමි.

3) * බිම් කොටස් ලබාදීම සඳහා කර්මාන්තකරුවන් ගෙන් ඉල්ලුම් පත්‍රයක් හා අදාල ව්‍යාපෘති වාර්තාව ලබාගැනීම.

- අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සුදුසු කර්මාන්ත තෝරා ගැනීම හා නිර්දේශ කිරීම.
- මෙසේ තෝරාගත් කර්මාන්තකරුවන් සඳහා මණ්ඩලීය සභාපතිතුමාගේ අනුමැතියට යටත්ව මූලික පැවරීමේ ලිපි නිකුත් කිරීම. මෙම ලිපිය මඟින් පාරිසරික බලපත්‍රය හා ගොඩනැගිලි සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය, ව්‍යාපෘතියේ ක්‍රියාත්මක සැලැස්ම හා අදාල අනිකුත් වාර්තා ලබාදෙන ලෙස දන්වා තිබේ.
- මෙම වාර්තාව ලබාදීමෙන් අනතුරුව සභාපතිතුමාගේ අත්සනින් යුතුව කොන්දේසි සහිත පැවරීමේ ලිපිය නිකුත් කිරීම සිදුකරනු ලැබේ. මෙම අවස්ථාවේදී වසර 03 ක ඇප තැන්පත් මුදලක් ලබාගන්නා අතර පළමු වර්ෂය සඳහා වන බදු කුලී ප්‍රමාණය ලබාගැනීමද සිදු කරනු ලැබේ.
- ඉන්පසු කර්මාන්තය මාස 06 ක කාලසීමාවක් තුල ආරම්භ කිරීම සිදුකරනු ලබන අතර කර්මාන්ත ක්‍රියාත්මකවීම මත බදු ගිවිසුම් ලබාදීම සිදු කරනු ලැබේ.
- පළමු වසර අවසානයේ සිට අදාල කාර්යාලය මඟින් ඉන්වොයිස් පත් නිකුත් කිරීම හා බදු මුදල් ලබාගැනීම් සිදුකරනු ලැබේ.
- මෙසේ කර්මාන්තය ක්‍රියාත්මක වනවිට අදාල ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව ක්‍රියාත්මක වන කර්මාන්තකරුවන්ගේ පැවරීම අවලංගු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරනු ලැබේ.

කෙසේ වුවද මණ්ඩලයේ ප්‍රධාන අරමුණ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නඟාසිටුවීම වන බැවින් අදාල බදු කුලී මුදල් නොගෙවා කෙටි කාලයක් පැහැර හැරීම මත හෝ කර්මාන්තය කෙටි කාලයක් වසා තිබීම යන අවස්ථාවල සෘජුවම පැවරීම අවලංගු නොකරන ලද අතර කෙසේ හෝ මෙම කර්මාන්ත නැවත සක්‍රිය කිරීම සඳහා ලබාදිය හැකි උපරිම සහන කාලසීමාවන්, උපදෙස් හා සේවාවන් නිරන්තරයෙන් ලබාදෙන

අතර, එමඟින් සක්‍රිය කල නොහැකි කර්මාන්ත අවසානයේ අවලංගු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරනු ලැබේ.

එම බිම් කොටස් අවලංගු කර යළි බදුදීම, මුදල් අය කිරීම, මුදල් නොගෙවීම මත ඉවත් කිරීම කර්මාන්තකරුවකුගෙන් කර්මාන්තකරුවකුට වෙනස් වන බැවින් ඒ සඳහා ලිඛිත ක්‍රියාපරිපාටියක් පිළියෙල කිරීම අසීරු වන අතර, දැනට නීති නිලධාරිනියගේ උපදෙස් අනුව අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

4) ගෙවීම් මුදල් පොතේ සෑම පිටුවකම එකතුව නිවැරදිව සටහන් කර ඇති අතර අදාල මුදල් පොතේ කෙටි අත්සනද යොදා නිවැරදි කරන ලදී.

5) තොග ගබඩාවේ සෑම භාණ්ඩයක්ම ගබඩා භාරකරු භාර නොගන්නා අතර හදිසි අවශ්‍යතා මත අත්තිකාරම් මුදල් ලබාගෙන භාණ්ඩ අවශ්‍ය අංශය මඟින් මිලදී ගැනීම සිදුකරනු ලැබේ. ඒ අනුව භාණ්ඩ ලදුපත නිකුත් කිරීමට ප්‍රථම ගබඩා භාරකරුට එම භාණ්ඩය පෙන්වා ගබඩා ද්‍රව්‍ය අයදුම් පත්‍රය මඟින් එකී භාණ්ඩය ලබාගනී. හදිසි අවශ්‍යතා මත භාණ්ඩ ලබාගැනීමේදී භාණ්ඩ ලදුපත නිකුත් කිරීමට යම් ප්‍රමාදයක් සිදුවී ඇත.

6) මේවන විට යාවත්කාලීනව බැංකු සැසඳුම් පිළියෙල කරනු ලබයි.

7) මෙම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර අවසන් අතර එය ක්‍රියාත්මකවීමේදී මෙම තත්ත්වය නිවැරදි වනු ඇත.

8) දැන් ඒ සඳහා විශේෂ පාලන උපක්‍රමයක් ස්ථාපිත කර ඇත. මුදල් අයකැමි භාරයේ ඇති සේප්පුවේ එය තැන්පත් කර ඇත. මිළ ගණන් විවෘත කරනවිට වගකිව යුතු නිලධාරියෙකු විසින් යතුර රැගෙන ගොස් අදාල කාර්යය නිමවූ වහාම යළි සේප්පුගත කරනු ලැබේ.

9) මේ සම්බන්ධයෙන් විස්තරාත්මක පිළිතුරක් ඉහත ( 6 – 3 ) මඟින් ලබාදී ඇත. කරුණාකර ඒ සඳහා ඔබගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**මහින්ද ජිනසේන**
**සභාපති**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**පිටපත් :**

1. **ලේකම් - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**
2. **අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව/ මහාභාණ්ඩාගාරය**
3. **අභ්‍යන්තර විගණක - කා.ස.ම.**

**ඇමුණුම - 01**

3/1/1/09 2016.03.08

විගණකාධිපති
රජයේ විගණන දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

**විගණන විමසුම් අංක එල්එස්එච්/අයිඩීබී/2015/02**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ වශයෙන් නාගුරුපිච්චෙයි සිකන්දර් මහතා පත්කර දීමනා ගෙවීම**

ඉහත සඳහන් විමසුම සඳහා පැහැදිලි කිරීම් පහත ඉදිරිපත් කරමි.

නව රජයේ හා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති කර්මාන්ත ප්‍රතිපත්ති අනුව ගරු අමාත්‍යතුමා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිශෝධනය කිරීමට තීරණය කරන ලදී.

ඒ සම්බන්ධව සැලකිල්ලට ගනිමින් ගරු අමාත්‍යතුමා විසින් එන්.සිකන්දර් මහතා විධායක අධ්‍යක්ෂ වශයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය තුළට පත් කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී සිකන්දර් මහතා තානාපතිවරයෙකු ලෙස රුසියාව, ස්වීඩනය හා තවත් රටවල් කිහිපයක 1981 වර්ෂයේ සිට විදේශ සේවයේ විවිධ තනතුරු දරමින් ලබා තිබූ අත්දැකීම් හා පළපුරුද්ද ද විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ( පරිපාලන ) මුස්ලිම්වරුන් සඳහා වූ ලේකම් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් හා ගරු අමාත්‍යතුමාගේ වර්තමානයේ උපදේශක වශයෙන්ද කරනු ලබන සේවය සලකා බලා , කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි 492 වැනි මණ්ඩලීය රැස්වීමේදී විධායක අධ්‍යක්ෂ තනතුරට සිකන්දර් මහතා පත් කරන ලදී.

ගරු අමාත්‍යතුමා විසින් විගණන විමසුම් තත්ත්වයන් මැනවින් අවබෝධ කර ගනිමින්ද, මණ්ඩලයට අවශ්‍ය විශේෂඥ දැනුම තවදුරටත් ලබාදීම අරමුණු කර ගනිමින්ද සිකන්දර් මහතා උපදේශකවරයෙකු වශයෙන් පත් කර ඇති අතර, 2015.12.08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල 496 වැනි රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇත.

සිකන්දර් මහතා විදේශ සේවා දූත මණ්ඩලය තුළින් හා දේශීය වශයෙන් ලබා ඇති පරිණත භාවය, පළපුරුද්ද හා විශේෂඥ දැනුමට සරිලන වැටුපක් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ගෙවා නොමැති බව කරුණාවෙන් සඳහන් කරනු කැමැත්තෙමි. විගණන විමසුමේ දැක්වෙන අනෙකුත් කරුණු දැනටමත් නිරවුල් කර ඇත.

ඉහත සඳහන් පැහැදිලි කිරීම් පිළිබඳව මා පෞද්ගලිකව වගවන බවට තවදුරටත් ප්‍රකාශ කරමි.

**මහින්ද ජිනසේන**
**සභාපති**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**පිටපත් :** 1. ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

1969 දෙසැ 3

# කර්මාන්ත සංවර්ධන

ලංකාවේ කර්මාන්තවලට ධෛර්යදීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන පොදු බලමණ්ඩලයක් පිහිටුවීම සඳහා ද; කර්මාන්ත උපදේශක සභාවක් හා කර්මාන්ත මූලමණ්ඩල පිහිටුවීම සඳහා ද; කර්මාන්ත සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමති විසින් ඉදිරිපත් කරන ලදී.

1969

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

15/C/0C 101

(ආ) ඇමතිවරයා විසින් මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව ලංකාවෙහි කර්මාන්ත වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ය යි කලින් කල නිශ්චය කළ හැකි යම් මුදලක් (නීතිගත කරනු ලැබූ හෝ නීතිගත කරනු නො ලැබූ) වෙන යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩල යක් වෙත

අරමුදලෙන් ගෙවිය යුතු ය.

**කර්මාන්ත සංවර්ධන සෙස් බද්ද.**

12. (1) මේ පනතේ කාර්යයන් සඳහා යම් කර්මාන්තයක් හෝ කර්මාන්ත සම්බන්ධයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කර ගැනීමෙන් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයක හා යම් ප්‍රමාණයක වූ කර්මාන්ත සංවර්ධන සෙස් බද්ද යනුවෙන් හැඳින්වෙන සෙස් බද්දක් නියම කිරීම, අය කිරීම සහ ගෙවීම කළ යුතු ය. ඒ සෙස් බ[illegible] මුදල් අරමුදලට බැර කළ යුතු ය.

(2) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ සම්මත කරනු ලබන යම් යෝජනාවක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අවලංගු කිරීම හෝ කලින් කල සංශෝධනය කිරීම කළ හැකි ය.

(3) කර්මාන්ත සංවර්ධන සෙස් බද්ද සාර්ථක ලෙස අය කිරීම හා එකතු කිරීම සඳහා ද එය අරමුදලට ගෙවීම සඳහා ද අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග පැනවිය හැකි ය.

## III වන කොටස

## ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය.

**ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය.**

13. ලංකාවේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින්විය යුතු මණ්ඩලයක් පිහිටුවිය යුතු ය.

**මණ්ඩලය නීතිගත සංස්ථාවක් යුතු බව.**

14. 13 වන වගන්තියෙන් මණ්ඩලයට පැවරුණු නමින් ඒ මණ්ඩලය නීතිගත සංස්ථාවක් විය යුතුවාත් හැර අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් එයට තිබිය යුතු ය. එමෙන් ම ඒ නමින් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධ ව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**මණ්ඩලයේ පරමාර්ථ.**

15. මණ්ඩලයේ පරමාර්ථ—

(අ) ලංකාවෙහි කර්මාන්තවලට ධෛර්‍යදීම, ඒවා වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ ව සහාය දීම;

(ආ) රටෙහි ආර්ථික ක්‍රමයට අයත් පෞද්ගලික හා රජයේ අංශ යන්හි සියලු කර්මාන්ත ව්‍යවසායන්ගේ නිසි සම්බන්ධතාවය හා අන්‍යෝන්‍ය කර්මාන්ත සංවර්ධනය පිළිබඳ ව සහාය වීම;

(ඇ) ලංකාවේ ස්වාභාවික ධන සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ, කර්මාන්ත සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලබන කාර්මික ක්‍රියාමාර්ග හා ක්‍රම දියුණු කිරීමේ, දේශීය කර්මාන්ත සඳහා උචිත කාර්මික විද්‍යාව හා උපකරණ සංවර්ධනය කිරීමේ

සහ අපතේ යන නිෂ්පාදන වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාමාර්ගය හා ක්‍රම සොයා ගැනීමේ පරමාර්ථය ඇති ව කර්මාන්ත පර්යේෂණ වර්ධනය කිරීම;

(ඇ) දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳ 'පොළවල් වලට අපනයනය කිරීම වර්ධනය කිරීම;

(ඉ) කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය හෝ හිතකර ජාත්‍යන්තර වෙළඳ හා ප්‍රාදේශීය සහයෝගතා ක්ෂෙත්‍රයෙහි කටයුතු වලට සහාය වීම;

(ඊ) ලංකාවෙහි යම් කර්මාන්ත ව්‍යවසායක් හෝ කර්මාන්ත ආයතනයක් විසින් හෝ සම්බන්ධයෙන් අවශ්‍ය මූලධනය, ණය, අලෙවි කිරීම්, පාලනමය හා කර්මාන්ත පහසුකම් ඇතුළු ව සෑම විස්තරයකට අයත් සේවාවන් හා පහසුකම් සැලසීම;

(උ) ලංකාවේ කර්මාන්ත වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ කරුණු ගැන උපදෙස් දීම; සහ

(ඌ) මේ වගන්තියේ නිශ්චිත ව සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ඒවාට හිතකර විය හැකි සියලු පියවරවල් ගැනීම

විය යුතු ය.

16. මණ්ඩලයේ පරමාර්ථ සපුරාලීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, මේ පනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් හෝ ඒවා යටතේ මණ්ඩලය වෙත පැවරෙන හෝ නියම කෙරෙන බලතල, කාර්යයන් හා යුතුකම් පාවිච්චි කිරීම, කිරීම හා ඉටු කිරීම කළ හැකි ය. — තම පරමාර්ථ සපුරාලීම සඳහා තම බලතල මණ්ඩලය විසින් පාවිච්චි කළ යුතු බව.

17. (1) මණ්ඩලය සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන්— — මණ්ඩලයේ සංයුතිය.

(අ) සාමාජිකයන් සය දෙනකු ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය;

(ආ) එක් සාමාජිකයකු ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු භාරව සිටින ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය;

(ඇ) එක් සාමාජිකයකු මුදල් ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් පත් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නිලධරයකු විය යුතු ය; තව ද

(ඈ) එක් සාමාජිකයකු මුදල් ඇමතිවරයා විමසීමෙන් පසු ඇමතිවරයා විසින් පත් කරනු ලබන මහා බැංකුවේ නිලධරයකු විය යුතු ය.

(2) ඇමතිවරයා විසින්, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් කෙනකු මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කළ යුතු ය.

18. උත්තර මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසු විය යුතු ය. — නුසුදුසුකම.

ඇමුණුම - 03

උපලේඛනය 01

| විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| අච්චුවේලි කාර්මික ජනපදයේ ආපන ශාලාව සහ තැපැල් කාර්යාලයක් ඉදිකිරීම | 1,332,307 |
| වැසි ජලය බැසයාමේ පද්ධතිය වැඩිදියුණු කිරීම - ප්‍රධාන කාර්යාලය | 352,007 |
| පොළොන්නරුව සංචාරක බංගලාව | 162,600 |
| පො.සේ.ම. මාතර | 215,000 |
| කාර්යාලය අලුත්වැඩියා කිරීම - හම්බන්තොට | 292,500 |
| කාර්යාලය අලුත්වැඩියා කිරීම - හම්බන්තොට | 292,500 |
| කළුදැවල කාර්මික ජනපදය - අභ්‍යන්තර මාර්ග | 1,291,673 |

උපලේඛනය 02

| විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| වැසි ජලය බැස යාමේ ඇල මාර්ග පද්ධතිය - වවුනියාව | 3,129,400 |
| වැසි ජලය බැස යාමේ ඇල මාර්ග පද්ධතිය - වවුනියාව | 2,870,600 |
| වැසි ජලය බැස යාමේ ඇල මාර්ග පද්ධතිය - වවුනියාව | 4,590,000 |
| අලුත්වැඩියා - අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | 486,000 |
| අලුත්වැඩියා - අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය | 486,000 |
| ලක්කම් අලෙවි මධ්‍යස්ථානය පුළුල් කිරීම | 2,095,500 |
| ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | 2,095,500 |
| අභ්‍යන්තර මාර්ග - කාර්මික ජනපදය පල්ලෙකැලේ | 5,311,990 |
| අභ්‍යන්තර මාර්ග - කාර්මික ජනපදය පල්ලෙකැලේ | 5,811,095 |
| අභ්‍යන්තර මාර්ග - කාර්මික ජනපදය පල්ලෙකැලේ | 8,886,317 |

Director / Eng
The above all work completed satisfactory and handed over.
2017/01/19

Civil Engineer
Engineering Division
Industrial Development Board of Ceylon